## අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016

# ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016

## ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**ආර්ථික විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016


## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්ව විද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2016 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 211865 ක් පාසල් අයදුම්කරුවෝ ද 46328 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නො අනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2016 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

**ඉදිරියේ** දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2017 දෙසැම්බර් 01

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ/ සංවර්ධන හා ඇගයීම්) |
| **සම්බන්ධීකරණය** | : | එල්. ජී. එස්. සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩැනී අතපත්තු<br>ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය<br>රුහුණ විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය වසන්ත අතුකෝරල<br>ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | ඩබ්ලිව්. ලයනල් වීරසිංහ<br>ගුරු සේවය<br>කො/විශාඛා විද්‍යාලය<br><br>ඩී.ජී. සුගත්<br>ගුරු සේවය<br>මාර/සාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය<br><br>එම්. ජී. තමරා ටී. කාරියවසම්<br>ගුරු සේවය<br>ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය<br><br>රම්‍යා ගුණසේකර<br>ගුරු සේවය<br>කො/විශාඛා විද්‍යාලය<br><br>එස්. එන්. බී. එම්. එස්. රංජනී<br>ගුරු සේවය<br>කළු/මිරිස්වත්ත ජාතික පාසල<br><br>කේ.එන්. නිශාන්ත<br>ගුරු සේවය<br>ර/ඇඹි/ජනාධිපති විද්‍යාලය |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඕ.එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය සැකසුම** | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරි |

# ඇතුළත පිටු


පිටු අංකය

**I කොටස**

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය (අ) කොටස 7
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය (ආ) කොටස 8

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 19
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 20
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 24
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 25
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 66

**III කොටස**

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 67
3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 70

## I කොටස

# 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම.
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ සාර්ව ආර්ථික විචල්‍යවල හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙළඹවීම.
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම.
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරීම.
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම.
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ ආර්ථික විද්‍යා විෂයය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම.
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ, මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම.
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම.
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම.

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 48613 | 5536 | 54149 |
| දෙමළ | 8325 | 1312 | 9637 |
| ඉංග්‍රීසි | 2068 | 836 | 2904 |
| එකතුව | 59006 | 7684 | 66690 |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 7188 | 12.18 | 588 | 7.65 | 7776 | 11.66 |
| B | 8454 | 14.33 | 806 | 10.49 | 9260 | 13.89 |
| C | 14762 | 25.02 | 1392 | 18.12 | 16154 | 24.22 |
| S | 15705 | 26.62 | 2030 | 26.42 | 17735 | 26.59 |
| F | 12897 | 21.86 | 2868 | 37.32 | 15765 | 23.64 |
| එකතුව | **59006** | **88.48** | **7684** | **11.52** | **66690** | **100.00** |

වගුව 2

## 1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 9221 | 1453 | 15.76 | 1300 | 14.10 | 2237 | 24.26 | 2400 | 26.03 | 7390 | 80.14 | 1831 | 19.86 |
| 2. ගම්පහ | 5364 | 617 | 11.50 | 642 | 11.97 | 1292 | 24.09 | 1428 | 26.62 | 3979 | 74.18 | 1385 | 25.82 |
| 3. කළුතර | 2718 | 282 | 10.38 | 397 | 14.61 | 690 | 25.39 | 685 | 25.20 | 2054 | 75.57 | 664 | 24.43 |
| 4. මහනුවර | 3348 | 353 | 10.54 | 404 | 12.07 | 791 | 23.63 | 874 | 26.11 | 2422 | 72.34 | 926 | 27.66 |
| 5. මාතලේ | 769 | 75 | 9.75 | 88 | 11.44 | 205 | 26.66 | 223 | 29.00 | 591 | 76.85 | 178 | 23.15 |
| 6. නුවරඑළිය | 1214 | 137 | 11.29 | 175 | 14.42 | 304 | 25.04 | 310 | 25.54 | 926 | 76.28 | 288 | 23.72 |
| 7. ගාල්ල | 2392 | 312 | 13.04 | 315 | 13.17 | 548 | 22.91 | 623 | 26.05 | 1798 | 75.17 | 594 | 24.83 |
| 8. මාතර | 1428 | 138 | 9.66 | 153 | 10.71 | 391 | 27.38 | 387 | 27.10 | 1069 | 74.86 | 359 | 25.14 |
| 9. හම්බන්තොට | 1017 | 72 | 7.08 | 103 | 10.13 | 214 | 21.04 | 308 | 30.29 | 697 | 68.53 | 320 | 31.47 |
| 10. යාපනය | 927 | 126 | 13.59 | 133 | 14.35 | 257 | 27.72 | 257 | 27.72 | 773 | 83.39 | 154 | 16.61 |
| 11. කිලිනොච්චි | 169 | 16 | 9.47 | 21 | 12.43 | 48 | 28.40 | 52 | 30.77 | 137 | 81.07 | 32 | 18.93 |
| 12. මන්නාරම | 200 | 14 | 7.00 | 24 | 12.00 | 66 | 33.00 | 55 | 27.50 | 159 | 79.50 | 41 | 20.50 |
| 13. වව්නියාව | 353 | 41 | 11.61 | 63 | 17.85 | 110 | 31.16 | 84 | 23.80 | 298 | 84.42 | 55 | 15.58 |
| 14. මුලතිව් | 147 | 17 | 11.56 | 23 | 15.65 | 34 | 23.13 | 46 | 31.29 | 120 | 81.63 | 27 | 18.37 |
| 15. මඩකලපුව | 676 | 91 | 13.46 | 125 | 18.49 | 169 | 25.00 | 173 | 25.59 | 558 | 82.54 | 118 | 17.46 |
| 16. අම්පාර | 984 | 85 | 8.64 | 125 | 12.70 | 238 | 24.19 | 305 | 31.00 | 753 | 76.52 | 231 | 23.48 |
| 17. ත්‍රිකුණාමලය | 663 | 78 | 11.76 | 95 | 14.33 | 135 | 20.36 | 198 | 29.86 | 506 | 76.32 | 157 | 23.68 |
| 18. කුරුණෑගල | 2747 | 272 | 9.90 | 398 | 14.49 | 675 | 24.57 | 721 | 26.25 | 2066 | 75.21 | 681 | 24.79 |
| 19. පුත්තලම | 1445 | 155 | 10.73 | 184 | 12.73 | 352 | 24.36 | 417 | 28.86 | 1108 | 76.68 | 337 | 23.32 |
| 20. අනුරාධපුරය | 1448 | 133 | 9.19 | 159 | 10.98 | 374 | 25.83 | 404 | 27.90 | 1070 | 73.90 | 378 | 26.10 |
| 21. පොළොන්නරුව | 651 | 56 | 8.60 | 80 | 12.29 | 158 | 24.27 | 175 | 26.88 | 469 | 72.04 | 182 | 27.96 |
| 22. බදුල්ල | 1588 | 96 | 6.05 | 141 | 8.88 | 375 | 23.61 | 519 | 32.68 | 1131 | 71.22 | 457 | 28.78 |
| 23. මොණරාගල | 736 | 88 | 11.96 | 98 | 13.32 | 187 | 25.41 | 192 | 26.09 | 565 | 76.77 | 171 | 23.23 |
| 24. රත්නපුරය | 1970 | 245 | 12.44 | 274 | 13.91 | 518 | 26.29 | 489 | 24.82 | 1526 | 77.46 | 444 | 22.54 |
| 25. කෑගල්ල | 1469 | 126 | 8.58 | 163 | 11.10 | 327 | 22.26 | 442 | 30.09 | 1058 | 72.02 | 411 | 27.98 |
| **සමස්ත දිවයින** | **43644** | **5078** | **11.64** | **5683** | **13.02** | **10695** | **24.51** | **11767** | **26.96** | **33223** | **76.12** | **10421** | **23.88** |

වගුව **3**

### 1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 160 | 0.24 | 66690 | 100.00 |
| 81 - 90 | 2482 | 3.72 | 66530 | 99.76 |
| 71 - 80 | 7274 | 10.91 | 64048 | 96.04 |
| 61 - 70 | 10122 | 15.18 | 56774 | 85.13 |
| 51 - 60 | 11738 | 17.60 | 46652 | 69.95 |
| 41 - 50 | 12032 | 18.04 | 34914 | 52.35 |
| 31 - 40 | 10654 | 15.98 | 22882 | 34.31 |
| 21 - 30 | 7831 | 11.74 | 12228 | 18.34 |
| 11 - 20 | 4111 | 6.16 | 4397 | 6.59 |
| 01 - 10 | 283 | 0.42 | 286 | 0.43 |
| 00 - 00 | 3 | 0.00 | 3 | 0.00 |

වගුව 5

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 10654 ක් වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 15.98% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 22882 කි. එම සංඛ්‍යාව මුළු අපේක්ෂකයින්ගෙන් 34.31% කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 1 වන ප්‍රශ්නයට ය. එම ප්‍රශ්නයට ඔවුන් දැක්වූ පහසුතාව 85% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩු ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 17 වන ප්‍රශ්නයට වන අතර එම ප්‍රශ්නය සඳහා පහසුතාව 16% කි.


### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයට අනුව 'අ' කොටසේ 2 වන ප්‍රශ්නය, අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනකු තෝරා ගෙන ඇත. එම ප්‍රතිශතය 97.89% කි. 'ආ' කොටසේ 7 වන ප්‍රශ්නය, වැඩි ම පිරිසක් තෝරා ගෙන ඇති අතර, එම ප්‍රතිශතය 89.49% කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙහි I වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20 කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 14%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 18%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරය අනුව 01 වන ප්‍රශ්නයෙහි (1) කොටසෙහි පහසුතාව 79.% ක් වන අතර, 5 වන ප්‍රශ්නයෙහි III කොටසෙහි (ඊ) අනුකොටසෙහි පහසුතාව 42% කි.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016**

**21 - ආර්ථික විද්‍යාව - II පත්‍රය ('ආ' කොටස)**

**එක් එක් ප්‍රශ්නයෙහි {ාටස්වල/අනු{ාටස්වල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. ආර්ථික විද්‍යාවේ 'හිඟකම' සංකල්පයෙන් අදහස් කරනුයේ,
   (1) සමාජය තමන් සතු සියලු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන තත්ත්වයකි.
   (2) පවත්නා සම්පත්වලින් මිනිසුන්ගේ වුවමනා කිසිසේත් සපුරාගත නොහැකි තත්ත්වයකි.
   (3) සෑම සමාජයක ම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් ලෙස ජීවත් වන තත්ත්වයකි.
   (4) සමාජයීය වශයෙන් හිතකර භාණ්ඩ හා සේවා නිපදවනවා වෙනුවට, නොවැදගත් භාණ්ඩ හා සේවා වුවමනාවටත් වඩා නිපදවන තත්ත්වයකි.
   (5) නිෂ්පාදනය කාර්යක්ෂම වුවත් බෙදාහැරීම අකාර්යක්ෂමව පවතින තත්ත්වයකි. (……)

2. නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර, මූලයට අවතල හැඩයකින් යුතුව අඳිනු ලබන්නේ,
   (1) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය පහළ බසින බව පිළිබිඹු කිරීමට ය.
   (2) ආර්ථිකය සතු සම්පත්වල හිඟකම පිළිබිඹු කිරීමට ය.
   (3) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය ස්ථාවරව පවතින බව පිළිබිඹු කිරීමට ය.
   (4) ආර්ථිකයක සම්පත් බෙදීයාමේ අසාධාරණත්වය පිළිබිඹු කිරීමට ය.
   (5) කවර හෝ භාණ්ඩයක් වැඩිපුර නිපදවන විට, එහි ආවස්ථික පිරිවැය ඉහළ නගින බව පිළිබිඹු කිරීමට ය. (……)

3. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක පහත සඳහන් කවර කරුණක් **සාවද්‍ය** වේ ද?
   (1) මිල, ආර්ථිකයේ තරගකාරී නිෂ්පාදන ක්ෂේත්‍ර අතර සම්පත් සමසේ බෙදා වෙන් කරයි.
   (2) මිල, භාණ්ඩ හා සේවාවන්හි සාපේක්ෂ හිඟකම් සහ ඒවායේ නිෂ්පාදන පිරිවැය පෙන්නුම් කරයි.
   (3) සාපේක්ෂ මිල වෙනස්කම්, නිෂ්පාදන ආයතනවල ලාභ නිර්ණය කරන සාධකයක් වන අතර, එබැවින් එය නිෂ්පාදනය ධෛර්යමත් කිරීමට හෝ අධෛර්යමත් කිරීමට හෝ බලපායි.
   (4) මිල, භාණ්ඩ හා සේවා සඳහා පාරිභෝගිකයන්ගේ ගෙවීමට ඇති කැමැත්ත පිළිබඳ මිනුමක් වේ.
   (5) මිල, භාණ්ඩයක් ලබා ගැනීම සඳහා කොපමණ කැප කළ යුතු ද යන්න පිළිබඳ සංඥාවක් පාරිභෝගිකයන්ට ලබා දෙයි. (……)

4. බාහිරතා නොමැති තරගකාරී වෙළෙඳපොළක සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව හටගනු ඇත්තේ සියලු වෙළෙඳපොළවල මිල,
   (1) මුළු පිරිවැයට සමාන වන විට දී ය.
   (2) ආන්තික අයභාරයට සමාන වන විට දී ය.
   (3) ආන්තික පිරිවැයට සමාන වන විට දී ය.
   (4) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන විට දී ය.
   (5) ආන්තික නිෂ්පාදිතයේ වටිනාකමට සමාන වන විට දී ය. (……)

5. 'මානව ප්‍රාග්ධනය' යන්නෙන් අදහස් කරනුයේ,
   (1) ප්‍රාග්ධන උපකරණ නිපදවීමට යොදා ගැනෙන ශ්‍රම සම්පතයි.
   (2) ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍රයි.
   (3) ශ්‍රම හමුදාව සතු කුසලතා සහ දැනුම් සම්භාරයයි.
   (4) ව්‍යවසායකත්වය සහ අවදානම් දැරීමේ හැකියාවයි.
   (5) සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි සේවා නියුක්ත ශ්‍රම හමුදාවයි. (……)

6. විභව නිමැවුම යනු,
   (1) පසුගිය දසවසර තුළ ආර්ථිකයක් සැබවින් ම අත්කර ගත් උපරිම දළ දේශීය නිෂ්පාදිතය වේ.
   (2) සමස්ත ශ්‍රම හමුදාව ම වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදන අංශයේ සේවා නියුක්ත වූ කාල පරිච්ඡේදවල දී අත්කර ගත් නිමැවුම වේ.
   (3) සියලු සම්පත් වඩා කාර්යක්ෂමව යොදා ගැනීමෙන් ආර්ථිකයට කිසිවිටක අත්කර ගත නොහැකි අරමුණකි.
   (4) ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ.
   (5) ආර්ථිකයේ සම්පත් පූර්ණ සේවා නියුක්තව, උපරිම මට්ටමින් උපයෝජනය කරන විට නිපදවිය හැකි දළ දේශීය නිෂ්පාදිතය වේ. (……)

7. X භාණ්ඩය බාල භාණ්ඩයක් බවත්, තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන බවත් සලකන්න. X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, ගැනුම්කරුවන්ගේ ආදායමේ පහළ බැසීමක් නිසා වෙළෙඳපොළ ඉල්ලුම, සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?

| | ඉල්ලුම | මිල | ප්‍රමාණය |
|---|---|---|---|
| (1) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | වැඩි වේ. | අඩු වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| (5) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |

(……)

**8.** කිසියම් අත්‍යවශ්‍ය භාණ්ඩයක් මත විශේෂිත බද්දක් (ඒකක බද්දක්) පනවනු ලබන අතර, එම භාණ්ඩයේ වෙළෙඳපොළ ඉල්ලුම් ලේඛනයත්, බද්දට පෙර හා බද්දට පසු සැපයුම් ලේඛනයත් පහත දැක්වෙන වගුව පෙන්නුම් කරයි.

| මිල (රු.) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | බද්දට පෙර සැපයුම් ප්‍රමාණය | බද්දට පසු සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|
| 12 | 50 | 20 | 0 |
| 13 | 50 | 30 | 10 |
| 14 | 50 | 40 | 20 |
| 15 | 50 | 50 | 30 |
| 16 | 50 | 60 | 40 |

භාණ්ඩ ඒකකයක් සඳහා අය කරනු ලැබූ බද්දේ ප්‍රමාණය කොපමණ ද?

(1) රුපි. 2 (2) රුපි. 3 (3) රුපි. 4 (4) රුපි. 5 (5) රුපි. 6 (……)

**9.** බෝල්පොයින්ට් පෑන් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව –3.0කි. බෝල්පොයින්ට් පෑනක මිල රුපි. 25ක් වන විට පෑන් 300ක් ඉල්ලුම් කරනු ලැබේ. පෑනක මිල රුපි. 20 කට අඩුවුවහොත්, කොපමණ ප්‍රමාණයක් ඉල්ලුම් කරනු ලැබේ ද?

(1) 900 (2) 630 (3) 560 (4) 480 (5) 180 (……)

**10.** කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රය වමට විතැන් වනුයේ,

(1) තාක්ෂණය වැඩි දියුණු වන විට දී ය.
(2) යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.
(3) යෙදවුම් මිල ගණන් ඉහළ නගින විට දී ය.
(4) තාක්ෂණය වැඩි දියුණු වන විට හා යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.
(5) කර්මාන්තය තුළට සැපයුම්කරුවන් වැඩි වැඩියෙන් ප්‍රවේශ වන විට දී ය. (……)


**11.** X භාණ්ඩය සඳහා ඇති සැපයුම් වක්‍රය පහත දැක්වෙන සමීකරණයෙන් පෙන්නුම් කෙරේ.

$$Q_X = 6\,P_X$$

මෙහි $Q_X$ යනු X භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වන අතර $P_X$ යනු X භාණ්ඩයේ මිල ය. X භාණ්ඩයේ සැපයුමේ මිල නම්‍යතාව පිළිබඳව මෙම සමීකරණයෙන් නිගමනය කළ හැක්කේ කුමක් ද?

(1) සැපයුමේ මිල නම්‍යතාව 6.0 කි. (2) සැපයුමේ මිල නම්‍යතාව 1.0 කි.
(3) සැපයුමේ මිල නම්‍යතාව 0.1 කි. (4) සැපයුමේ මිල නම්‍යතාව 0.0 කි.
(5) සැපයුමේ මිල නම්‍යතාව 0.6 කි. (……)

**12.** X භාණ්ඩය මත පනවා තිබූ විශේෂිත බද්දක් ඉවත් කළ පසුව, සැපයුම $S_2$ සිට $S_1$ දක්වා වැඩි වන බව පහත සඳහන් රූප සටහන පෙන්වයි. $S_1$ සැපයුම් වක්‍රය, බද්ද පැනවීමට පෙර තිබූ සැපයුම් වක්‍රය සේම බද්ද ඉවත් කළ පසු දක්නට ඇති සැපයුම් වක්‍රය ද වේ.




බද්ද ඉවත් කිරීම, බදු අයභාරය සහ පාරිභෝගික වියදම මත කෙබඳු බලපෑමක් ඇති කරනු ලැබේ ද?


| | බදු අයභාරය | පාරිභෝගික වියදම |
|---|---|---|
| (1) | 1 440 කින් අඩු වේ. | 2 000 කින් වැඩි වේ. |
| (2) | 480 කින් අඩු වේ. | 560 කින් අඩු වේ. |
| (3) | 480 කින් අඩු වේ. | 560 කින් වැඩි වේ. |
| (4) | 960 කින් වැඩි වේ. | 1 440 කින් වැඩි වේ. |
| (5) | 1 440 කින් අඩු වේ. | 960 කින් අඩු වේ. |

(……)

**13.** ආදේශන ප්‍රතිවිපාකය යනු පහත සඳහන් කරුණක ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස්වීම ය. එනම්,

(1) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.
(2) මූර්ත ආදායම නොවෙනස්ව තිබිය දී නිරපේක්ෂ මිල වෙනස් වීමකි.
(3) මුදල් ආදායම නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.
(4) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මූර්ත ආදායම වෙනස් වීමකි.
(5) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මුදල් ආදායම වෙනස් වීමකි. (......)


**14.** කිසියම් රටක් විසින් ආනයනය කරනු ලබන පරිභෝජන භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය මෙම රූපසටහන පෙන්නුම් කරයි. එම භාණ්ඩය මත ඒකකයකට $P_1 - P_2$ ප්‍රමාණයේ ආනයන බද්දක් රජය විසින් පනවනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් හටගන්නා පාරිභෝගික අතිරික්තයේ අඩු වීම හා ආණ්ඩුවේ අයභාරයේ වැඩි වීම මැනෙනුයේ රූප සටහනේ කවර ප්‍රදේශයකින් ද?




| | පාරිභෝගික අතිරික්තය අඩු වීම | ආණ්ඩුවේ අයභාරය වැඩි වීම |
|---|---|---|
| (1) | A + B | B + C |
| (2) | A + B + C | B |
| (3) | A + B | B + C + D + E |
| (4) | D | B + D |
| (5) | B + C | B |

(......)

**15.** කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




මෙම භාණ්ඩයේ සැපයුම පූර්ණ නම්‍ය බවත් ආරම්භයේ දී එහි මිල $P_1$ වශයෙන් පැවති බවත් සලකන්න. එම භාණ්ඩය මත බද්දක් පැනවීම නිසා, මිල $P_1$ සිට $P_2$ දක්වා වැඩි වූයේ නම්, බද්ද නිසා හට ගන්නා අධි බදු බර කොපමණ වේ ද?

(1) $P_3 A P_4$ ප්‍රදේශය
(2) A D B ප්‍රදේශය
(3) $P_1 P_4$ C ප්‍රදේශය
(4) $P_1$ C B $P_2$ ප්‍රදේශය
(5) B F C ප්‍රදේශය (......)

**16.** ආයතනයක් සියලු ම යෙදවුම් 50% කින් වැඩි කරන විට නිමැවුම 40% කින් ඉහළ නගී. මෙම තත්ත්වය පෙන්නුම් කරනුයේ,

(1) හීනවන ඵල නීතියයි.
(2) අඩුවන පරිමාණානුකූල ඵල නීතියයි.
(3) විචල්‍ය සාධකානුපාත නීතියයි.
(4) වැඩිවන පරිමාණානුකූල ඵල නීතියයි.
(5) ආන්තික ඵල නීතියයි. (......)

**17.** අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා පහළ මිල පරාසයේ දී, පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක සැපයුම් වක්‍රය,

(1) පවත්නා වෙළෙඳපොළ මිලේ දී තිරස් අක්ෂයට සමාන්තර රේඛාවක් වේ.
(2) ශූන්‍ය නිමැවුමේ දී සිරස් රේඛාවක් වේ.
(3) ආයතනයේ ආන්තික පිරිවැය වක්‍රයට ම සමාන වේ.
(4) ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ම සමාන වේ.
(5) ධන නිමැවුමක් සහිත ව ඉහළට බෑවුම් වේ. (......)

**18.** තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක ලාභ උපරිමනය කෙරෙන නිමැවුම් මට්ටම නිර්ණය වන ලක්ෂ්‍යයේ දී
(1) ආන්තික පිරිවැය පහළ බසිමින් පවතී.
(2) ආන්තික පිරිවැය ඉහළ නගිමින් පවතී.
(3) ආන්තික අයභාරය ඉහළ නගිමින් පවතී.
(4) ආන්තික පිරිවැය අවම මට්ටමේ පවතී.
(5) ආන්තික පිරිවැය ආන්තික අයභාරයට වඩා පහළින් පවතී. (……)

**19.** නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී කිසිවක් නිෂ්පාදනය නොකරන්නේ නම්, පහත සඳහන් පිරිවැය අතුරෙන් ශූන්‍ය අගයක් ගනුයේ කවර පිරිවැයක් ද?
(1) ආවස්ථික පිරිවැය (2) මුළු විචල්‍ය පිරිවැය
(3) මුළු ස්ථාවර පිරිවැය (4) සාමාන්‍ය මුළු පිරිවැය
(5) මුළු පිරිවැය (……)

**20.** ආදායමේ චක්‍රීය ප්‍රවාහ ආකෘතිය තුළ ඇතුළත් 'මූර්ත' ප්‍රවාහ අතුරෙන් එකක් වන්නේ,
(1) ආයතන වෙතින් කුටුම්බ කරා ඇදෙන භාණ්ඩ හා සේවා ප්‍රවාහයයි.
(2) ආයතන වෙතින් කුටුම්බ කරා ඇදෙන සාධක සේවා ප්‍රවාහයයි.
(3) කුටුම්බ වෙතින් ආයතන කරා ඇදෙන භාණ්ඩ හා සේවා ප්‍රවාහයයි.
(4) ආයතන වෙතින් කුටුම්බ කරා ගලා යන මුදල් ගෙවීම් ප්‍රවාහයයි.
(5) කුටුම්බ වෙතින් ආයතන කරා ගලා යන මුදල් ගෙවීම් ප්‍රවාහයයි. (……)

**21.** පසුගිය වර්ෂයේ දී කිසියම් රටක පොදු මිල මට්ටම ඉහළ ගිය නමුදු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය නොවෙනස් ව තිබුණි යැයි සලකන්න. මෙම තොරතුරුවලට අනුව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

| | නාමික දළ දේශීය නිෂ්පාදිතය | මූර්ත දළ දේශීය නිෂ්පාදිතය |
|---|---|---|
| (1) | ඉහළ ගියේ ය. | ඉහළ ගියේ ය. |
| (2) | නොවෙනස්ව තිබිණි. | නොවෙනස්ව තිබිණි. |
| (3) | පහළ වැටුණි. | පහළ වැටුණි. |
| (4) | ඉහළ ගියේ ය. | නොවෙනස්ව තිබිණි. |
| (5) | පහළ වැටුණි. | ඉහළ ගියේ ය. |

(……)


**22.** පහත සඳහන් ඳැ අතුරෙන්, පෞද්ගලික ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කර ගන්නා නමුදු ජාතික ආදායම ගණනය කිරීමේ දී බැහැර කෙරෙන්නේ කවරක් ද?
(1) සමාගමික ලාභාංශ (2) සංක්‍රාම ගෙවීම්
(3) සමාජ ආරක්ෂණ දායක මුදල් (4) සමාගමික නොබෙදූ ලාභ
(5) ශුද්ධ පොලිය (……)

**23.** සරල ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 250 + 0.75\,Y$ බවත්, ආයෝජනය $I = 450$ බවත් උපකල්පනය කරන්න. මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම
(1) 1 800 කි. (2) 2 800 කි. (3) 3 600 කි. (4) 7 200 කි. (5) 9 000 කි. (……)

**24.** ආයෝජන ගුණකයේ වටිනාකම වැඩි වන්නේ පහත සඳහන් කවර කරුණක වැඩිවීමක් නිසා ද?
(1) මුදල් සැපයුම (2) සමතුලිත නිමැවුම
(3) පෞද්ගලික ආදායම් බදු අනුපාතිකය (4) ආන්තික පරිභෝජන නැඹියාව
(5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (……)

**25.** ආර්ථිකයේ චක්‍රීය ආදායම් ප්‍රවාහයට කරනු ලබන විදීමක් (injection) නියෝජනය කරනුයේ පහත දැක්වෙන කවරක් ද?
(1) වෙළෙඳ ශේෂයේ හිඟයක් (2) ආණ්ඩුවේ අයවැය ලේඛනයේ හිඟයක්
(3) ශුද්ධ බදු ඉහළ යාමක් (4) පෞද්ගලික සමාගම්වල රඳවාගනු ලැබූ ලාභ
(5) කුටුම්බ ඉතුරුම් (……)

**26.** කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පහත දැක්වෙන රූප සටහන පෙන්නුම් කරයි.




මෙම ආර්ථිකයේ ජාතික ආදායම් මට්ටම $Y_3$ සහ සමාහාර වියදම් ශ්‍රිතය $AE_1$ වේ නම්,

(1) ආර්ථිකය සමතුලිත වේ.
(2) අනපේක්ෂිත තොග සමුච්චනයක් සහ ජාතික ආදායම ඉහළ යාමක් සිදු වේ.
(3) අනපේක්ෂිත තොග සමුච්චනයක් සහ ජාතික ආදායම පහළ වැටීමක් සිදු වේ.
(4) අනපේක්ෂිත තොග අඩු වීමක් සහ ජාතික ආදායම ඉහළ යාමක් සිදු වේ.
(5) අනපේක්ෂිත තොග අඩුවීමක් සහ ජාතික ආදායම පහළ වැටීමක් සිදු වේ. (……)

**27.** මුදල් ප්‍රමාණවාදයට අනුව නාමික මුදල් සැපයුමෙහි 10% ක වැඩි වීමක් නිසා,

(1) මූර්ත මුදල් සැපයුම 10% කින් ඉහළ යනු ඇත.
(2) මූර්ත නිමැවුම 10% කින් ඉහළ යනු ඇත.
(3) පොලී අනුපාතිකය 10% කින් පහළ වැටෙනු ඇත.
(4) පොදු මිල මට්ටම 10% කින් ඉහළ යනු ඇත.
(5) එයට හිලව් වශයෙන් මුදලේ සංසරණ ප්‍රවේගය පහළ වැටෙනු ඇත. (……)

**28.** රටක ජාතික ආදායම පූර්ණ සේවා නියුක්ති මට්ටමේ ඇතැයි උපකල්පනය කරන්නේ නම්, උද්ධමනයක් ඇති වීමට වඩාත් හේතු වන්නේ පහත සඳහන් කවර තත්ත්වයක් ද?

(1) පොලී අනුපාතිකයේ පහළ යාමක්
(2) ශ්‍රම ඵලදායීතාවයේ ඉහළ යාමක්
(3) විනිමය අනුපාතිකයේ අගය ඉහළ යාමක්
(4) ආන්තික ආයාත නැම්යාවේ ඉහළ යාමක්
(5) පෞද්ගලික ආදායම් බදු අනුපාතිකයේ ඉහළ යාමක් (……)

**29.** වාණිජ බැංකුවලට මුදල් මැවිය හැක්කේ,

(1) සංචිත සුරැකුම්පත්වලට මාරු කිරීමෙනි.
(2) මහ බැංකුවෙන් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙනි.
(3) අතැති මුදල් මහ බැංකුව වෙත යැවීමෙනි.
(4) 100% ක සංචිත අවශ්‍යතාවක් පවත්වා ගැනීමෙනි.
(5) අධි සංචිත ගනුදෙනුකරුවන්ට ණය වශයෙන් ලබා දීමෙනි. (……)

**30.** එක්තරා පුද්ගලයකු තම වාණිජ බැංකු තැන්පතු ගිණුමෙන් රුපි. 10 000ක් ආපසු ගනු ලැබේ යැයි සලකන්න. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය 20% ක් වේ නම් සහ අනෙකුත් කරුණු කිසිවක් නොවෙනස්ව පවතී නම් මෙම ගනුදෙනුව නිසා සෘජුව ම,

(1) මුදල් සැපයුම රුපි. 10 000කින් අඩු වේ. (2) බැංකු තැන්පතු රුපි. 10 000කින් අඩු වේ.
(3) මුදල් සැපයුම රුපි. 50 000කින් අඩු වේ. (4) බැංකු තැන්පතු රුපි. 50 000කින් අඩු වේ.
(5) බැංකු තැන්පතු රුපි. 8 000කින් අඩු වේ. (……)

**31.** ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු තම ව්‍යවස්ථාපිත සංචිත තබාගනුයේ,

(1) අතැති මුදල් සහ මහ බැංකු තැන්පතු වශයෙනි.
(2) අතැති මුදල් සහ භාණ්ඩාගාර බිල්පත් වශයෙනි.
(3) බැංකුවේ සේප්පුවල ඇති රත්‍රං සහ විදේශ ව්‍යවහාර මුදල් වශයෙනි.
(4) ක්ෂණික ව ලබා ගත හැකි වෙනත් වාණිජ බැංකුවල තැන්පතු වශයෙනි.
(5) මහ බැංකුවේ පවත්වා ගනු ලබන තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් වශයෙනි. (……)

**32.** මහ බැංකුව විසින් වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගන්නේ නම්, වාණිජ බැංකු සංචිතවලට සහ මුදල් සැපයුමට කුමක් සිදු වේ ද?

| | බැංකු සංචිත | මුදල් සැපයුම |
|---|---|---|
| (1) | වැඩි වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | අඩු වේ. |
| (4) | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | වෙනස් නොවේ. |

(……)

**33.** පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති සහ පරිභෝජනයෙන් බැහැර කරලීමේ හැකියාවක් නොමැති භාණ්ඩයක්,
(1) ශුද්ධ පෞද්ගලික භාණ්ඩයක් විය නොහැකි ය.
(2) ශුද්ධ පොදු භාණ්ඩයක් විය නොහැකි ය.
(3) බාල භාණ්ඩයක් විය නොහැකි ය.
(4) අර්ධ පොදු භාණ්ඩයක් විය නොහැකි ය.
(5) ගෝලීය පොදු භාණ්ඩයක් විය නොහැකි ය. (……)

**34.** ප්‍රතික්‍රමික ආදායම් බද්දක් ක්‍රියාත්මක වන විට දී දිළින්දෝ,
(1) තම ආදායමින් ධනවත් අයට වඩා අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(2) ධනවත් අයට වඩා වැඩි රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) තම ආදායම් මට්ටම සමග සමානුපාතික ව වෙනස් වන බද්දක් ගෙවති.
(4) ධනවත් අයට වඩා අඩු රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(5) තම ආදායමින් ධනවත් අයට වඩා වැඩි ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති. (……)

**35.** වැඩිපුර තවත් එක් පුද්ගලයකුට ශුද්ධ පොදු භාණ්ඩයක් භාවිත කිරීමට ඉඩ සලසා දීමේ ආන්තික සමාජ පිරිවැය,
(1) සෘණ වේ. (2) ශුන්‍ය වේ. (3) ධන වේ.
(4) අපරිමිත වේ. (5) භාවිත කරන්නන් සංඛ්‍යාව වැඩි වෙත්ම ඉහළ නගී. (……)

**36.** නිදහස් වෙළෙඳපොළක් තුළ නිෂ්පාදනය කෙරෙන එක්තරා භාණ්ඩයක සමතුලිත නිමැවුම් මට්ටමේ දී එම භාණ්ඩයේ ආන්තික පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත්, ආන්තික පෞද්ගලික හා බාහිර පිරිවැයත් වගුවෙහි දැක්වේ.

| අයිතමය | රුපි. මිලියන | අයිතමය | රුපි. මිලියන |
|---|---|---|---|
| ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ | 36 | ආන්තික පෞද්ගලික පිරිවැය | 24 |
| ආන්තික බාහිර ප්‍රතිලාභ | 18 | ආන්තික බාහිර පිරිවැය | 0 |

මෙම වෙළෙඳපොළට රජය මැදිහත් වීමෙන් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ දැමිය හැකි ය. මක් නිසාද යත් එම භාණ්ඩය,
(1) පොදු භාණ්ඩයක් වන බැවිනි. (2) ශුභ සාධන භාණ්ඩයක් වන බැවිනි.
(3) අවගුණ භාණ්ඩයක් වන බැවිනි. (4) ගෝලීය පොදු භාණ්ඩයක් වන බැවිනි.
(5) බාල භාණ්ඩයක් වන බැවිනි. (……)

**37.** අයවැය හිඟය මූල්‍යනයට යොදා ගනු ලබන පහත සඳහන් ක්‍රම අතුරෙන්, සමාහාර ඉල්ලුම විශාලත ම ප්‍රමාණයකින් වැඩි කළ හැක්කේ කවරක් මගින් ද?
(1) විදේශිකයන්ට පිළිණපත් අලෙවි කිරීම (2) මහ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
(3) වාණිජ බැංකුවලට පිළිණපත් අලෙවි කිරීම (4) ජාතික ඉතිරි කිරීමේ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
(5) සේවක අර්ථසාධක අරමුදලට පිළිණපත් අලෙවි කිරීම (……)

**38.** පහත වගුව සැලකිල්ලට ගන්න.

| වර්ෂය | අපනයන මිල දර්ශකය | වෙළෙඳ අනුපාත දර්ශකය |
|---|---|---|
| 1 | 100 | 100 |
| 2 | 90 | 80 |
| 3 | 80 | 60 |

මෙම දත්තවලට අනුව එළැඹිය හැකි නිගමනයක් වන්නේ අදාළ කාල පරිච්ඡේදයේ දී
(1) අපනයන මිල ඉහළ නගිමින් පැවති බව ය.
(2) ආනයන මිල ඉහළ නගිමින් පැවති බව ය.
(3) වෙළෙඳ අනුපාතයේ වැඩි දියුණු වීමක් සිදු වූ බව ය.
(4) සමාන අපනයන ප්‍රමාණයකින් වැඩි ආනයන ප්‍රමාණයක් ලබා ගත හැකි වූ බව ය.
(5) අපනයන මිල ඉහළ යාම, ආනයන මිල ඉහළ යාමට වඩා විශාල වූ බව ය. (……)

**39.** කිසිදු භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා නිරපේක්ෂ වාසියක් නොමැති රටක් පිළිබඳ ව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) එම රටට සාපේක්ෂ වාසියක් ද හිමි නොවේ.
(2) අඩු ආවස්ථික පිරිවැයක් සහිත භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමෙන් එම රටට සාපේක්ෂ වාසියක් හිමිකර ගත හැක.
(3) එම රට අමුද්‍රව්‍ය අපනයනය කොට අවසාන භාණ්ඩ ආනයනය කරනු ඇත.
(4) පිරිවැය වාසියක් නොමැති නිසා කිසිදු රටක් එම රට සමග වෙළෙඳාම් කිරීමට කැමති නොවනු ඇත.
(5) එම රටේ ව්‍යවහාර මුදල් ඒකකයේ ජාත්‍යන්තර අගය ස්ථාවර ව පවතිනු ඇත. (……)

**40.** විදේශ විනිමය වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුම ව්‍යුත්පන්න වනුයේ,
(1) ශ්‍රී ලංකාවේ අපනයන + ශ්‍රී ලංකාවෙන් පිටතට ගලා යන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(2) ශ්‍රී ලංකාවේ අපනයන + ශ්‍රී ලංකාවට පිටතින් ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(3) ශ්‍රී ලංකාවේ ආනයන + ශ්‍රී ලංකාවෙන් පිටතට ගලා යන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(4) ශ්‍රී ලංකාවේ ආනයන + ශ්‍රී ලංකාවට පිටතින් ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහ මගිනි.
(5) ශ්‍රී ලංකා රජය පවත්වා ගනු ලබන විදේශ සංචිත මගිනි. (……)

**41.** සාපේක්ෂ වාසි පිළිබඳ පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?
(1) සාපේක්ෂ වාසිය තනිකර ම දේශගුණයේ වෙනස්කම් මත රඳා පවතී.
(2) සාපේක්ෂ වාසිය තනිකර ම සාධක සම්භාරයේ වෙනස්කම් මත රඳා පවතී.
(3) සාපේක්ෂ වාසියක් හිමිකර ගැනීමට රටක් නිරපේක්ෂ වාසියක් ද හිමිකර ගෙන සිටිය යුතු ය.
(4) මිල මට්ටම ඉහළ යන රටක්, කිසියම් සාපේක්ෂ වාසියක් අත් කරගෙන තිබුණ ද එය ද අහිමි කරගනු ඇත.
(5) ආණ්ඩුවේ විචක්ෂණශීලී ප්‍රතිපත්ති මගින් ඇතැම් භාණ්ඩ සඳහා සාපේක්ෂ වාසි නිර්මාණය කළ හැකි ය. (……)

**42.** අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී අපගේ දේශීය මුදල් ඒකකයේ බාහිර අගය වැඩිවීමක්
(1) ආනයනය කරනු ලබන භාණ්ඩවල දේශීය මිල පහළ හෙළයි.
(2) ආනයනය කරනු ලබන භාණ්ඩවල දේශීය මිල ඉහළ නංවයි.
(3) ආනයනය කරනු ලබන භාණ්ඩවල විදේශ මිල ඉහළ නංවයි.
(4) ආනයනය කරනු ලබන භාණ්ඩවල විදේශ මිල පහළ හෙළයි.
(5) විදේශීය රටක දී දේශීය මුදල් ඒකකයේ වටිනාකම පහළ හෙළයි. (……)

**43.** ශ්‍රී ලාංකික සමාගමකට තමන් සතුව මැදපෙරදිග ඇති ඇඟලුම් කර්මාන්තශාලාවකින් රුපි. මිලියන 40ක ලාභාංශයක් ලැබෙනවා යැයි සලකන්න. මෙම ගනුදෙනුව ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි වාර්තා කරනුයේ කෙසේ ද?
(1) ප්‍රාග්ධන ගිණුම බැර සහ මූල්‍ය ගිණුම හර
(2) ප්‍රාග්ධන ගිණුම හර සහ මූල්‍ය ගිණුම බැර
(3) ප්‍රාග්ධන ගිණුම බැර සහ ජංගම ගිණුම හර
(4) ජංගම ගිණුම බැර සහ මූල්‍ය ගිණුම හර
(5) ජංගම ගිණුම හර සහ මූල්‍ය ගිණුම බැර (……)

**44.** සමහර කර්මාන්තශාලා ස්වයංක්‍රීයකරණය (automation) වීම නිසා ඇතැම් සාම්ප්‍රදායික සේවකයන් කුසලතා නොගැළපීමකට මුහුණපාන අතර, ඔවුන්ගෙන් සමහරු සේවා වියුක්තිකයන් බවට පත් වෙති. අනික් අතට පරිගණක ක්‍රියාකරුවන්ට ඉහළ ඉල්ලුමක් පවතී. මෙම විරැකියා ස්වරූපය වර්ගකරනුයේ,
(1) චක්‍රීය සේවා වියුක්තිය වශයෙනි.
(2) සාර්ෂික සේවා වියුක්තිය වශයෙනි.
(3) ස්වාභාවික සේවා වියුක්තිය වශයෙනි.
(4) ව්‍යුහමය සේවා වියුක්තිය වශයෙනි.
(5) සැඟවුණු සේවා වියුක්තිය වශයෙනි. (……)

**45.** කිසියම් රටක් සංවර්ධනය අත්කර ගෙන ඇතැයි යන්න වඩාත් හොඳින් පෙන්නුම් කරනුයේ කවර වෙනසක් මගින් ද?
(1) එම රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීමක්
(2) එම රටට හිමි ලෝක අපනයන ප්‍රතිශතයේ වැඩි වීමක්
(3) එම රටේ ගෙවුම් ශේෂය යහපත් වීමක්
(4) එම රටේ මුදල් ඒකකයේ අගය ඉහළ යාමක්
(5) එම රටේ සාමාන්‍ය පුරවැසියාගේ ජීවන තත්ත්වයේ අභිවෘද්ධියක් (……)

**46.** මුළු යැපුම් අනුපාතය යනු,
(1) වැඩිහිටි ජනගහනයට ළමා ජනගහනයේ අනුපාතයයි.
(2) ශ්‍රම හමුදාවේ සේවා නියුක්ත ජනගහනයට සේවා වියුක්ත ජනගහනයේ අනුපාතයයි.
(3) වැඩ කරන වයසේ ජනගහනයෙන් පුද්ගලයන් 100කට වයස අවුරුදු 65ට වැඩි ජනගහනයේ අනුපාතයයි.
(4) වයස අවුරුදු 15ට වැඩි ජනගහනයට වයස අවුරුදු 15ට අඩු ජනගහනයේ අනුපාතයයි.
(5) වයස අවුරුදු 15 - 59 වයසේ ජනගහනයට වයස අවුරුදු 15ට අඩු සහ අවුරුදු 59ට වැඩි ජනගහනයේ අනුපාතයයි. (……)

**47.** 2012/13 සමීක්ෂණ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකයේ ආංශික ව්‍යාප්තිය නිවැරදිව දැක්වෙනුයේ පහත සඳහන් කවර දත්ත පෙළකින් ද?

| | නාගරික අංශය% | ග්‍රාමීය අංශය% | වතු අංශය% |
|---|---|---|---|
| (1) | 4.5 | 10.2 | 16.3 |
| (2) | 2.5 | 6.7 | 12.9 |
| (3) | 4.2 | 7.5 | 10.6 |
| (4) | 2.1 | 7.6 | 10.9 |
| (5) | 3.1 | 7.9 | 10.2 |

(……)

**48.** පහත දැක්වෙන කෙබඳු ආර්ථික ගැටලුවක් ඇගැයීමෙහිලා ලෝරන්ස් වක්‍රය භාවිත කළ හැකි ද?
(1) ආර්ථිකයේ නිෂ්පාදන හා සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව
(2) වෙළෙඳ හවුල්කරුවන්ගේ සාපේක්ෂ වාසි
(3) රටවල් අතර විශේෂීකරණයේ තීව්‍රතාව
(4) ආදායම් බෙදීයාමේ සාධාරණත්වය
(5) සේවා වියුක්තිය හා මිල ස්ථායිතාව අතර සම්බන්ධතාව (……)

**49.** 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සහ සේවා නියුක්තියට, කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය නිවැරදි ව දැක්වෙන්නේ පහත සඳහන් කවරක් මගින් ද?

| | දළ දේශීය නිෂ්පාදිතය% | සේවා නියුක්තිය% |
|---|---|---|
| (1) | 16.0 | 28.5 |
| (2) | 22.8 | 32.3 |
| (3) | 12.8 | 45.0 |
| (4) | 10.5 | 26.5 |
| (5) | 10.1 | 28.5 |

(……)

**50.** පහත සඳහන් රටවල් අතුරෙන් G7 කණ්ඩායමෙහි සාමාජිකයකු **නොවන** රට කුමක් ද?
(1) ජපානය (2) කැනඩාව (3) ප්‍රංශය (4) ඉතාලිය (5) රුසියාව (……)


***

**2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 26. | 3 |
| 02. | 5 | 27. | 4 |
| 03. | 1 | 28. | 1 |
| 04. | 3 | 29. | 5 |
| 05. | 3 | 30. | 2 |
| 06. | 4 | 31. | 1 |
| 07. | 2 | 32. | 2 |
| 08. | 1 | 33. | 1 |
| 09. | 4 | 34. | 5 |
| 10. | 3 | 35. | 2 |
| 11. | 2 | 36. | 2 |
| 12. | 3 | 37. | 2 |
| 13. | 1 | 38. | 2 |
| 14. | 5 | 39. | 2 |
| 15. | 5 | 40. | 2 |
| 16. | 2 | 41. | 5 |
| 17. | 2 | 42. | 1 |
| 18. | 2 | 43. | 4 |
| 19. | 2 | 44. | 4 |
| 20. | 1 | 45. | 5 |
| 21. | 4 | 46. | 5 |
| 22. | 2 | 47. | 4 |
| 23. | 2 | 48. | 4 |
| 24. | 4 | 49. | 5 |
| 25. | 2 | 50. | 5 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් ලකුණු **100** කි.

## 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




ඉහත ප්‍රස්තාරයට අනුව, I ප්‍රශ්න පත්‍රය සැලකීමේදී පහසුතාව අඩු ම ප්‍රශ්නය, 17 වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 16%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 17 වන ප්‍රශ්නයට ය. එසේම පහසුතාව වැඩි ම ප්‍රශ්නය වන්නේ, 1 වන ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 85%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇති ප්‍රශ්නය 1 වන ප්‍රශ්නය වේ.

සමස්ත ප්‍රශ්න පත්‍රය සැලකීමේදී I ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 52.73%ක් වේ.

## 2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | Missing |
| 1 | 2 | 5.40 | **84.57** | 2.50 | 2.20 | 5.27 | 0.06 |
| 2 | 5 | 12.07 | 5.80 | 5.57 | 2.97 | **73.43** | 0.16 |
| 3 | 1 | **43.60** | 19.40 | 13.63 | 11.83 | 11.10 | 0.44 |
| 4 | 3 | 8.70 | 18.93 | **53.30** | 10.77 | 7.60 | 0.70 |
| 5 | 3 | 10.63 | 1.80 | **79.93** | 4.10 | 3.40 | 0.14 |
| 6 | 4 | 4.63 | 3.73 | 4.87 | **46.17** | 39.90 | 0.70 |
| 7 | 2 | 13.10 | **54.10** | 13.47 | 13.80 | 5.03 | 0.50 |
| 8 | 1 | **59.37** | 12.57 | 10.57 | 12.97 | 3.47 | 1.05 |
| 9 | 4 | 5.53 | 5.57 | 8.90 | **64.07** | 15.03 | 0.90 |
| 10 | 3 | 2.33 | **9.07** | **74.47** | 7.07 | 6.77 | 0.29 |
| 11 | 2 | 20.63 | **43.63** | 7.63 | 13.97 | 13.43 | 0.71 |
| 12 | 3 | 9.10 | 31.90 | **47.83** | 5.53 | 5.17 | 0.47 |
| 13 | 1 | **67.83** | 4.60 | 12.30 | 12.00 | 2.97 | 0.30 |
| 14 | 5 | 6.33 | 9.30 | 8.37 | 3.77 | **71.70** | 0.53 |
| 15 | 5 | 4.27 | 11.40 | 4.43 | 27.67 | **51.73** | 0.50 |
| 16 | 2 | 8.77 | **67.67** | 2.70 | 18.03 | 2.63 | 0.20 |
| 17 | 2 | 23.90 | **15.93** | 33.67 | 10.60 | 14.93 | 0.97 |
| 18 | 2 | 5.90 | **30.27** | 9.33 | 22.90 | 30.80 | 0.80 |
| 19 | 2 | 16.17 | **67.20** | 7.07 | 4.10 | 5.17 | 0.29 |
| 20 | 1 | **62.97** | 10.73 | 10.13 | 8.30 | 7.40 | 0.47 |
| 21 | 4 | 6.07 | 14.43 | 9.43 | **62.57** | 6.60 | 0.90 |
| 22 | 2 | 4.93 | **58.60** | 18.13 | 10.63 | 7.37 | 0.34 |
| 23 | 2 | 4.93 | **80.13** | 7.30 | 4.90 | 1.87 | 0.87 |
| 24 | 4 | 19.37 | 15.50 | 5.27 | **50.47** | 8.77 | 0.62 |
| 25 | 2 | 8.67 | **35.13** | 14.83 | 17.60 | 23.37 | 0.40 |
| 26 | 3 | 6.87 | 30.63 | **26.07** | 20.97 | 14.77 | 0.69 |
| 27 | 4 | 12.73 | 11.87 | 10.67 | **52.30** | 11.73 | 0.70 |
| 28 | 1 | **41.83** | 13.63 | 26.30 | 5.70 | 11.80 | 0.74 |
| 29 | 5 | 4.57 | 9.47 | 2.53 | 4.20 | 78.77 | 0.46 |
| 30 | 2 | 6.40 | **36.50** | 12.87 | 15.53 | 28.27 | 0.43 |
| 31 | 1 | **51.93** | 16.10 | 4.53 | 4.97 | 22.13 | 0.34 |
| 32 | 2 | 8.50 | **53.23** | 6.93 | 22.00 | 9.03 | 0.31 |
| 33 | 1 | **42.67** | 23.73 | 17.53 | 8.93 | 6.70 | 0.44 |
| 34 | 5 | 20.20 | 6.00 | 15.00 | 6.93 | **51.40** | 0.47 |
| 35 | 2 | 5.37 | **62.60** | 11.97 | 5.47 | 14.10 | 0.49 |
| 36 | 2 | 16.93 | **60.47** | 10.33 | 7.43 | 4.23 | 0.61 |
| 37 | 2 | 26.63 | **30.73** | 29.77 | 4.80 | 7.27 | 0.80 |
| 38 | 2 | 5.17 | **50.13** | 11.37 | 12.70 | 20.00 | 0.63 |
| 39 | 2 | 7.20 | **68.40** | 9.07 | 11.77 | 3.23 | 0.33 |
| 40 | 2 | 21.97 | **34.87** | 17.63 | 12.73 | 12.10 | 0.70 |
| 41 | 5 | 3.03 | 31.70 | 13.60 | 20.17 | **30.87** | 0.63 |
| 42 | 1 | **26.67** | 22.07 | 14.40 | 23.57 | 12.53 | 0.76 |
| 43 | 4 | 26.00 | 12.67 | 10.07 | **36.83** | 13.67 | 0.76 |
| 44 | 4 | 14.50 | 18.13 | 7.67 | **44.17** | 14.80 | 0.73 |
| 45 | 5 | 15.53 | 3.17 | 8.77 | 4.67 | **67.53** | 0.33 |
| 46 | 5 | 8.17 | 16.00 | 6.37 | 4.50 | **64.47** | 0.49 |
| 47 | 4 | 15.17 | 17.37 | 21.63 | **37.20** | 7.80 | 0.83 |
| 48 | 4 | 7.17 | 4.43 | 8.43 | **72.33** | 7.17 | 0.47 |
| 49 | 5 | 17.90 | 16.87 | 11.43 | 14.40 | **38.37** | 1.03 |
| 50 | 5 | 13.17 | 18.73 | 10.67 | 27.23 | **29.53** | 0.67 |

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු පසුබිමෙහි දක්වා ඇත.

* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ ශිෂ්‍ය ප්‍රතිශතයයි.

## 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා


- සමස්තයක් ලෙස සලකා බලන විට, බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත I ප්‍රශ්න පත්‍රයේ අංක 1, 2, 5, 9, 10, 13, 14, 16, 19, 20, 21, 23, 29, 35, 36, 39, 45, 46, 48 ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් අවම වශයෙන් 60% හෝ 60% ක් ඉක්මවූ ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත.

- අපේක්ෂකයින්ගෙන් 85% ක් වූ වැඩි ම ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 1 ප්‍රශ්නයට ය.

- අපේක්ෂකයින්ගෙන් 16% ක් වූ අඩු ම ප්‍රතිශතයක්, නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 17 ප්‍රශ්නයට ය.


- අංක 17, 18, 25, 26, 30, 37, 40, 41, 42, 43, 47, 49, 50 යන ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ සමස්ත අපේක්ෂකයින්ගෙන් 40% කට අඩු ප්‍රතිශතයකි.

- අංක 17 ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 16% කි. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ පූර්ණ තරගකාරී ආයතනයක, අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙන්, පහළ මිල පරාසයන්හිදී ආයතනයේ සැපයුම් වක්‍රය පිහිටන ස්ථානය පිළිබඳව ය. එම මිල පරාසයන්හි දී ආයතනයේ සැපයුම් වක්‍රය, ශූන්‍ය නිමැවුම් මට්ටම යටතේ සිරස් අක්ෂය මත පිහිටිය යුතු බව අපේක්ෂකයින් ඉතා ඉහළ ප්‍රතිශතයක් දැනුවත්ව නො සිටි බව පෙනී යයි. එබැවින් උක්ත මාතෘකාව පිළිබඳව දැනුම රූප සටහන් ඇසුරින් අපේක්ෂකයින් වෙත ලබා දිය යුතුයි.




මෙය අවම සැපයුම් මිලවේ. P මිලට පහළ මිල ගණන් යටතේ සැපයුම ශූන්‍ය වේ. මේ නිසා ආයතනයේ සැපයුම් වක්‍රය ශූන්‍ය නිමැවුමේ දී සිරස් රේඛාවක් වේ.
(රූප සටහනේ තද පාටින් දැක්වේ.)


- අංක 18 ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 30% කි. තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන ආයතනයක ලාභ උපරිමනය කෙරෙන නිමැවුම් මට්ටම තීරණය වන ලක්ෂ්‍යයේ දී ආන්තික පිරිවැය හා ආන්තික අයභාරය හැසිරෙන ආකාරය ප්‍රශ්නය මගින් විමසුමට ලක්කර ඇත. අපේක්ෂකයින් අතුරින් 30% ක් වැනි අඩු ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීම මගින් අනාවරණය වන්නේ, අදාළ මාතෘකාව පිළිබඳව අපේක්ෂකයින් වැඩි පිරිසකට නිවැරදි දැනුම හා අවබෝධය නොමැති බවයි. තරගකාරී වෙළෙඳපොළක ආයතනයක් ලාභ උපරිමනය කිරීමට අවශ්‍ය කොන්දේසිය ආන්තික පිරිවැය ඉහළ නගින පරාසය තුළ දී (එනම් ආන්තික පිරිවැය වක්‍රය ධන බෑවුමක් පෙන්නුම් කරන විට) ආන්තික පිරිවැය ආන්තික අයභාරයට සමාන වීමයි. අපේක්ෂකයින් වරණ තේරීමේ දී iv, v වරණ කෙරෙහි නැඹුරු වීමෙන් පෙනී යන්නේ එම දැනුම ලබා නො තිබුණ බවයි.



ආන්තික විශ්ලේෂණයේ දී ලාභ උපරිම කරන නිමවුම් මට්ටම MC = MR වේ. ලාභ උපරිම කරන නිමවුම් මට්ටම ප්‍රස්තාර සටහනේ A ලක්ෂ්‍යයේ පෙන්නුම් කරන අතර එම අවස්ථාවේ MC වක්‍රය ඉහළ නගිමින් පවතී.

- 25 වන ප්‍රශ්නයට අපේක්ෂකයින් 35% ක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ චක්‍රීය ආදායම් ප්‍රවාහයට කෙරෙන විදීම් හඳුනා ගැනීම පිළිබඳවයි. අපේක්ෂකයින්ගෙන් 65% ක් අසාර්ථක පිළිතුරු සැපයීමෙන් පෙනී යන්නේ, ආණ්ඩුවේ අයභාරය ඉක්මවා යන වැය ප්‍රමාණය, විදීමක් ලෙස හඳුනා ගැනීමට අපොහොසත් බවයි. ඉතුරුම් ඉක්මවන ආයෝජන, ආනයන ඉක්මවා යන අපනයන, බදු ඉක්මවා යන රජයේ වියදම්, විදීම් ලෙස හඳුනා ගැනීමට අපේක්ෂකයින් තුළ දැනුම සංවර්ධනය කළ යුතුය.

- ප්‍රශ්න අංක 26 මගින් විමසා ඇත්තේ, දී ඇති ප්‍රස්තාර සටහනක් ඇසුරින් සාර්ව ආර්ථික සමතුලිතයක දී තොග සමුච්චනය වීම හා සමතුලිත නිමැවුම වෙනස්වන ආකාරය පිළිබඳවයි. අපේක්ෂකයින්ගෙන් 65% ක් අසාර්ථක පිළිතුරු සපයා ඇති බැවින් සාර්ව ආර්ථික සමතුලිතය සඳහා අවශ්‍ය කොන්දේසි වන Y=E හා W = J පිළිබඳ දැනුම සහ සාර්ව ආර්ථික සමතුලිතයක දී Y>E අවස්ථාවේ දී තොග සමුච්චනයක් ඇති වන බවත්, සමතුලිත නිමැවුම කරා ජාතික ආදායම පහළ යෑමේ ප්‍රවනතාවක් පවතින බවත් Y<E වන විට මෙහි ප්‍රතිවිරුද්ධ තත්වය සිදු වන බවත් තහවුරු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.




$AE_1$ සමාහාර වියදම් ශ්‍රිතය අනුව $Y_3$ ආදායම් මට්ටමේ දී සමස්ත නිමැවුමට වඩා සැලසුම් කළ වියදම අඩුය. එහි දී ආර්ථිකයේ නිෂ්පාදිතයෙන් යම් ප්‍රමාණයක් තොග සමුච්චනයක් සිදු වේ. එවිට නිෂ්පාදකයින් නිමැවුම සංකෝචනය කරන්නට පෙළඹේ. ඒ අනුව නිවැරදි වන්නේ 3 වන වරණය යි.

- 30 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු ලබා දී ඇති අපේක්ෂකයින් ප්‍රතිශතය 37% කි. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ වාණිජ බැංකුවකින් තැන්පත් මුදලක් ආපසු ඉවත් කර ගැනීම නිසා අනෙකුත් කරුණු නො වෙනස්ව තිබිය දී සෘජුව ම මුදල් සැපයුම කෙරෙහි බලපාන්නේ කෙසේ ද යන්නයි. එම ගැටලුවට පිළිතුරු ලබා දීමේ දී 'අනෙකුත් කරුණු නොවෙනස්ව පැවතීම' 'මුදල් සැපයුම කෙරෙහි සෘජු බලපෑම' යන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. අපේක්ෂකයින් නිවැරදි පිළිතුර තේරීමට අපොහොසත් වී ඇත්තේ ඉහත කී කරුණු වෙත අවධානය යොමු නො වීම නිසයි.

- 37 වන ප්‍රශ්නයට අපේක්ෂකයින් 31% ක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. ප්‍රශ්නය මගින් විමසනු ලබන්නේ දී ඇති සංසිද්ධිය මගින් සමාහාර ඉල්ලුම විශාලතම ප්‍රමාණයකින් ඉහළ නැංවීමට දායක වන සිදුවීම කුමක්ද යන්න පිළිබඳව ය. එහිදී අපේක්ෂකයින් විසින් තේරුම් ගත යුත්තේ වෙනත් ආයතනයක් පිළිණ පත් මිල දී ගන්නවාට වඩා මහ බැංකුවට පිළිණ පත් අලෙවි කළ විට මුදල් පදනම කිහිප වාරයකින් ඉහළ ගොස් මුදල් සැපයුම විශාල ලෙස වැඩි වීම මගින් සමාහාර ඉල්ලුම වැඩි වීම ද, සෘජුව ම රාජ්‍ය වියදම් ඉහළ යාම නිසා සමාහාර ඉල්ලුම ගුණක ක්‍රියාවලියක් ඔස්සේ ඉහළ යාම ද සිදුවන බවයි.
රජය මහ බැංකුවට පිළිණපත් අලෙවි කළ විට මුදල් පදනම ප්‍රසාරණය වී මුදල් ගුණක ක්‍රියාවලියක් ඔස්සේ මුදල් සැපයුම ඉහළ යයි. පොලී අනුපාතය පහළ යයි. පොලියට සංවේදීව පරිභෝජනය හා ආයෝජනය ඉහළ යයි. තවද රජයේ වියදම් ඉහළ යාමක් සෘජුව ම සිදුවේ. මෙසේ C,I,G වැඩිවීම ගුණක ක්‍රියාවලියක් ලෙස සමාහාර ඉල්ලුම විශාල ප්‍රමාණයකින් ප්‍රසාරණය කරයි. මේ අනුව දී ඇති වරණ අතර සමාහාර ඉල්ලුමේ විශාලතම වැඩි වීමට හේතු වන්නේ රජය විසින් මහ බැංකුව වෙත පිළිණපත් අලෙවි කිරීමයි.

★ 40 ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයින් අතුරින් 35% ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. අදාළ ගැටලුව මගින් විමසා ඇත්තේ විදේශ විනිමය වෙළෙඳපොළේ දී ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුමක් ඇති වන්නේ කවර හේතුව නිසා ද යන්න යි. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් වැරදි වරණ කෙරෙහි යොමු වීම මගින් අනාවරණය වන්නේ රුපියල් සඳහා ඉල්ලුමක් ඇති කරන සාධක පිළිබඳව දැනුම ප්‍රමාණවත් නො වන බවය. මේ නිසා එම දැනුම තහවුරු කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය. විදේශ විනිමය වෙළෙඳ පොළෙහි විදේශීය විනිමයට ඇති ඉල්ලුම හා සැපයුම මත එහි මිල තීරණය වන ආකාරයට දේශීය මුදලට ඇති ඉල්ලුම හා සැපයුම මත ද, විනිමය වෙළෙඳ පොළෙහි මිල තීරණය වන ආකාරය හැදෑරිය යුතුය.

★ 41 ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයන ලද අපේක්ෂකයින් ප්‍රතිශතය 31% කි. මෙම ප්‍රශ්නයට අපේක්ෂකයින් බහුතරයක් වැරදි පිළිතුරු සපයා ඇත්තේ සාපේක්ෂ වාසිය තීරණය කරන සාධක හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති වීම නිසා ය. දී ඇති වරණවල තාර්කික භාවය කෙරෙහි ද අවධානය යොමු කරවමින් පිළිතුරු තේරීමට අපේක්ෂකයින් හුරු කළ යුතුය.

★ 42 ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා ඇත්තේ 27% ක් වැනි ප්‍රතිශතයකි. එම ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ දේශීය මුදලේ විදේශ අගය වැඩි වීමක් ආනයන කෙරෙහි බලපාන ආකාරය යි. නමුත් අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් වැරදි වරණ වෙත යොමු වීමෙන් පෙනී යන්නේ විනිමය අනුපාතිකය තීරණය වීම පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නො වන බවයි.
අනෙකුත් කරුණු නො වෙනස්ව තිබිය දී දේශීය මුදල් ඒකකයේ බාහිර අගය වැඩිවීමකින් පෙන්නුම් කරනුයේ ඩොලරයකට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය අඩු වීමකි. අනෙක් අතට රුපියලකට හුවමාරු වන ඩොලර් ප්‍රමාණය වැඩි වීමකි. එවැන්නක් සිදු විය හැකි අවස්ථා නම්,

(1) ආනයන වටිනාකම ස්ථාවරව තිබියදී අපනයන වටිනාකම ඉහළ යාම.
(2) අපනයන වටිනාකම ස්ථාවරව තිබියදී ආනයන වටිනාකම පහළ යාම.
(3) අපනයන වටිනාකම වැඩි වී ආනයන වටිනාකම අඩු වීම.

★ 43 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන ලද අපේක්ෂකයින් අතුරින් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 37% ක ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ විදේශ ගනුදෙනුවක් ගෙවුම් ශේෂ ලේඛනයක ද්විත්ව සටහන් මූලධර්මය අනුව වාර්තා කරන ආකාරය යි. නමුත් අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් වැරදි පිළිතුරු සැපයීම මගින් හෙළි වන්නේ අදාළ දැනුම හා අවබෝධය නොමැති බවයි. එබැවින් ගෙවුම් ශේෂ ලේඛනයේ සෑම ගිණුමකට ම අදාළ වන විවිධ ගනුදෙනු රාශියක් ද්විත්ව සටහන් මූලධර්මය අනුව නිවැරදිව සටහන් කරවීමට අභ්‍යාස කරවිය යුතුය.

★ 47 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 37% කි. දරිද්‍රතාවයේ ආංශික ව්‍යාප්තිය පිළිබඳ කාලීන තොරතුරු ප්‍රශ්නය මගින් විමසා ඇත. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් වැරදි වරණ වෙත යොමු වීම වැළැක්වීමට ජනගහන දරිද්‍රතාවයේ මෑත කාලීන උපනතීන් පිළිබඳ දැනුම යාවත්කාලීන කළ යුතුය.

★ 49 ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය පිළිබඳවය. එයට නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 38% කි. දළ දේශීය නිෂ්පාදිතය හා සේවා නියුක්තිය පිළිබඳ කාලීන දත්ත පිළිබඳ දැනුම යාවත්කාලීන කළ යුතුය.

★ 50 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 30% කි. අපේක්ෂකයින් වැරදි පිළිතුරු වෙත යොමු වී ඇත්තේ ආර්ථික සහයෝගීතා සංවිධාන පිළිබඳ දැනුම ප්‍රමාණවත් නො වීම හේතුවෙනි.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

'අ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| II පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| අවසාන ලකුණ = 200 ÷ 2 | | = | 100 |

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4.1 සහ 4.2 ඇසුරින් ඉදිරිපත් කර ඇත.

### "අ" කොටස

### 01 ප්‍රශ්නය

1. (i) ආර්ථික සම්පත්වල ප්‍රභේද **හතර** කවරේ ද? එක් එක් ප්‍රභේදය සඳහා නිදසුන බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක්, මධ්‍යගත සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කවර ආකාරයන්ගෙන් ද? (ලකුණු 04 යි)

(iii) ආර්ථික විද්‍යාව තුළ ප්‍රාග්ධන සම්පතක් වශයෙන් මුදල් **නොසැලකෙන්නේ** ඇයි? (ලකුණු 04 යි)

(iv) ව්‍යවසායකයෙකු යනු කවරෙක් ද? වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ව්‍යවසායකයන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන්නේ ඇයි? (ලකුණු 04 යි)

(v) පෞද්ගලික දේපොළ සහ දේපොළ හිමිකම් ආරක්ෂා කිරීම වෙළෙඳපොළ ආර්ථිකයේ සාර්ථකත්වය සඳහා අතිශය තීරණාත්මක වන්නේ ඇයි? (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i)
- භූමිය නිදසුන : මත්ස්‍ය සම්පත (ලකුණු **01**යි)
- ශ්‍රමය නිදසුන : ධීවර යාත්‍රාවක මසුන් අල්ලමින් ගත කළ කාලය (ලකුණු **01**යි)
- ප්‍රාග්ධනය නිදසුන : දැල් ආම්පන්න (ලකුණු **01**යි)
- ව්‍යවසායකත්වය නිදසුන : මත්ස්‍ය ආහාර අලෙවිකරන ආපන ශාලාවක් ආරම්භ කිරීම (ලකුණු **01**යි)

(ii)

| නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය | මධ්‍යගත සැලසුම් ආර්ථිකය |
|---|---|
| - සම්පත්වල පෞද්ගලික අයිතිය | - සම්පත් පිළිබඳ රාජ්‍ය හිමිකාරීත්වය |
| - පෞද්ගලික ව්‍යවසාය | - රාජ්‍ය ව්‍යවසාය |
| - තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකේන්ද්‍රණය වීම | - තීරණ ගැනීමේ ක්‍රියාවලිය කේන්ද්‍රගත වීම |
| - මිල යාන්ත්‍රණය | - මධ්‍යගත සැලසුම් යන්ත්‍රණය |
| - වෙළෙඳපොළට සහභාගී වන සියල්ලෝ ම ස්වාර්ථය මත උත්ප්‍රේරණය වී තීරණ ගැනීම | - සම්පත් භාවිතය, නිෂ්පාදන සංයුතිය, නිෂ්පාදනය බෙදා හැරීම වැනි සියලු ම ප්‍රධාන තීරණ මධ්‍යම සැලසුම් මණ්ඩලය විසින් ගනු ලැබීම. |
| - ලාභ වැඩි කර ගැනීම සඳහා නිෂ්පාදකයන් අතර දැඩි තරගකාරීත්වයක් පැවතීම | - තරගයක් නො පැවතීම |
| - ආණ්ඩුවේ කාර්යභාරය අතිශයින් සීමිත වීම | - භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, පරිභෝජනය බෙදා හැරීම වැනි ආර්ථිකයේ සෑම අංශයකම ආණ්ඩුව මැදිහත් වීම |
| - සම්පත් උපයෝජනය කාර්යක්ෂම වීම | - සම්පත් නාස්තියක් හට ගැනීම (අධි නිෂ්පාදනය හෝ ඌන නිෂ්පාදනය) |
| - පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාව මත නිෂ්පාදනය සිදු වීම | - මූලික අවශ්‍යතා (basic needs) පදනම් කරගෙන නිෂ්පාදනය කිරීම |

| | |
|---|---|
| - ආර්ථික නිදහස: දේපොළ උපයා ගැනීමට සහ පවත්වා ගැනීමට ඇති නිදහස, රැකියා තෝරා ගැනීමේ නිදහස | - ආර්ථික නිදහස සහ පාරිභෝගික ස්වාධිපත්‍ය අහිමි වීම |
| - සාර්ව ආර්ථික අස්ථායිතාව | - සාර්ව ආර්ථික ස්ථායිතාව |
| - ආදායම් හා ධන ව්‍යාප්තියේ විෂමතා පැවතීම | - ආදායම් හා ධන ව්‍යාප්තිය සධාරණ වීම |
| - ද්‍රව්‍යාත්මක සානුබල | - බලය පදනම් කරගත් සානුබල |

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

(iii)- ආර්ථික විද්‍යාවේ ප්‍රාග්ධනය යන්නෙන් අදහස් කරනුයේ මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන ආධාරකයන් ය. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට ඒවා ඍජුව ම දායක වේ. එහෙත් මුදල් යොදා ගනිමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ නො හැකිය. එබැවින් මුදල්, නිෂ්පාදන සාධකයක් ලෙස නො සැලකේ.

**(ලකුණු 03යි)**

- ආර්ථික විද්‍යාවේ ප්‍රාග්ධනය යන්නෙන් අදහස් කරනුයේ මූර්ත වත්කමයි. එහෙත් මුදල්, මූර්ත වත්කමක් නො ව මූල්‍ය වත්කමකි.

- මුදල් (නැතහොත් මූල්‍ය ප්‍රාග්ධනය) භාවිත කොට ප්‍රාග්ධන භාණ්ඩ මිල දී ගත හැකි ය. එබැවින් ප්‍රාග්ධනය අත්පත් කර ගැනීමේ මාධ්‍යයක් ලෙස මුදල් සැලකේ.

**(එක් කරුණක් සඳහා ලකුණු 01 යි)**

(iv)- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා භූමිය, ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සම්පත් සංචල කරමින් නිෂ්පාදනය සංවිධානය කරන මානව සම්පත ව්‍යවසායකයා වේ.

**(ලකුණු 01යි)**

- උපාය මාර්ගික වැදගත් කමකින් යුත් ව්‍යාපාරික තීරණ ගනිමින් ව්‍යාපාරය මෙහෙයවනුයේ ව්‍යවසායකයා ය.

- ව්‍යවසායකයා අලුත් භාණ්ඩ, අලුත් නිෂ්පාදන ක්‍රම, අලුත් ව්‍යාපාර සංවිධාන වැනි නව්‍යතාවන් වාණිජ පදනමකින් හඳුන්වා දෙන්නෙකි.

- ඔහු අවදානම් දරන්නෙක් ද වේ. ලාභ උපයා ගත හැකිද යන්න පිළිබඳ සහතිකයක් නොමැත. ඔහුගේ කාලය, ශ්‍රමය සහ හැකියාව කැප කිරීම වෙනුවෙන් හිමි වන ප්‍රදානය ලාභ හෝ පාඩු විය හැකි ය.

**(ඕනෑම ව්‍යවසායක කාර්යකට ලකුණු 01යි)**

- වෙළෙඳපොළ ආර්ථිකය රඳා පවත්නා ප්‍රධාන ස්ථම්භයක් වනුයේ පෞද්ගලික ව්‍යවසාය යි. එබැවින් වෙළෙඳපොළ ආර්ථිකයට ව්‍යවසායකයා අත්‍යවශ්‍ය වේ.

**(ලකුණු 01යි)**

- සෑම ආර්ථික පද්ධතියක් විසින් ම විසඳාගත යුතු මූලික ආර්ථික ප්‍රශ්නයක් වන කුමක්, කොපමණ, ප්‍රමාණයකින් නිෂ්පාදනය කරන්නේ ද යන්න වෙළෙඳපොළ ආර්ථිකයක විසඳා ගැනීමේ දී, ව්‍යවසායකයා මූලික කාර්ය භාරයක් ඉටු කරයි. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන සම්පත් සංවිධානය හා සංචල කිරීම කරනුයේ ව්‍යවසායකයා යි. තමා සතු අරමුදල් පවා අවදානමකට ලක් කරමින් ව්‍යාපාර ආරම්භ කිරීමට ඔහු යොමු වේ.

**(ලකුණු 01යි)**

(v) - වෙළෙඳපොළ ආර්ථිකය ස්ථාපිත කොට ඇත්තේ පෞද්ගලික දේපොළ, ව්‍යවසාය ස්වාර්ථය හා තේරීමේ නිදහස යන ප්‍රධාන ස්ථම්භ මත ය. දේපොළ අයිතිවාසිකම් යන්නෙන් අදහස් කරනුයේ තමන් සතු දේපොළ තම අභිමතය පරිදි භාවිතා කිරිමට පුද්ගලයන්ට හා ආයතන වලට ඇති සුවිශේෂ අයිතිවාසිකම යි. වෙළෙඳපොළ ක්‍රමය පවත්වා ගෙන යා හැක්කේ දේපොළ අයිතිවාසිකම් තහවුරු කොට ඇතොත් පමණි. තමන්ගේ අස්වැන්න කිසිවකු විසින් පැහැර ගැනීමට ඉඩක් ඇත්නම් ගොවියෙක් තම භූමිය වගා කටයුත්තකට යොමු නො කරයි. දේපොළ අයිතිවාසිකම් සුරක්ෂිත නො වේ නම් වෙළෙඳපොළ ආර්ථිකයක, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අතිශයින් සීමිත වනු ඇත.

(ලකුණු 01යි)

- වෙළෙඳාම හා හුවමාරුව කාර්යක්ෂම වීමට දේපොළ හිමිකාරිත්වය ඍජුව ම බලපායි. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක හුවමාරුව සිදු වන්නේ වෙළෙඳපොළ ඔස්සේ ය. කිසියම් පුද්ගලයෙකුට, තවත් පුද්ගලයෙකු සමග ස්වේච්ඡාවෙන් භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම සඳහා, දේපොළ හිමිකාරිත්වය පිළිගැනීමත්, එම හිමිකම ආරක්ෂා කිරිමත් අත්‍යවශ්‍ය වේ.


- වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ සිටින පුරවැසියනට ප්‍රාග්ධනය ස්වරූපයෙන් තම ධනය සමුච්ඡනය කර ගැනීමට සහ ආර්ථික වෘද්ධි ක්‍රියා දාමයට දායක වීමට නිශ්චිත දේපොළ හිමිකාරිත්වයක් තිබීම අත්‍යවශ්‍ය වේ. පුද්ගලයන්ගේ ඉතිරිකිරීම් කිසිවකු විසින් අත්පත් කර ගනිතැයි මිනිසුන් සිතනවා නම්, ඔවුන් ඉතිරි කිරීම් සඳහා පෙළඹෙන්නේ නැත. ඒ සඳහා සානුබලයක් නො ලැබේ.

(ලකුණු 01යි)

- මනාව නිර්වචනය කරන ලද දේපොළ හිමිකාරිත්ව ව්‍යුහයක් නොමැති විට වෙළෙඳපොළ අකාර්යක්ෂමතා හට ගනු ඇත. විශේෂයෙන් ම ස්වභාවික සම්පත් පිළිබඳව දැකිය හැකි කරුණක් වන්නේ, ඒවා සඳහා පෞද්ගලික දේපොළ හිමිකාරිත්වයක් දක්නට නො තිබීම ය. එබැවින් එම සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීමට පෙළඹීමක් නොමැති හෙයින් ඒවා අධි උපයෝජනයට පාත්‍ර වී විනාශ වී යාමට ඉඩ ඇත.


(ලකුණු 01යි)

**01 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 9.7%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 39%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 05ක් ඇත. පහසුතාව අඩු ම කොටස (v) වී ඇති අතර, එහි පහසුතාව 20%කි. එමෙන්ම (i) කොටස පහසු ම කොටස වී ඇති අතර එහි පහසුතාව 79%කි.

- ⋆ පළමු ප්‍රශ්නය තෝරාගත් සිසුන් ප්‍රතිශතය 96.6% කි. කොටස් පහකින් සමන්විත ප්‍රශ්නයේ I වන කොටසෙහි පහසුතාව 79% කි. ආර්ථික සම්පත්වල ප්‍රභේද නම් කර ප්‍රභේදවලට නිදසුන් දැක්වීම සඳහා මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. අපේක්ෂකයින් වැඩි දෙනෙකු නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබීමෙන් පැහැදිළි වන්නේ උක්ත සංකල්පය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් තිබූ බවයි. ආර්ථික සම්පත් වර්ග උදාහරණ සහිතව පැහැදිළි කිරීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගත යුතුයි.

- ⋆ II කොටසේ පහසුතාව 66% කි. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මධ්‍ය සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේ දැයි සංසන්දනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමුවී තිබුණි. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක හා මධ්‍ය සැලසුම් ආර්ථිකයක ලක්ෂණ වෙන වෙනම ඉදිරිපත් කර තිබීම මෙම ප්‍රශ්නයේ ලකුණු අඩු වීමට හේතු වී තිබුණි. මෙවැනි වෙනස්කම් පිළිබඳ ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමේ දී සංසන්දනාත්මකව පිළිතුරු සැපයීම වැදගත් වන බව අපේක්ෂකයන්ට පැහැදිලි කළ යුතුය.

- ⋆ III වන කොටසේ පහසුතාව 51% කි. ආර්ථික විද්‍යාවේදී මුදල්, ප්‍රාග්ධන සම්පත් වශයෙන් නො සැලකීම හා සම්බන්ධව මෙම ප්‍රශ්නය ඉදිරිපත් වී තිබුණි. අපේක්ෂකයින්ගෙන් අඩකට පමණ ආර්ථික විද්‍යාවේ ‘ප්‍රාග්ධනය’ යන සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති බව පෙනී යයි. ආර්ථික විද්‍යාවේ ප්‍රාග්ධනය යන සංකල්පය නිවැරදිව පැහැදිලි කරමින් මුදල්, ප්‍රාග්ධනය ලෙස නො සැලකීමට හේතු විස්තර කිරීමට හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

- ⋆ IV කොටසේ පහසුතාව 54% කි. ව්‍යවසායකයෙකු යනු කවරෙක්ද හා වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ව්‍යවසායකයෙකු ඉටු කරන කාර්යයන් සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නය සකස්වී තිබුණි. ව්‍යවසායකයා කවරෙක්ද යන්න පිළිබඳව අපේක්ෂකයින් තුළ අවබෝධයක් තිබූ නමුත් වෙළෙඳපොළ ආර්ථිකයක ව්‍යවසායකයාගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධය ප්‍රමාණවත් නො වීය. එම නිසා වෙළෙඳපොළ ආර්ථිකයක ව්‍යවසායකයෙකුගේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වේ.

- ⋆ V කොටසේ පහසුතාව 20% කි. පෞද්ගලික දේපොළ හා දේපොළ හිමිකම් ආරක්ෂා කිරීම වෙළෙඳපොළ ආර්ථිකයේ සාර්ථකත්වය සඳහා අතිශයින් ම තීරණාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳව විමසීමට මෙම ප්‍රශ්නය සකස් කර තිබුණි. ඉතාමත් අඩු අපේක්ෂක ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර ඇත. වෙළෙඳපොළ ආර්ථිකය ස්ථාපිත කොට ඇත්තේ පෞද්ගලික දේපොළ, පෞද්ගලික ව්‍යවසාය, ස්වාර්ථය හා තේරීමේ නිදහස යන ප්‍රධාන ස්ථම්භ මත බවත් දේපොළ හිමිකාරිත්වය ආරක්ෂා කිරීම හුවමාරුව කාර්යක්ෂම වීමට වැදගත් වන බවත් පැහැදිලි කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය. එසේම වෙළෙඳපොළ ආර්ථිකයක පවතින දේපොළ වර්ග පිළිබඳවත්, එම දේපොළ අයිතියේ ස්වභාවය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.

## 02 ප්‍රශ්නය

**2.** (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක් ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින විට ඔබ උපකල්පනය කරන දෑ නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පිටතට විතැන් වීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 02 යි)

(iii) වැඩෙන ආවස්ථික පිරිවැය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය සම්බන්ධයෙන් මෙම සංකල්පයෙන් ගම්‍ය වන්නේ කවරක් ද? (ලකුණු 04 යි)

(iv) වී සහ රෙදිපිළි නිෂ්පාදනයේ දී වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්වයට මුහුණ දෙන රටක් සඳහා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින්න. පහත සඳහන් සිදුවීම් නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වෙනස් වන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

(අ) වඩාත් හොඳ පොහොර වර්ගයක් අලුතින් සොයා ගැනීම

(ආ) නිෂ්පාදන ක්ෂේත්‍ර දෙකෙහි ම සේවා නියුක්ත කළ හැකි ශ්‍රම ප්‍රමාණයේ විශාල ප්‍රසාරණයක් හට ගැනීම

(ඉ) දැඩි ඉඩෝරයක් නිසා වගා කළ හැකි ගොවි බිම් ප්‍රමාණය 10%කින් අඩු වීම

(ඊ) නිෂ්පාදන පිරිවැය අඩු කෙරෙන නව තාක්ෂණයක් රෙදිපිළි කර්මාන්තය තුළ සොයා ගැනීම (ලකුණු 06 යි)

(v) නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2 (i) - නිෂ්පාදන හැකියා වක්‍රයක් යනු, යම් දෙන ලද අවස්ථාවක ආර්ථිකයේ සියලු ම නිෂ්පාදන සම්පත්, දෙන ලද තාක්‍ෂණ මට්ටමක් යටතේ උපරිම කාර්යක්‍ෂමතාවකින් (පූර්ණ සේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය සහිතව) උපයෝජනය කරනු ලැබූ විට, කිසියම් භාණ්ඩ හා සේවාවන් දෙකකින් නිෂ්පාදනය කළ හැකි උපරිම භාණ්ඩ ප්‍රමාණය සහ ඒවායේ විවිධ සංයෝජන පෙන්නුම් කරන ලක්‍ෂ්‍යයන් එකිනෙකට යා කොට අඳිනු ලබන රේඛාවයි.

(ලකුණු 02යි)

- උපකල්පන
  - අදාළ කාල පරිච්ඡේදය තුළ පවත්නා සම්පත් සම්භාරය (ප්‍රමාණය හා ගුණාත්මක තත්වය) නො වෙනස්ව තිබීම.
  - තාක්‍ෂණය නො වෙනස්ව තිබීම.
  - සම්පත් කාර්යක්‍ෂම ලෙස නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝජනය කිරීම (ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්තිය සහ පූර්ණ නිෂ්පාදනය දක්නට ලැබීම.)
  - භාණ්ඩ දෙකක් පමණක් නිෂ්පාදනය කිරීම සඳහා සම්පත් භාවිත කිරීම.

**(එක් උපකල්පනයකට ලකුණු 01 බැගින් උපකල්පන දෙකකට ලකුණු 02 යි.)**

(ii) නිෂ්පාදන සම්පත් සම්භාරය ප්‍රසාරණය වීම.
- තාක්‍ෂණය උසස් වීම.
- ඵලදායිතාව වර්ධනය වීම.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)**

(iii) - වැඩෙන ආවස්ථික පිරිවැය යන්නෙන් අදහස් කෙරෙනුයේ නිෂ්පාදන හැකියා වක්‍රයක් මත, එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකකවලින් ක්‍රමයෙන් වැඩි කරන විට, ඒ වෙනුවෙන් කැප කිරීමට සිදුවන අනික් භාණ්ඩයේ ප්‍රමාණය හෙවත් ආවස්ථික පිරිවැය, ක්‍රමයෙන් ඉහළ නගින බවය.

(ලකුණු 02යි)

[විකල්ප පිළිතුර:

- ආර්ථිකයේ සියලු ම නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කර ඇති විටක, කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කිරීමට යාමේදී, ආවස්ථික පිරිවැය නැතහොත් අනෙක් භාණ්ඩයෙන් කැප කිරීමට සිදුවන ප්‍රමාණය ඉහළ නගින බව ය.] (ලකුණු 02යි)

- වැඩෙන ආවස්ථික පිරිවැය නිෂ්පාදන හැකියා වක්‍රයේ හැඩය මත පිළිබිඹු වනුයේ හැකියා වක්‍රය මූලයට අවතල හැඩයක් නැතහොත් පිටතට නෙරාගිය ස්වරූපයක් ගැනීමෙනි.

**(ලකුණු 01යි)**


- වැඩෙන ආවස්ථික පිරිවැය තත්වයක් පවතින විට, තිරස් අක්ෂයේ නිරූපණය කරනු ලබන භාණ්ඩ සමාන ඒකකවලින් වැඩි කරන විට නිෂ්පාදන හැකියා වක්‍රයේ බෑවුම ක්‍රමයෙන් ඉහළ යයි.)

**(ලකුණු 01යි)**


- උදාහරණ: අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා උපරිම මිල නියම කිරීම. (සහල්, පාන්, කිරි පිටි, LP ගෑස් යනාදිය)
  මගී බස් ප්‍රවාහන ගාස්තු නියම කිරීම.
  උපරිම පොලී අනුපාතික නියම කිරීම.
  උපරිම ගෙවල් කුලී නියම කිරීම.

**(ලකුණු 01යි)**

(iv)





<u>හෝ</u>





**(ඉහත දක්වා ඇති ආකාරයට මූලයට අවතල හැඩය සහිත නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුළත් නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 02යි.)**

(අ) වඩාත් හොඳ පොහොර වර්ගයක් යොදා ගැනීම





වී අක්ෂයෙන් පමණක් හැකියා වක්‍රය විතැන් වීම

(ආ) ශ්‍රම ප්‍රමාණයේ ප්‍රසාරණයක් සිදු වීම





අක්ෂ දෙකෙන් ම හැකියා වක්‍රය විතැන් වීම

(ඉ) ඉඩෝරය නිසා වගා බිම් අඩු වීම




වී අක්ෂයෙන් වක්‍රය පහළට විතැන් වීම

(ඊ) රෙදිපිළි කර්මාන්තය තුළ නව තාක්ෂණයක් සොයා ගැනීම




රෙදිපිළි අක්ෂයෙන් වක්‍රය දකුණට විතැන් වීම.

**(නිවැරදි ප්‍රස්තාරයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04 යි)**

(v) - නිෂ්පාදන කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කෙරෙනුයේ, අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ අදාළ භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීම ය. (එනම් දෙන ලද යෙදවුම් ප්‍රමාණයකින් උපරිම නිමැවුමක් ලබා ගැනීම හෝ දෙන ලද නිමැවුමක් අවම යෙදවුම් ප්‍රමාණයකින් නිපදවීම හෝ මින් අදහස් වේ).

**(ලකුණු 01යි)**

නිෂ්පාදන කාර්යක්ෂමතාව සඳහා පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය අවශ්‍ය කරන බැවින්, එම තත්වය යටතේ ආර්ථිකය හැම විට ම නිෂ්පාදන හැකියා වක්‍රය මත ලක්ෂ්‍යයක කටයුතු කරනු ඇත.

**(ලකුණු 01යි)**

**[විකල්ප පිළිතුර:**


- ආර්ථිකයකට, වෙනත් භාණ්ඩයක නිෂ්පාදනය අඩු නො කොට කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කළ නො හැකි තත්වයක් පවතී නම් එහිදී නිෂ්පාදන කාර්යක්ෂමතාව හට ගනී. මින් හැඟවෙන්නේ ආර්ථිකය නිෂ්පාදන හැකියා වක්‍රය මත සිටින බව ය.]

**(ලකුණු 02යි)**

- සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව යන්නෙන් අදහස් කෙරෙනුයේ සමාජයට වඩාත් අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීම සඳහා ආර්ථිකයේ සම්පත් බෙදා වෙන් කළ යුතු බව ය. **(ලකුණු 01යි)**


- මින් හැඟවෙන්නේ ආර්ථිකය නිෂ්පාදන හැකියා වක්‍රය මත ප්‍රශස්ත ලක්ෂ්‍යයක කටයුතු කරන බව ය. මෙම ප්‍රශස්ත තත්වය ළඟා වනුයේ එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආන්තික පිරිවැය, එම භාණ්ඩයේ මිලට සමාන විටදීය, එනම් MC=P වශයෙනි. **(ලකුණු 01යි)**

**02 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




02 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 97.89%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 19%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 37%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 5 කින් සමන්විත වන අතර ඉන් පහසුතාව වැඩි ම කොටස iv වේ. එහි පහසුතාව 89%කි. iii කොටසේ පහසුතාව 54%කි. එය පහසුතාව අඩු ම කොටසයි.

- i කොටසේ පහසුතාව 69% කි. නිෂ්පාදන හැකියා මායිම යනු කුමක් දැයි යන්නට, අපේක්ෂකයන් ලබා දී ඇති පිළිතුරුවල අසම්පූර්ණ බවක් පැවතීම අඩු ලකුණු ලැබීමට හේතු විය. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් අඳින විට එළඹෙන උපකල්පන බොහෝ අපේක්ෂකයන් ඉතා නිවැරදිව පිළිතුරුවල සපයා තිබුණි.

- ii කොටසේ පහසුතාව 71% කි. බොහෝ අපේක්ෂකයන් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වීමට හේතුව ආර්ථික වෘද්ධිය බව පවසා තිබුණ ද එයට බලපාන සාධක ලිවීමට අපොහොසත් වී ඇත. සම්පත් සම්භාරය ඉහළ යාම හා සාධක ඵලදායීතාව ඉහළ යාම නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන් කිරීමට හේතුවන බව අවධාරණය කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

- iii කොටසේ පහසුතාව 54% කි. දෙවන ප්‍රශ්නයේ දී අපේක්ෂකයන් අඩු ම ලකුණු ලබා ගත් ප්‍රශ්න කොටස විය. වැඩිවන ආවස්ථික පිරිවැය යන්න අපේක්ෂකයන් විසින් පැහැදිළිව විවරණය කර තිබුණි. නමුත් මෙම සංකල්පයෙන් ගම්‍ය වන්නේ කුමක් ද යන්න පැහැදිළි කිරීමට අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. ආවස්ථික පිරිවැය හැසිරීම හා නිෂ්පාදන හැකියා මායිමේ හැඩය අතර සම්බන්ධය තහවුරු කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

- iv කොටසේ පහසුතාව 89% කි. අපේක්ෂකයන් අඩු ලකුණු ලබා ගෙන ඇත්තේ (ඉ) කොටසටය. එනම් එහි පහසුතාව 67% කි. එසේ වීමට හේතුව වගා බිම් අඩු වීමක් යනු සම්පත් සම්භාරයේ අඩු වීමක් බව හඳුනා ගෙන නොමැති වීමයි. ඒ අනුව නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වන අවස්ථා සහ ඇතුළත ලක්ෂ්‍යයකට ගමන් කරනු ලබන අවස්ථා සහිත ප්‍රායෝගික භාවිතයන් නිවැරදිව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගත යුතුය.

- v කොටසේ පහසුතාව 56% කි. මෙම කොටසට ලබා ගත් ලකුණු ප්‍රමාණය ද සාපේක්ෂව පහළ මට්ටමක පැවතිණි. නිෂ්පාදන කාර්යක්ෂමතාව යන්න අපේක්ෂකයන් විසින් නිවැරදිව අවබෝධ කරගෙන නො තිබුණි. විශේෂයෙන් ම සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාවක් පවතින විට මිල ආන්තික පිරිවැයට (P =MC බව) සමාන බව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. මේ නිසා සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාවයේ දී මිල ආන්තික පිරිවැයට සමාන වන බව (P =MC) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධානයට යොමු කළ යුතුය.

## 03 ප්‍රශ්නය

**3.** (i) පාරිභෝගික භාණ්ඩයක ඉල්ලුමේ මිල නම්‍යතාව තීරණය කරනුයේ කවර සාධක ද? (ලකුණු 04 යි)

(ii) පහළට බෑවුම් වන රේඛීය ඉල්ලුම් වක්‍රයක්, ඉහළ මිල පරාසයන්හි දී වඩාත් මිල නම්‍ය වන්නේත්, පහළ මිල පරාසයන්හි දී වඩාත් මිල අනම්‍ය වන්නේත් ඇයි? (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන භාණ්ඩයන්ගේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවන් මත ඔබ එම භාණ්ඩ 'සුඛෝපභෝගී', 'අත්‍යවශ්‍ය' හා 'බාල' වශයෙන් වර්ග කොට දක්වන්නේ කෙසේ ද?

(අ) බෝතල් කළ ජලය 1.3


(ආ) කව්පි – 0.8

(ඉ) පාන් 0.5

(ඊ) ජංගම දුරකථන 1.8 (ලකුණු 04 යි)

(iv) තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.

දැන්, රජය එම භාණ්ඩය මත ඒකකයකට රුපි. 60ක් වන සේ දේශීය භාණ්ඩ බද්දක් නිෂ්පාදකයන් මත පනවනවා යැයි සිතන්න.




(අ) බද්දෙහි ප්‍රතිඵලයක් වශයෙන් පාරිභෝගික අතිරික්තය කොතරම් ප්‍රමාණයකින් වෙනස් වේ ද? (ලකුණු 02 යි)

(ආ) බද්දෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදක අතිරික්තය කොතරම් ප්‍රමාණයකින් වෙනස් වේ ද? (ලකුණු 02 යි)

(ඉ) දේශීය භාණ්ඩ බද්දෙන් රජය එකතු කර ගනු ලබන අයභාරය කොපමණ ද? (ලකුණු 02 යි)

(ඊ) බද්ද නිසා අහිමි වන ආර්ථික අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (i) - ආදේශන භාණ්ඩයන්ගේ සුලබතාව

- පාරිභෝගිකයන්ගේ ආදායමින් භාණ්ඩය සඳහා වැය කරන ප්‍රතිශතය (ලකුණු 01යි)
- සලකා බලන භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයක් ද අත්‍යවශ්‍ය භාණ්ඩයක් ද යන්න
- භාණ්ඩ නිර්වචනය කර ඇති ආකාරය (නිර්වචනය කරනුයේ පුළුල් පරාසයක් ද පටු පරාසයක් ද යන්න)
- භාණ්ඩයේ භාවිත (ප්‍රයෝජන) සංඛ්‍යාව
- මිල වෙනස්වූ පසු ගත වී ඇති කාලය

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)**

(ii) - පහළට බෑවුම්වන රේඛීය ඉල්ලුම් වක්‍රයක ලක්ෂ්‍ය මිල නම්‍යතාව ගණනය කරන සූත්‍රය පහත දැක්වේ.

$$Edp = \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Qd}$$

මෙම සූත්‍රයේ වම්පස පදය නිරූපණය කරනුයේ ඉල්ලුම් වක්‍රයේ බෑවුම හෝ බෑවුමේ පරස්පරයයි. රේඛීය ඉල්ලුම් වක්‍රයක් මත සෑම ලක්ෂ්‍යයක ම බෑවුම හෝ බෑවුමේ පරස්පරය ස්ථාවර අගයක් ගනී.එබැවින් රේඛීය ඉල්ලුම් වක්‍රයක් මත මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ අගය වෙනස් වනුයේ ඉහත සූත්‍රයේ දකුණු පස පදයේ $[\frac{P}{Q}]$ අගය වෙනස් වීම මත ය.

**(ලකුණු 02යි)**

- මේ අනුව, ඉල්ලුම් වක්‍රයේ ඉහළ මිල පරාසයන්හි දී P හෙවත් මිල ඉහළ අගයක් ගන්නා බැවින් ඉල්ලුම් වක්‍රය මත ඉහළට ගමන් කරන විට නම්‍යතා සංගුණකය ඉහළ අගයක් ගනී.

**(ලකුණු 01යි)**

- ඉල්ලුම් වක්‍රයේ පහළ මිල පරාසයන්හි දී P හෙවත් මිල පහළ අගයක් ගන්නා බැවින් ඉල්ලුම් වක්‍රය මත පහළට ගමන් කරන විට නම්‍යතා සංගුණකය පහළ අගයක් ගනී.

**(ලකුණු 01යි)**

(iii)
- බෝතල් කළ ජලය : සුබෝපභෝගී
- කව්පි : බාල
- පාන් : අත්‍යවශ්‍ය
- ජංගම දුරකථන : සුබෝපභෝගී

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)**


(iv) (අ) පාරිභෝගික අතිරික්තයේ අඩු වීම : රුපි. 45,000
[බද්දට පෙර පාරිභෝගික අතිරික්තය : 60,000
බද්දට පසු පාරිභෝගික අතිරික්තය : 15,000] **(ලකුණු 02යි)**

(ආ) නිෂ්පාදක අතිරික්තයේ අඩු වීම : රුපි. 45,000
[බද්දට පෙර නිෂ්පාදක අතිරික්තය : 60,000
බද්දට පසු නිෂ්පාදක අතිරික්තය : 15,000] **(ලකුණු 02යි)**

(ඉ) බද්ද නිසා රජය ලබන අයභාරයඃ රුපි. 60,000
[90 - 30 × 1,000 = 60,000] **(ලකුණු 02යි)**


(ඊ) බද්ද නිසා අහිමිවන ආර්ථික අතිරික්තයඃ රුපි. 30,000
[(60 × 1,000) / 2 = 30,000] **(ලකුණු 02යි)**

03 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




03 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 61.2%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් iv ක් ඇත. පහසුතාව අඩු ම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 27%කි. පහසුතාව වැඩි ම කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 94%කි.

★ I කොටසේ පහසුතාව 48% කි. මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක පිළිබඳව මෙම ගැටලුව යොමු වී ඇති අතර අපේක්ෂකයන් අතුරින් සැලකිය යුතු ප්‍රතිශතයක් අදාළ ප්‍රශ්නය නිවැරදි ලෙස අවබෝධ කරගෙන නැත. ඉල්ලුම් තීරක හා ඉල්ලුම් නම්‍යතා තීරක අතර වෙනස තහවුරු වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගැනීම අවශ්‍ය ය.

★ II කොටසේ පහසුතාව 27% කි. මිල ඉල්ලුම් නම්‍යතාව එක ම ඉල්ලුම් වක්‍රයක් දිගේ ලක්ෂ්‍යයෙන් ලක්ෂ්‍යයට වෙනස් වන ආකාරය පිළිබඳ අවබෝධයක් අපේක්ෂකයින් බහුතරයකට නොමැති බව පෙනේ. මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය වන්නේ ඉල්ලුම් වක්‍රයේ බෑවුමේ අගය අනුව නො ව මිල හා ප්‍රමාණ අතර අනුපාතයේ වෙනස් වීම් නිසා බව තහවුරු වන පරිදි අභ්‍යාස කරවීමෙන් අපේක්ෂකයින්ගේ සාධන මට්ටම ඉහළ නැංවිය හැක.

★ III (අ) කොටසේ පහසුතාව 94% කි. (ඊ) කොටසේ පහසුතාව 92% කි. බොහෝ අපේක්ෂකයින් සුඛෝපභෝගී භාණ්ඩයක් පිළිබඳ ආදායම් ඉල්ලුම් නම්‍යතාව හඳුනා ගැනීමේ ඉහළ කුසලතාවක් පෙන්නුම් කොට තිබුණි.

(ආ) කොටසේ පහසුතාව 91% කි. බාල භාණ්ඩයක් සම්බන්ධයෙන් ආදායමේ ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගන්නා බව අපේක්ෂකයින් ඉහළ ප්‍රතිශතයක් අවබෝධ කර ගෙන තිබුණි.

(ඉ) කොටසේ පහසුතාව 85% කි. සාමාන්‍ය භාණ්ඩයක් සම්බන්ධයෙන් ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන එකට අඩු අගයක් ගනු ලබන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩයක් සම්බන්ධයෙන් වන බව අපේක්ෂකයින් හඳුනාගෙන තිබේ. ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ අගය අනුව භාණ්ඩ වර්ග කිරීමේ කුසලතාව වර්ධනය කළ යුතුය.

★ IV (අ) කොටසෙහි පහසුතාව 67% කි. සැපයුම් වක්‍ර හා සැපයුම් ලේඛන යොදා ගනිමින් භාණ්ඩ බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක ගණනය කිරීමේ කුසලතාව අපේක්ෂකයින්ට අඩු මට්ටමක පැවතීම මෙම උප කොටසෙහි දුෂ්කරතාවයට හේතු වී තිබේ. ප්‍රස්තාර සටහනක පාරිභෝගික අතිරික්තය නිවැරදිව දැක්වෙන ප්‍රදේශය හඳුනාගෙන වර්ග ඵලය ගණනය කිරීමත්, ඒවායේ වෙනස්කම් හඳුනා ගැනීමටත් අපේක්ෂකයාගේ කුසලතාව වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

(ආ) කොටසේ පහසුතාව 60% කි. මෙම කොටසේ පහසුතාව අඩු වීමට හේතුව ඒකක බදු පැනවීමක ප්‍රතිවිපාක සලකා බැලීමේදී ප්‍රස්තාර සටහනක නිෂ්පාදන අතිරික්තය නිවැරදිව දැක්වෙන ප්‍රදේශය හඳුනාගෙන වර්ග ඵලය ගණනය කිරීමටත්, බදු පැනවීමට පෙර සහ පසු අතිරික්තයන් හි වෙනස්කම් හඳුනා ගැනීමටත් අපේක්ෂකයාගේ කුසලතාව වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

(ඉ) කොටසේ පහසුතාව 63% කි. මෙම කොටසේ පහසුතාව අඩු වීමට හේතු වී ඇත්තේ ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇතුළත් රූප සටහනක බද්දෙන් පසු රජයට ලැබෙන බදු ආදායම දැක්වෙන ප්‍රදේශය හඳුනා ගැනීමටත් බදු ආදායමේ ප්‍රමාණය ගණනය කිරීමටත් අපේක්ෂකයාට පවතින අනවබෝධයයි. බදු ආදායම නිරූපණය කරන ප්‍රදේශය රූප සටහනක් මගින් නිවැරදිව හඳුනා ගැනීමටත් එම ප්‍රදේශයේ වර්ගඵලය ගණනය කිරීමටත් අපේක්ෂකයාගේ කුසලතාව වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යොදා ගත යුතුය.

(ඊ) කොටසේ පහසුතාව 56% කි. අහිමි වන ආර්ථික අතිරික්තය යන සංකල්පය අපේක්ෂකයන් නො හඳුනනා බවක් පෙනේ. බදු පැනවීමකට අදාළ ඉල්ලුම් සැපයුම් රූප සටහනක් තුළ අහිමි වන ආර්ථික අතිරික්තය දැක්වෙන ප්‍රදේශ නිවැරදිව හඳුනා ගැනීමටත්, එය ගණනය කිරීමටත් අපේක්ෂකයාට අවබෝධයක් නො තිබුණි. ඒ අනුව අහිමි වන ආර්ථික අතිරික්තය නිවැරදිව හඳුනා ගැනීමටත්, එහි අගය නිවැරදිව ගණනය කිරීමටත් කුසලතාව වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සුදුසු ය. අහිමි වන ආර්ථික අතිරික්තය මගින් පෙන්වන්නේ අහිමි වන සමාජ ශුභ සාධනය ම බව අපේක්ෂකයා අවබෝධ කර ගෙන නැත. එම නිසා ගණනය කිරීම නිවැරදි නැත.

## 04 ප්‍රශ්නය


**4.** (i) හීනවන ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල අතර වෙනස කුමක් ද? (ලකුණු 04 යි)

(ii) ආන්තික පිරිවැය සහ සාමාන්‍ය මුළු පිරිවැය අතර පවත්නා සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) නිෂ්පාදක අතිරික්තය, ආර්ථික ලාභය සහ ආර්ථික බදු කුලිය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) පූර්ණ තරගකාරී කර්මාන්තයක සිටින නිෂ්පාදන ආයතනයක්, වෙළෙඳපොළ මිලට වඩා ඉහළ හෝ පහළ හෝ මිලක් තෝරා **නොගන්නේ** ඇයි? (ලකුණු 04 යි)

(v) පහත රූපසටහන පෙන්නුම් කරනුයේ කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් හා පිරිවැය වක්‍රයන් ය.




(අ) වෙළෙඳපොළ මිල රුපි. 160 දී ආයතනය උපයන ලාභය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආයතනය නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කරනුයේ කවර මිලක දී ද? (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (i) - කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී ස්ථාවර යෙදවුමක් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් වැඩි වශයෙන් භාවිත කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික නිෂ්පාදිතය හා සාමාන්‍ය නිෂ්පාදිතය යන දෙක ම එක්තරා අවස්ථාවකට පසු අඩු වීමට පටන් ගැනීම, 'හීනවන ඵලදාව' යන්නෙන් අදහස් කෙරේ. **(ලකුණු 02යි)**

- දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී සියලු ම යෙදවුම් කිසියම් ප්‍රතිශතයකින් වැඩි කරනු ලැබූ විට, යෙදවුම් වැඩි කළ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතාත්මක වේගයකින් නිමැවුම වැඩි වන විට, එය 'අඩුවන පරිමාණානුකූල' ඵල ලෙස හඳුන්වනු ලැබේ. **(ලකුණු 02යි)**

(ii) - නිමැවුම අතිරේක ඒකකයකින් වැඩි කරන විට මුළු පිරිවැයට එකතුවන ප්‍රමාණය ආන්තික පිරිවැය ලෙස සැලකේ. සාමාන්‍ය මුළු පිරිවැය යනුවෙන් දක්වන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය සහ සාමාන්‍ය ස්ථාවර පිරිවැය යන පිරිවැය සංරචක දෙකෙහි එකතුව යි නැතහොත් මුළු පිරිවැය නිමැවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදූ විට ලැබෙන අගයයි. **(ලකුණු 01යි)**

- ආන්තික පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු අගයක් ගන්නා විට, සාමාන්‍ය මුළු පිරිවැය පහළ බසිමින් පවතී. **(ලකුණු 01යි)**

- ආන්තික පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි අගයක් ගන්නා විට, සාමාන්‍ය මුළු පිරිවැය ඉහළ නගිමින් පවතී. **(ලකුණු 01යි)**

- සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය කපා ගෙන ගමන් කරයි. **(ලකුණු 01යි)**

(iii) - කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ මිලෙන් එම භාණ්ඩයේ අවම සැපයුම් මිල (ආන්තික පිරිවැය) හෙවත් එම භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය අඩු කළ විට ලැබෙන අගය, නිෂ්පාදක අතිරික්තය යි. භාණ්ඩයේ මිල, එහි ආන්තික පිරිවැය ඉක්මවා යන විට නිෂ්පාදකයා අතිරික්තයක් උපයා ගනී. **(ලකුණු 01යි)**

- මුළු නිෂ්පාදන අතිරික්තය යනු කිසියම් නිමැවුම් ප්‍රමාණයක දී නිෂ්පාදකයා ලබන මුළු අයභාරයෙන් නිෂ්පාදනයේ මුළු විචල්‍ය පිරිවැය අඩු කළ විට ලැබෙන අගය යි.

**(ලකුණු 01යි)**

- ආර්ථික ලාභය යනු නිෂ්පාදන ආයතනයක මුළු අයභාරයෙන් නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය අඩු කළ විට ලැබෙන ප්‍රමාණය යි. නිෂ්පාදන ආයතනයේ ආවස්ථික පිරිවැය යනු ඍජු පිරිවැය සහ ආරෝපිත පිරිවැය යන දෙකෙහි එකතුව යි. **(ලකුණු 01යි)**

- [ විකල්ප පිළිතුර : ආර්ථික ලාභය යනු මුළු අයභාරයෙන්, මුළු විචල්‍ය පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය යන සංරචක දෙකෙන් සමන්විත මුළු පිරිවැය අඩු කළ විට ලැබෙන අගය යි. ]

**(ලකුණු 01යි)**

- ආර්ථික බදු කුලිය යනු කිසියම් නිෂ්පාදන සාධකයක හිමිකරුවෙකුට, එම සාධකය පවත්නා භාවිතයෙහි ම රඳවා ගැනීම සඳහා ඔහු පොළඹවා ගැනීමට අවශ්‍ය කරන මුදල් ප්‍රමාණයට වඩා වැඩි පුර ලැබෙන ප්‍රමාණය යි. පවත්නා භාවිතයෙහි රඳවා ගැනීම සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රමාණය එම සාධකයේ ආවස්ථික පිරිවැය වේ. **(ලකුණු 02යි)**

- [ විකල්ප පිළිතුර : ආර්ථික බදු කුලිය යනු කිසියම් නිෂ්පාදන සාධකයක් එහි සංක්‍රාම ඉපැයීම් ඉක්මවා උපයා ගනු ලබන මුදල් ප්‍රමාණය වේ. ] **(ලකුණු 02යි)**

(iv) - පූර්ණ තරගකාරී කර්මාන්තයක සිටින නිෂ්පාදන ආයතන මිල ගනුවෝ වෙති. මිල ගනුවෙක් ලෙස හඳුන්වන්නේ ඔවුනට වෙළෙඳපොළ මිල කෙරෙහි බලපෑමක් කළ නොහැකි නිසාත්, වෙළෙඳපොළෙහි පවත්නා මිල ම අය කරමින් කටයුතු කරන කරන නිසාත් ය.

**(ලකුණු 01යි)**

- පූර්ණ තරගකාරී ආයතනයක් මිල ගනුවෙකු වීමට බලපාන ප්‍රධාන හේතුව, ඔවුන් මුළු වෙළෙඳපොළ නිමැවුමෙන් අතිශයින් කුඩා ප්‍රමාණයක් පමණක් නිපදවීමත්, නිෂ්පාදන ආයතන විසින් අය කරනු ලබන මිල පිළිබඳව ගැනුම්කරුවන්ට පූර්ණ තොරතුරු තිබීමත් ය.

**(ලකුණු 01යි)**

- මෙම තත්ත්වය තුළ කිසියම් ආයතනයක් පවත්නා වෙළෙඳපොළ මිලට වඩා වැඩි මිලක් අය කිරීමට කටයුතු කරනු ලැබුවහොත්, කිසිදු ගැනුම්කරුවෙකු මෙම ආයතනයෙන් මිල දී නො ගනී. මක්නිසා ද යත් ඒ හා සමාන භාණ්ඩ වෙළෙඳපොළේ දී වෙනත් ආයතන වෙතින් පවත්නා වෙළෙඳපොළ මිලට ම ලබා ගත හැකි බව ගැනුම් කරුවන් මනාව දන්නා බැවිනි.

**(ලකුණු 01යි)**

- කිසියම් ආයතනයක් පවත්නා වෙළෙඳපොළ මිලට වඩා අඩු මිලක් අය කරනු ලැබුවහොත්, ඔහුට විශාල ගැනුම්කරුවන් පිරිසක් හිමි කර ගත හැකි වන නමුදු එමගින් ඔහුගේ ලාභය වැඩි කර ගත හැකි නො වේ. මක් නිසාද යත් ඔහුගේ මුළු නිමැවුම පවත්නා වෙළෙඳපොළ මිලට ම විකුණා ගත හැකි නිසා ය. එබැවින් පවත්නා වෙළෙඳපොළ මිල යටතේ කටයුතු කිරීමෙන් අත් කර ගන්නා ප්‍රතිඵලයට වඩා හොඳ ප්‍රතිඵලයක් වෙනත් මිලක් යටතේ ලබා ගත නො හැකි ය. එබැවින් ආයතනය මිල ගනුවෙකු ලෙස ම කටයුතු කරයි. **(ලකුණු 01යි)**


(iv) (අ) වෙළෙඳපොළ මිල රු.160 යටතේ ලාභය:

| | | |
|---|---|---|
| ලාභය | = | මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC) |
| TR | = | $160 \times 40 = 6,400$ |
| TC | = | ATC × මුළු නිමැවුම (= 40) |
| TC | = | $100 \times 40 = 4,000$ |
| ලාභය | = | 6,400 - 4,000 = රු. 2,400 |

(ලකුණු 02 යි)


(ආ) ආයතනය නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කරන මිල : අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය යි. එනම් රුපි.40 කි. (ලකුණු 02 යි)

**04 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




04 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 36%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් v ක් ඇත. පහසුතාව අඩු ම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 38%කි. පහසුතාව වැඩි ම කොටස (i) වී ඇති අතර, එහි පහසුතාව 69%කි.

★ I කොටසේ පහසුතාවය 69% කි. I කොටස මගින් විමසන්නේ නිෂ්පාදන න්‍යාය හා සම්බන්ධ හීනවන එල සහ අඩුවන පරිමාණුකුල එල අතර වෙනස ය. පූර්ව විභාගවලදී ද, විමසා ඇති මෙම ගැටලුවට අපේක්ෂකයින් බහුතරයක් නිවැරදි පිළිතුරු සැපයීමට සමත්ව ඇත. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක හීනවන එල සහ දිගු කාලීන අඩුවන පරිමාණානුකුල එල නිවැරදිව නිර්වචනය කරමින් එහි වෙනස සැසඳීමට අපේක්ෂකයින් යම් ප්‍රතිශතයක් අපොහොසත් වී ඇති බැවින් උක්ත මාතෘකාව පිළිබඳ වගු ප්‍රස්තාර යොදා ගනිමින් දැනුම වර්ධනය කළ යුතුයි.

★ II කොටසේ පහසුතාව 38% කි. මෙයින් ගම්‍ය වන්නේ අපේක්ෂකයින් බහුතරයක් නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බවයි. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ ආන්තික පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය අතර පවතින සම්බන්ධය පිළිබඳව යි. අපේක්ෂකයින් වැඩි දෙනෙකු ආන්තික පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය නිර්වචනය කර තිබුණ නමුත් එම පිරිවැය සංකල්ප දෙක අතර පවතින සම්බන්ධය පැහැදිළි කිරීමට සමත් වී නැත. ආන්තික පිරිවැය සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු අගයක් ගන්නා විට සාමාන්‍ය මුළු පිරිවැය පහළ බසින බව සහ ආන්තික පිරිවැය සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි අගයක් ගන්නා විට සාමාන්‍ය මුළු පිරිවැය ඉහළ යන බව අවබෝධ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත යුතුය.

★ III කොටසේ පහසුතාව 51% කි. අපේක්ෂකයින්ගෙන් අඩක් පමණ සාර්ථක පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. මෙම කොටස මගින් විමසා ඇත්තේ නිෂ්පාදක අතිරික්තය, ආර්ථික ලාභය, ආර්ථික බදු කුලිය යන සංකල්ප පිළිබඳව ය. නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කිරීමට අපේක්ෂකයින් වැඩි දෙනෙකු සමත් වුවත් ආර්ථික ලාභය සහ ආර්ථික බදු කුලිය යන සංකල්ප නිවැරදිව අර්ථ දැක්වීමට අසමත් වූ බැවින් අපේක්ෂකයින් අතර පහසුතාව 51% කට සීමා වී ඇත. අදාළ සංකල්ප නිවැරදිව නිර්වචනය කිරීමටත් එම සංකල්ප අතර වෙනසට හේතුවන සාධක දැක්වීමටත් හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුය.

★ IV කොටසේ පහසුතාව 42% කි. අපේක්ෂකයින් බහුතරයක් අසාර්ථක පිළිතුරු සැපයීමට හේතු වූ කොටසකි. මෙම කොටස මගින් විමසා තිබුනේ පූර්ණ තරග කර්මාන්තයක සිටින ආයතනයක් වෙළෙඳ පොළ මිලට වඩා ඉහළ හෝ පහළ මිලක් තෝරා නො ගන්නේ ඇයි යන්නයි. පූර්ණ තරග ආයතනයක් වෙළෙඳපොළේ මිල භාර ගන්නා මිල ගනුවෙකු යැයි ප්‍රකාශ කිරීමට අපේක්ෂකයින් බොහොමයක් සමත් වුවත් වෙළෙඳපොළ මිලට ඉහළින් පිහිටි මිලක් හෝ පහළින් පිහිටි මිලක් තෝරා නො ගන්නේ මන්ද කියා කරුණු විග්‍රහ කිරීමට අපොහොසත් වී ඇත. වෙළෙඳපොළ සැපයුමෙන් ඉතා කුඩා ප්‍රමාණයක් සපයන පූර්ණ තරග ආයතනයකට තම සැපයුම අඩු කළ ද, මිල ඉහළ දැමිය නො හැකි බවත්, තම නිමැවුම වෙළෙඳපොළ මිල යටතේ මුළුමනින් ම අලෙවි කළ හැකි බැවින් මිල පහළ දැමීමේ අවශ්‍යතාවක් නොමැති බවත් අවබෝධ කර දිය යුතුය.

★ V (අ) කොටසේ පහසුතාවය 56% කි. මෙම කොටස මගින් විමසන්නේ පූර්ණ තරග ආයතනයක ආන්තික අයභාරය හා පිරිවැය ඉදිරිපත් කර, දෙන ලද ප්‍රස්තාර සටහනක් ඇසුරින් ආයතනය උපයන ලාභය කොපමණද යන්නය. අපේක්ෂකයින්ගෙන් අඩකට වැඩි ප්‍රතිශතයක් ලාභය නිවැරදිව ගණනය කිරීමට සමත් වුවත් ඇතැම් අපේක්ෂකයින්ට සාමාන්‍ය අයභාරය ඇසුරෙන් මුළු අයභාරය සහ සාමාන්‍ය මුළු පිරිවැය ඇසුරෙන් මුළු පිරිවැය ඇස්තමේන්තු කර ලාභය ගණනය කර ගැනීමේ දැනුම භාවිත කුසලතාව වර්ධනය කළ යුතුය.

(ආ) කොටසේ පහසුතාවය 75% වැනි ඉහළ මට්ටමකට යාම නිරූපණය කරන්නේ අපේක්ෂකයින් විශාල පිරිසක් නිෂ්පාදනය අත්හිටුවීමේ මිල, ආයතනයේ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය කියා හඳුනා ගෙන තිබූ බවයි.

## 05 ප්‍රශ්නය

**5.** (i) එකතු කළ අගය යනු කුමක් ද? එය ගණනය කරනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

(ii) සමාහාර ආදායමේ ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන ගනුදෙනු, රටක දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළු කර ගන්නවා ද නැද්ද යන්න පැහැදිලි කරන්න.

(අ) විදේශයක නිෂ්පාදනය කරන ලද රුපි. මිලියන 10ක් වටිනා ටින් කෑම සංචාරක හෝටලයක් විසින් මිල දී ගැනීම

(ආ) නිෂ්පාදන සමාගමක් අගනුවර සිසිල් බීම බෝතල් කිරීමේ කම්හලක් අලුතින් ඉදි කිරීම

(ඉ) ආයෝජකයකු විසින් ප්‍රධාන වාණිජ බැංකුවක රුපි. මිලියන 30ක් වටිනා කොටස් මිල දී ගැනීම

(ඊ) පොත් ප්‍රකාශකයකු විසින් අලුත් පොතක පිටපත් විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කොට, එයින් මෙම වර්ෂයේ අලෙවි නොවූ අතිරික්ත පිටපත් සංඛ්‍යාව, සමාගමේ තොගවලට එකතු කිරීම (ලකුණු 04 යි)

(iv) එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| | | |
|---|---|---|
| ස්වායත්ත පරිභෝජනය | = | 500 |
| සැලසුම් කළ ආයෝජනය (I) | = | 1 250 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) | = | 1 000 |
| ශුද්ධ අපනයන (NX) | = | – 250 |
| ආන්තික පරිභෝජන නැඹියාව (MPC) | = | 0.8 |

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්ණය කරන්න. (ලකුණු 04 යි)

(v) එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු ම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

| | | |
|---|---|---|
| ජාතික ආදායම | = | 1 000 |
| පරිභෝජන වියදම් | = | 500 |
| ආණ්ඩුවේ වියදම් | = | 250 |
| ශුද්ධ අපනයන | = | 100 |
| අයවැය හිඟය | = | 40 |

(අ) වැය කළ හැකි ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ ආයෝජන වටිනාකම කොපමණ ද? (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

05. (i) - කිසියම් නිෂ්පාදන කටයුත්තක එකතු කළ අගය ලෙස සලකනුයේ, නිමැවුමේ වටිනාකමෙන් එම නිමැවුම නිෂ්පාදනය කිරීම සඳහා වෙනත් නිෂ්පාදකයන්ගේ මිල දී ගත් යෙදවුම්වල වටිනාකම (අතරමැදි පරිභෝජනය), අඩු කළ විට ලැබෙන අගය යි. (ලකුණු 01යි)

- එක් එක් ආයතනය විසින් නිෂ්පාදනයට කරනු ලබන දායකත්වය, එකතු කළ අගය මිනුම් කරයි. මෙලෙස ආර්ථිකයේ සියලු ම නිෂ්පාදන ක්‍රියාකාරකම්වල එකතු කළ අගයන් එකට එකතු කළ විට, එම ආර්ථිකයේ මුළු නිමැවුමේ අගය ඇස්තමේන්තු කළ හැකිය. මුළු නිමැවුම පිළිබඳ මෙම මිනුම 'දළ එකතු කළ අගය' ලෙස නම් කෙරේ. නිමැවුමේ වටිනාකම ඇගයීමේ දී ඇති විය හැකි ද්විගණන දෝෂය, එකතු කළ අගය මගින් මිනුම් කිරීමෙන් පහව යනු ඇත. (ලකුණු 01යි)

- එකතු කළ අගය ගණනය කරන ආකාරය :
නිෂ්පාදන ක්‍රියාවලියක අදියර කිහිපයක් දක්නට ලැබේ. මේ එක් එක් අදියර, විවිධ නිෂ්පාදන ආයතන විසින් මෙහෙයවනු ලැබේ. එහි දී එක් එක් ආයතනය තම නිමැවුම බිහි කිරීම සඳහා,වෙනත් ආයතනවලින් යෙදවුම් මිල දී ගනී. එක් එක් අදියරේ දී බිහිවන එකතු කළ අගයන්, නිමැවුමේ වටිනාකමෙන් අතරමැදි යෙදවුම්වල වටිනාකම අඩු කිරීමෙන් ගණනය කළ හැකි ය.
**එකතු කළ අගය = නිමැවුමේ වටිනාකම - අතරමැදි යෙදවුම්වල වටිනාකම**

(ලකුණු 01යි)

- කමිස නිෂ්පාදනය කිරීමට අදාළ නිෂ්පාදන ක්‍රියාවලියක් පිළිබඳ කල්පිත උදාහරණයක් මෙහි දී සළකා බලමු මෙම නිෂ්පාදන ක්‍රියාවලිය අදියර කිහිපයකි. කපු වගා කිරීම, නූල් සකසා ඒවායින් රෙදි නිෂ්පාදනය කිරීම, රෙදිවලින් කමිස මැසීම, මසන ලද කමිස වෙළෙඳපොළේ අලෙවි කිරීම වශයෙන් එක් එක් අදියරෙහි දී එකතු කළ අගයන් බිහිවන ආකාරය පහත වගුවේ පෙන්නුම් කරයි.

| නිෂ්පාදන ආයතන | නිමැවුමේ වටිනාකම | අතරමැදි යෙදවුම්වල වටිනාකම | එකතු කළ අගය |
|---|---|---|---|
| කපු වගා කරන ගොවියා | 150 | 00 | 150 |
| රෙදි පිළි නිෂ්පාදකයා | 450 | 150 | 300 |
| කමිස මසන්නා | 850 | 450 | 400 |
| සිල්ලර වෙළෙන්දා | 1,000 | 850 | 150 |
| එකතු කළ අගය | | | 1,000 |
| අවසාන නිමැවුමේ වටිනාකම | | | 1,000 |

**(සංඛ්‍යාත්මක උදාහරණයක් මගින් ගණනය කිරීම දක්වා ඇත්නම් ලකුණු 02 යි.**
**සංඛ්‍යාත්මක උදාහරණ නොමැතිව ගණනය කිරීම පැහැදිළි කර ඇත්නම් ලකුණු 01 යි)**

(ii) - සේවක ආදායම්
- බදු කුලී
- ශුද්ධ පොලී
- සමාගමික නොවන ව්‍යාපාරික ලාභ
  (ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සහ වෘත්තිකයන්ගේ ආදායම්

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම අයිතම හතරකට මුළු ලකුණු 04 යි)**

**[විකල්ප පිළිතුරු**

- සේවක ආදායම්
- දේපොල ආදායම්(මූල්‍ය සම්පත් ණයට දීමෙන් හෝ ස්වභාවික සම්පත් බද්දට දීමෙන් උපයා ගනු ලබන ප්‍රාථමික ආදායම්).
- නිෂ්පාදනය හා ආනයන මත අය කරනු ලබන බදු ආදායම් (මින් නිෂ්පාදනය සහ ආනයනය මත ලබා දෙන සහනාධාර අඩු කළ යුතු වේ.)
- මෙහෙයුම් අතිරික්තය හෙවත් මිශ්‍ර ආදායම්]

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)**

(iii) - **ඇතුළත් නො කෙරේ :** දේශ සීමාවෙන් පිටත සිදු වූ නිෂ්පාදනයක් බැවින් ද.දේ. නිෂ්පාදිතයට ඇතුළත් නො වේ.

- **ඇතුළත් කෙරේ :** ප්‍රාග්ධන භාණ්ඩයක් බිහි කිරීම ඵලදායි ආර්ථික ක්‍රියාකාරකමක් වන බැවින් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වේ.

- **ඇතුළත් නො කෙරේ :** මූල්‍ය පත්‍රිකාවල කරනු ලබන ආයෝජන ජාතික ගිණුම්කරණයේ දී ඵලදායී ආර්ථික ක්‍රියාවන් ලෙස නො සළකන බැවින් දළ දේශීය නිෂ්පාදනයට ඇතුළත් නො වේ.

- **ඇතුළත් කෙරේ**
  තොග සමුච්චනය (පරිලේඛණ හෙවත් තොග, ආයෝජන සංරචකයක් වන බැවින් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කෙරේ) **(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)**

(iv) ජාතික ආදායමේ සමතුලිත මට්ටම

| | | |
|---|---|---|
| Y | = | C + I + G + X |
| C | = | 500 + 0.8Y |
| Y | = | 500 + 0.8Y + 1,250 + 1,000 + (-250) |

(ලකුණු 02 යි)

| | | |
|---|---|---|
| Y | = | 2,500 + 0.8Y |
| Y - 0.8Y | = | 2,500 |
| Y | = | 12,500 |

(ලකුණු 02 යි)

(v) වැය කළ ජාතික ආදායම :

| | | | |
|---|---|---|---|
| $Y_d$ | = | Y - NT (=ශුද්ධ බදු) | |
| BD | = | G > T =40 | |
| T | = | G - 40 - 250 - 40 = 210 | (ලකුණු 01 යි) |
| $Y_d$ | = | Y - 210 | |
| $Y_d$ | = | 1,000 - 210 = 790 | |

(ලකුණු 01 යි)

ආයෝජන වටිනාකම :


| | | | |
|---|---|---|---|
| Y | = | C + I + G + NX | |
| Y - I | = | C + G + NX | |
| I | = | Y - (C + G + NX) | (ලකුණු 01 යි) |
| I | = | 1,000 - (500 + 250 + 100) | |
| I | = | 1,000 - 850 = 150 | |
| I | = | 150 | |

(ලකුණු 01 යි)

**[විකල්ප පිළිතුරඃ කාන්දු වීම් - විදීම් ප්‍රවේශය**


| | | | |
|---|---|---|---|
| I + G + X | = | S + T + M | |
| I | = | S + (T-G) + (M-X) | |
| S | = | Yd - C = 790 - 500 = 290 | |
| T-G | = | 210 - 250 = -40 | |
| X-M | = | 100 | |
| M-X | = | -100 | |
| I | = | S + (T + G) + (M - X) | |
| I | = | 290 + (-40) + (-100) | |
| I | = | 290 - 140 | |
| I | = | 150 | (ලකුණු 01 යි) |

**05 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




05 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 28.17%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 35%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 33%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (iii) වන කොටස (අ), (ආ), (ඉ), (ඊ) වශයෙන් අනුකොටස් හතරකින් යුක්තය. මෙම ප්‍රශ්නය තුළ වැඩි ම පහසුතාව (iv) අනුකොටසට හිමිවන අතර, එහි පහසුතාව 66%කි. අඩු ම පහසුතාව ඇත්තේ (ii) කොටසට වන අතර, එහි පහසුතාව 22% කි.

* සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 28.17% තරම් පහළ අගයක් ගනු ලැබීය. තෝරා ගත් පිරිසට ද ඉහළ ලකුණු මට්ටමක් ලබා ගැනීම දුෂ්කර වී ඇත.

* I කොටසේ පහසුතාව 27% කි. මෙම කොටස මගින් විමසා ඇත්තේ එකතු කළ අගය සහ එය ගණනය කරන ආකාරය පිළිබඳව ය. එකතු කළ අගය නිර්වචනය කිරීමට පමණක් පිළිතුරු සීමා වීමත් සංඛ්‍යාත්මක උදාහරණ මගින් පැහැදිළි කිරීමක් නො කිරීමත් අපේක්ෂකයින් වැඩි කොටසක් අසාර්ථක පිළිතුරු සැපයීමට හේතු වී තිබුණි. ඇතැම් අපේක්ෂකයින් එකතු කළ අගය ගණනය කරන්නේ කෙසේද යන්නට එකතු කළ අගය = නිමැවුම - යෙදවුම පමණක් ලියා තිබුණි. එවැනි ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී සංකල්ප පැහැදිළි කිරීමටත් සංඛ්‍යාත්මකව ගණනය කිරීමටත් අපේක්ෂකයින් යොමු කළ යුතුය.

* II කොටසේ පහසුතාව 22% කි. මෙම කොටස මගින් විමසා ඇත්තේ සමාහාර ආදායමේ සංරචක කවරේද යන්නයි. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් අසාර්ථක පිළිතුරු සැපයීමට හේතු වී ඇත්තේ "සමාහාර ආදායම" යන්න නිවැරදිව අවබෝධ කර ගැනීමට අපහසු විම නිසාය. ඇතැම් අපේක්ෂකයින් සමාහාර ඉල්ලුම හා එහි සංරචක දක්වා තිබුණි. එම නිසා ප්‍රශ්නය හොඳින් කියවා නිවැරදිව අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට යොමුකළ යුතුය. මෙම සමාහාර ආදායම් සංරචක නිශ්චිතව නම් කිරීමට හැකි වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

* III කොටසේ (අ), (ආ), (ඉ), (ඊ) යනුවෙන් උප කොටස් හතරකි. අනු පිළිවෙළින් එම කොටස්වල පහසුතාව 50%, 51%, 54% හා 42% වශයෙන් විය. මෙම කොටස මගින් විමසා ඇත්තේ දළ දේශීය නිෂ්පාදනයට ඇතුළත් කර ගන්නා සහ ඇතුළත් කර නො ගන්නා ගනුදෙනු පිළිබඳවය. අපේක්ෂකයින්ගෙන් අඩක් පමණ නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමට අසමත් වී ඇත. ජාතික ගිණුම් පිළියෙල කිරීමේ දී ඇතුළත් කරන ගනුදෙනු හා ඇතුළත් නො කෙරෙන ගනුදෙනු පිළිබඳ දැනුම තහවුරු වන පරිදි අභ්‍යාස කරවිය යුතුය.

* IV කොටසේ පහසුතාව 66% කි. මෙම කොටස මගින් විමසන්නේ ආර්ථිකයක දෙන ලද සමාහාර විචල්‍යයන් ඇසුරින් සමතුලිත ජාතික ආදායම් මට්ටමේ වටිනාකම පිළිබඳවය. අපේක්ෂකයින් සැළකිය යුතු ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සපයා තිබීමෙන් පැහැදිළි වන්නේ අපේක්ෂකයින් තුළ උක්ත මාතෘකාව පිළිබඳ පිළිගත හැකි සාධනීය මට්ටමක් පවතින බවය. නමුත් තව දුරටත් මෙවැනි අභ්‍යාස කිරීමෙන් දුර්වලතා මග හරවා ගැනීමට යොමු කළ යුතුය.

* V කොටසෙහි පහසුතාව 42% කි. දී ඇති සාර්ව ආර්ථික දත්ත කීපයක් යොදා ගෙන වැය කළ හැකි ජාතික ආදායම හා ආයෝජනයේ වටිනාකම ඇස්තමේන්තු කිරීමට ගැටලුව යොමු වී තිබුණි. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක ගේ පිළිතුරු අසාර්ථක විය. ජාතික ආදායම හා වැය කළ හැකි ජාතික ආදායම ආදී සංකල්ප පිළිබඳ අවබෝධය වර්ධනය වන පරිදි සංඛ්‍යාත්මක අභ්‍යාසවල නිරත වීම වැදගත් වේ.

## "ආ" උප කොටස

## 06 ප්‍රශ්නය

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) මුදල් ප්‍රමාණවාදය සහ විනිමය සමීකරණය අතර වෙනස කුමක් ද? (ලකුණු 04 යි)

(ii) ශ්‍රී ලංකාවේ ජීවන වියදම් මිනුමක් වශයෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ඇති වාසි කවරේ ද? (ලකුණු 04 යි)

(iii) මිනිසුන් මුදල් ළඟ තබා ගන්නේ ඇයි? මිනිසුන් ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය කෙරෙහි ආදායම් මට්ටම කෙබඳු බලපෑමක් කරනු ලබයි ද? (ලකුණු 04 යි)

(iv) යම් කල්පිත ආර්ථිකයක, මුදල් සැපයුම (M) රුපි. බිලියන 3 600ක් ද, මුළු බැංකු තැන්පතු (D) රුපි. බිලියන 3 200ක් ද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් ද වන අතර, බැංකු සතුව අධි සංචිත නොමැති බව ද සලකන්න.

(අ) මෙම ආර්ථිකයේ මුදල් ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ මුදල් සැපයුම රුපි. මිලියන 100කින් අඩු කිරීමට මහ බැංකුව කුමක් කළ යුතු ද? (ලකුණු 02 යි)

(v) ශ්‍රී ලංකාවේ අන්තර් බැංකු ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතික පාලනය කිරීම සඳහා මහ බැංකුව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව මෙහෙය වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

06. (i) - විනිමය සමීකරණය වූ කලී නිර්වචනය කරන ආකාරයෙන් ම පූර්ණ සත්‍ය ප්‍රකාශනයකි. එය සමීකරණයක් නො ව අනන්‍යතාවයකි. එය $MV \equiv PT$ ලෙස දැක්විය හැකි ය.
$MV = PT$ විනිමය සමීකරණයෙන් MV යනු මුදල් විසින් ඉටු කරන ලද ගනුදෙනුවල වටිනාකමයි. PT යනු ආර්ථිකයේ මුළු ගනුදෙනුවල වටිනාකම යි. ඒ අනුව ඇත්තටම $MV = PT$ විය යුතු ම ය.

(ලකුණු 01යි)

- මුදල් ප්‍රමාණවාදය යනු විනිමය සමීකරණය පදනම් කර ගනිමින් මිල මට්ටම් හැසිරීම පිළිබඳව ඉදිරිපත් කරනු ලබන න්‍යායකි. මුදල් තොගය වෙනස් වීමත් මිල මට්ටම වෙනස් වීමත් අතර සෘජු සම්බන්ධයක් ඇති බව මෙම න්‍යාය පෙන්වා දෙයි. (ලකුණු 01යි)

- න්‍යාය ගොඩනැංවීම සඳහා උපකල්පන අවශ්‍ය වන බැවින්, විනිමය සමීකරණය තුළ ඇතැම් විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳ මෙම න්‍යාය උපකල්පන ඉදිරිපත් කරයි. ඒ අනුව සංසරණ ප්‍රවේගය (V) සහ ගනුදෙනු ප්‍රමාණය (T) බොහෝ සෙයින් නො වෙනස්ව පවතින්නේ යැයි උපකල්පනය කොට මුදල් තොගයට (M) සමානුපාතිකව මිල මට්ටම වෙනස්වන බව (P) මුදල් ප්‍රමාණවාදය ප්‍රකාශ කරයි. (ලකුණු 01යි)

- මේ අනුව විනිමය සමීකරණය පූර්ණ සත්‍යයක් වන අතර, මුදල් ප්‍රමාණවාදය හුදෙක් විනිමය සමීකරණය මත ගොඩ නංවන ලද න්‍යායකි. උපකල්පනවල නිරවද්‍යතාව මත එම න්‍යායේ වලංගුභාවය රඳා පවතී. (ලකුණු 01යි)

(ii) ජාතික පාරිභෝගික මිල දර්ශකයේ වාසි :

- ජාතික පාරිභෝගික මිල දර්ශකය ඉතා පුළුල් භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කරයි. ශ්‍රී ලංකාවේ පළාත් නවය ම ආවරණය කරමින් මිල ගණන් එකතු කර ගනු ලබන අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකය කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා විය.

- පරිභෝජන හැසිරීම පිළිබඳ පුළුල් නියෝජනයක් සපයයි. ජාතික පාරිභෝගික මිල දර්ශකය සපයනු ලබන්නේ, 2012/13 වර්ෂය තුළ මුළු දිවයින නියෝජනය කරමින් තෝරා ගනු ලැබූ නියැදියක් පදනම් කර ගනිමිනි.

- ඉතා මෑත කාලීන පදනම් වර්ෂයක් භාවිත කරයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කර ගනු ලැබුවේ 2006/07 වර්ෂය යි. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පදනම 2013 වර්ෂය යි.

- බර තැබීම් වඩාත් තාත්වික ය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ බර තැබීම් සකසා ගනු ලැබුවේ කොළඹ නාගරික ප්‍රදේශයේ කුටුම්භවල මුළු වියදමට සාපේක්ෂ වශයෙනි. එහෙත් ජාතික පාරිභෝගික මිල දර්ශකය බර තැබීම් සඳහා පදනම් කර ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ සියලුම කුටුම්බවල මුළු වියදමට සාපේක්ෂ වශයෙනි.

- පාරිභෝජන රටාව හඳුනා ගැනීමේ දී අවුරුද්දක් මුලුල්ලේ ම මුළු රටේ ම පරිභෝජන වියදම් අධ්‍යයනය කරනු ලැබූ නිසා නව දර්ශකයට වාරික වෙනස්කම් මැනවින් හඳුනා ගැනීමට ඉඩ සැලසී ඇත.

- දර්ශකය සඳහා පදනම් කරගත් පාරිභෝජන පැස විශාල ය. කාණ්ඩ 12කට අයත් භාණ්ඩ ගණ 105 ක් ඇතුළත් වේ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් වූයේ කාණ්ඩ 10 කට අයත් භාණ්ඩ ගණ 95ක් මත ය.

- මත්පැන් දුම්කොළ සහ මත්ද්‍රව්‍ය සඳහා කරනු ලබන වියදම් ද සැළකිල්ලට ගනිමින් වඩාත් තාත්වික පදනමකින් පරිභෝජන වියදම් හඳුනාගෙන ඇත. කොළඹ පාරිභෝගික මිල දර්ශකය තුළ මත්පැන්, දුම්කොළ සහ මත් ද්‍රව්‍ය සඳහා කරනු ලබන වියදම් අත් හැර දමා තිබුණි.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**

(ii) - ගනුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ (වත්කම්) චේතනාව

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)**

- ආදායම් මට්ටම සහ මුදල් ශේෂ සඳහා පවත්නා ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධයක් පවතී. ආදායම ඉහළ යන විට මුදල් ශේෂ සඳහා ඉල්ලුම වැඩි වන අතර, ආදායම පහළ යන විට මුදල් ශේෂ සඳහා ඉල්ලුම ද පහළ බසී.

**(ලකුණු 01 යි)**

(ii) (අ) මුදල් ගුණකය (m) $= \dfrac{m}{H} = \dfrac{\text{මුදල් තොගය}}{\text{අධිබල මුදල් (පදනම් මුදල්)}}$

**(ලකුණු 01 යි)**

- මුදල් තොගය (M) = 3,600
- අධිබල මුදල් (H) = $C_p + C_b$

$C_P$ = M - D = 3,600 - 3,200 = 400

$C_b$ = rD = 0.10 (3,200) = 320

H = 400 + 320 = 720

මුදල් ගුණකය (m) $\dfrac{3,600}{720} = 5$

**(ලකුණු 01 යි)**

(ආ) මුදල් සැපයුම මිලියන 100 කින් අඩු වේ.

$$(m) = \frac{M}{H}$$

$$H = \frac{M}{m}$$

$$\Delta M = 100$$

$$m = 5$$

$$H = 100/5 = 20$$

අධිබල මුදල් තොගය මිලියන 20 කින් අඩු කළ විට මුදල් තොගය මිලියන 100කින් අඩු වනු ඇත. **(ලකුණු 01 යි)**

(ii) - අන්තර් බැංකු ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළ සංවිධානය වී ඇත්තේ වාණිජ බැංකුවලට ඉතා කෙටි කාලීනව මුහුණ දීමට සිදුවන ද්‍රවශීලතා අවශ්‍යතා සහ සංචිත ඌනතා සපුරා ලීමට ය. එසේම මෙම වෙළෙඳපොළේ හට ගන්නා පොලී අනුපාතික වෙනස්වීම් ඉතා ඉක්මණින් මුදල් වෙළෙඳපොළේ අනිකුත් පොළී අනුපාතික කෙරෙහි බලපෑම් ඇති කරයි. එබැවින් මෙම වෙළෙඳපොළේ පොලී අනුපාතිකයන්ගේ අහිතකර උච්චාවචන වළක්වා ක්‍රමවත්ව සහ ස්ථාවරව පවත්වා ගැනීමට මහ බැංකුව කටයුතු කරයි. **(ලකුණු 01 යි)**

- මේ සඳහා මහ බැංකුව යොදාගෙන ඇති ක්‍රමවේදය වන්නේ ප්‍රතිපත්ති පොලී අනුපාතික යටතේ නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් සැපයීම යි. ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළේ පොලී අනුපාතිකයන්ගේ ඉහළ හා පහළ අගයන් තීරණය කරනු ලබන්නේ පිළිවෙළින් මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය විසිනි.


**(ලකුණු 01 යි)**

- ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා හිඟයක් නිසා පොලී අනුපාතික ඉහළ යාමේ ප්‍රවණතාවක් හට ගන්නා විට මහ බැංකුව විසින් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ ණය සැපයීම මගින් පොලී අනුපාතික ඉහළ යාමේ ප්‍රවණතාව වැළකී යනු ඇත.
**(ලකුණු 01 යි)**

- එසේ ම ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළෙහි අධි ද්‍රවශීල තත්වයක් ඇති වී පොලී අනුපාතික පහළ වැටීමේ ප්‍රවණතාවක් හටගත් විට, මහ බැංකුව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ අතිරික්ත ද්‍රවශීලතා ඉල්ලුම් කරනු ලබන අතර එමගින් පොලී අනුපාතික පහළ වැටීමේ නැඹුරුව වැළකී යනු ඇත.


**(ලකුණු 01 යි)**

**06 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




06 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 58.24%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 37%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 38%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 19%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් v ක් ඇති අතර (iii) කොටසෙහි පහසුතාව උපරිම වුව ද එහි පහසුතාව 79% කට සීමා වී ඇත. පහසුතාව අඩු ම අනු කොටස v වන අතර, එහි පහසුතාව 9% කි.

★ i මෙම කොටසෙහි පහසුතාව 33% කි. මෙම කොටස මගින් විමසන්නේ මුදල් ප්‍රමාණවාදය හා විනිමය සමීකරණය අතර වෙනසයි. මෙම කොටසෙහි පහසුතාව අඩු වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ මුදල් ප්‍රමාණ වාදයත් විනිමය සමීකරණයත් යන සංකල්ප දෙක වෙන් වෙන්ව නිර්වචනය කර ගැනීමට විභාග අපේක්ෂකයින් අපොහොසත් වීමයි. බොහෝ අපේක්ෂකයන් අවබෝධ කර ගෙන ඇත්තේ මුදල් ප්‍රමාණවාදය හා විනිමය සමීකරණය යන දෙක ම එකක් බවයි.

නමුත් මුදල් ප්‍රමාණවාදය හා විනිමය සමීකරණය එකක් නො වන බවත් මුදල් ප්‍රමාණවාදය මගින් ඉදිරිපත් කරන අදහස තහවුරු කිරීම සඳහා විනිමය සමීකරණය භාවිත කරන බවත් අපේක්ෂකයන්ට අවබෝධ කර දිය යුතුය.

★ ii මෙම කොටසෙහි පහසුතාව 49% කි. මෙම කොටසෙහි පහසුතාව අඩු වීමට හේතු වී ඇත්තේ ජීවන වියදමේ වෙනස්කම් මැනීම සඳහා හඳුන්වා දුන් නව මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය පිළිබඳව අපේක්ෂකයින් තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීමය. මහ බැංකු වාර්තාව මගින් මෙම දර්ශක දෙක අතර පුළුල් සංසන්දනයක් කර තිබූ නමුත් ඒ කෙරෙහි විභාග අපේක්ෂකයින්ගේ අවධානය යොමු වී ඇත්තේ මඳ වශයෙනි. මෙවැනි දර්ශක පිළිබඳව වාර්ෂික වාර්තා මගින් ඉදිරිපත් කරන තොරතුරු කෙරෙහි විභාග අපේක්ෂකයින්ගේ අවධානය යොමු කර විය යුතුය.

★ iii මෙම කොටසෙහි පහසුතාව 79% කි. මිනිසුන් මුදල් ළඟ තබා ගැනීමට බලපාන හේතු මෙමගින් විමසා තිබූ නිසා මෙය සාපේක්ෂව වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න කොටසක් වී ඇත.

★ iv (අ) මෙම කොටසෙහි පහසුතාව 35% කි. දෙන ලද තොරතුරු ඇසුරින් මුදල් ගුණකය ගණනය කිරීම අපේක්ෂා කර ඇත. පිළිතුර ගණනය කර ගැනීම සඳහා පදනම් මුදල් ගණනය කර ගැනීමටත් පදනම් මුදල් හා මුදල් සැපයුම අතර සබඳතාවය පිළිබඳ අවබෝධයක් තිබීම වැදගත් වේ. මෙහිදී මුදල් සැපයුමට අදාළ තොරතුරු ඇසුරෙන් පදනම් මුදල් ගණනය කර ගැනීම අපේක්ෂකයින්ට දුෂ්කර වී ඇත. එබැවින් මුදල් සැපයුම ඇසුරින් පදනම් මුදල් ගණනය කර ගැනීමට අවශ්‍ය දැනුම විභාග අපේක්ෂකයින්ට ලබා දිය යුතුය.

(ආ) මෙම කොටසෙහි පහසුතාව 9% කි. මෙහි පහසුතාව ඉතා අඩු මට්ටමක පැවතීමට හේතු වී ඇත්තේ (අ) කොටසට අදාළව පිළිතුරු ගණනය කර ගැනීම සඳහා විභාග අපේක්ෂකයින් දැක්වූ අසමත් භාවය යි. එවැනි ගණනය කිරීම්වලට අදාළ අභ්‍යාස කරවීමෙන් මෙවැනි ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් හුරු කළ හැකිය.

★ v මෙම කොටසෙහි පහසුතාව 27% කි. පහසුතාව අඩු විම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ නිත්‍ය පොලී අනුපාත කොරිඩෝව පිළිබඳව අපේක්ෂකයින් තුළ අවබෝධය ප්‍රමාණවත් නො වීමයි. නිත්‍ය පොලී අනුපාත කොරිඩෝව හඳුන්වා දීම ශ්‍රී ලංකා මහ බැංකුව මෑත කාලීනව මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගවලදී ගන්නා ලද වැදගත් පියවරකි. 2013 මහ බැංකු වාර්තාව මගින් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර දක්වා ඇති බැවින් වාර්ෂික වාර්තා මගින් ඉදිරිපත් කරන තොරතුරු ගවේෂණය කිරීමට අපේක්ෂකයින් යොමු කළ යුතුය.

## 07 ප්‍රශ්නය

**7.** (i) ආර්ථිකයක සම්පත් බෙදා වෙන්කිරීම අකාර්යක්ෂම කරවීමෙහිලා, බාහිරතා බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. යෝග්‍ය ප්‍රස්තාර සටහන් මගින් ඔබේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) පොදු භාණ්ඩ යනු කවරේ ද? එබඳු භාණ්ඩ වෙළෙඳපොළ මගින් පහසුවෙන් සැපයිය **නොහැක්කේ** මන්ද? (ලකුණු 04 යි)

(iii) බදු අය කිරීමේ අරමුණු කවරේ ද? (ලකුණු 04 යි)

(iv) යහපත් බදු ක්‍රමයක දක්නට ඇති හිතකර ගුණාංග සඳහන් කරන්න. (ලකුණු 04 යි)


(v) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

07. (i) - බාහිරතා ධනාත්මක හෝ සෘණාත්මක හෝ කවර ස්වරූපයෙන් ගනු ලැබුවද, ඒවායේ ප්‍රතිඵලය වන්නේ සමාජ පිරිවැය සහ පෞද්ගලික පිරිවැය අතරත්, සමාජ ප්‍රතිලාභ සහ පෞද්ගලික ප්‍රතිලාභ අතරත් නො ගැලපීමක් ඇති කිරීම යි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කිසියම් භාණ්ඩයක් වෙළෙඳපොළ තුළ සමාජයීය වශයෙන් ප්‍රශස්ත ප්‍රමාණයට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් නිෂ්පාදනය කරනු ඇත. නො එසේ නම් සමාජයීය වශයෙන් ප්‍රශස්ත ප්‍රමාණයට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් පරිභෝජනය කරනු ඇත. (ලකුණු 01යි)

- සමාජය තුළ සම්පත් ප්‍රශස්ත ලෙස බෙදා වෙන් කරනුයේ, ආන්තික සමාජ පිරිවැය ආන්තික සමාජ ප්‍රතිලාභවලට සමාන වන ලෙස නිෂ්පාදනය සිදු වේ නම් ය. නිෂ්පාදන ක්‍රියාවලියෙහි සෘණ බාහිරතා දක්නට ඇති විට, ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යනු ඇත. එහි දී නිදහස් වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් ප්‍රමාණය, සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් ප්‍රමාණය ඉක්මවා යනු ඇත. එසේම, පරිභෝජනයේ දී ධනාත්මක බාහිරතා පවත්නා විට සමාජ ආන්තික ප්‍රතිලාභ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යනු ඇත. එහි දී නිදහස් වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටමට වඩා අඩු ප්‍රමාණයක් වනු ඇත. (ලකුණු 01යි)


නිෂ්පාදනයේ සෘණ බාහිරතා:




$Q_S$ - සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම

$Q_P$ - වෙළෙඳපොළ සමතුලිත නිමැවුම


පරිභෝජනයේ සෘණ බාහිරතා:




$Q_S$ - සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම


$Q_P$ - වෙළෙඳපොළ සමතුලිත නිමැවුම

නිෂ්පාදනයේ ධන බාහිරතා:




$Q_S$ - සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම
$Q_P$ - වෙළෙඳපොළ සමතුලිත නිමැවුම

පරිභෝජනයේ ධන බාහිරතා:




$Q_S$ - සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම
$Q_P$ - වෙළෙඳපොළ සමතුලිත නිමැවුම

**(ඕනෑම නිවැරදි ප්‍රස්තාරයකට ලකුණු 02යි)**

(ii) - පොදු භාණ්ඩයක් යන්නෙන් අදහස් කරන්නේ පහත සඳහන් ලක්ෂණ දෙකෙන් සමන්විත භාණ්ඩයකි. **(ලකුණු 01යි)**

- පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති වීම: මින් අදහස් වන්නේ එක් අයෙකුගේ පරිභෝජනය නිසා තවත් අයෙකුට පරිභෝජනය කිරීමේ අවස්ථාව අහිමි නො වේය යන්න යි. අතිරේක පුද්ගලයෙකුට භාණ්ඩ සැපයීමේ ආන්තික පිරිවැය ශුන්‍ය වේ. 'සාමූහික පරිභෝජනය' ලෙස ද මෙය හැඳින්විය හැකිය.

**(ලකුණු 01යි)**

- පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි වීම: මින් අදහස් වන්නේ මිලක් ගෙවීමට සූදානම් අයට පමණක් පරිභෝජනය සීමා කළ නො හැකි වීම ය. මිලක් නො ගෙවන අය පරිභෝජනයෙන් වැළැක්විය නො හැකි ය. මෙය Free - rider ගැටලුව ලෙසද හැඳින් වේ.

**(ලකුණු 01යි)**

- සාමූහික පරිභෝජනය සහ මිලක් නො ගෙවන්නන් පරිභෝජනයෙන් බැහැර කළ නො හැකි වීම පොදු භාණ්ඩවල මූලික ලක්ෂණ වන බැවින්, වෙළෙඳපොළ මගින් ඒවා සැපයිය නො හැක. ලාභ ඉපැයීම් අරමුණු කරගෙන නිෂ්පාදනයේ නිරතව සිටින වෙළෙඳපොළ සැපයුම්කරුවෝ එවැනි භාණ්ඩ සැපයීමට ඉදිරිපත් නො වෙති.

**(ලකුණු 02යි)**

(iii) - ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය ඉහළ නැංවීම
- පූර්ණ සේවා නියුක්තිය
- මිල ස්ථායීතාව
- චක්‍රීය උච්චාවචන පාලනය කිරීම
- ගෙවුම් ශේෂ ගැටලු අඩු කර ගැනීම
- ආදායම් සහ ධන ව්‍යාප්තියේ විෂමතා අඩු කිරීම
- පොදු භාණ්ඩ හා ශුභ සාධන භාණ්ඩ සැපයීම

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**


(iv) - සාධාරණත්වය
- නිශ්චිතභාවය
- පහසුව
- පිරිමැසුම් සහිත බව
- මධ්‍යස්ත බව
- සරළ බව
- නම්‍යශීලී බව

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**

(v) - භාණ්ඩ හා සේවා සඳහා වියදම්
- පොලී ගෙවීම්
- සංක්‍රාම


**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)**

**07 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




07 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 89.49%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 20%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් v ක් ඇති අතර iv කොටස පහසු ම කොටස වී ඇත. එහි පහසුතාව 68%කි. පහසුතාව අඩු ම කොටස i වී ඇති අතර, එහි පහසුතාව 37%කි. ii, iii, v කොටස්වල පහසුතා පිළිවෙළින් 59%, 45% සහ 60% වේ.

★ I කොටසෙහි පහසුතාව 37% කි. බාහිරතා ධනාත්මක හෝ සෘණාත්මක හෝ කවර ස්වරූපයක් ගනු ලැබුව ද එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ ප්‍රතිලාභ සහ පෞද්ගලික ප්‍රතිලාභ අතරත්, සමාජ පිරිවැය සහ පෞද්ගලික පිරිවැය අතරත් වෙනසක් ඇති වීමෙන් සිදුවන අධි නිෂ්පාදනය හෝ ඌන නිෂ්පාදනය හඳුනා ගැනීමට අපේක්ෂකයින්ට දුෂ්කරතාවක් පැවතුණු බව පෙනේ. මෙම තත්වයන් හඳුනාගෙන ප්‍රස්තාර මගින් නිරූපණය කිරීමේ දුෂ්කරතාවයක් ද පවතී. එම නිසා ආන්තික සමාජ පිරිවැය ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යන විට අධි නිෂ්පාදනය ඇතිවන ආකාරයත්, සමාජ ආන්තික ප්‍රතිලාභ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යන විට ඌන නිෂ්පාදනයක් ඇතිවන ආකාරයත් පිළිබඳ දැනුම හා විශ්ලේෂණ කුසලතා සිසුන් තුළ වර්ධනය කළ යුතුය.

බාහිරතා නිසා ඌන හෝ අධි නිෂ්පාදනයක් හට ගන්නා බවත්, සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමේ ලා සමාජ පිරිවැය හා ප්‍රතිලාභ සැලකිල්ලට ගත යුතු බවත් පැහැදිලි කර නො තිබීම නිසා මුළු ලකුණු ලබා ගැනීමට අසමත් වී ඇත. පිළිතුරක් මැනවින් සංවිධානය කර ගන්නා ආකාරය පිළිබඳව අපේක්ෂකයින් දැනුවත් කළ යුතුය.

★ II කොටසෙහි පහසුතාව 59% කි. පොදු භාණ්ඩයක් නිවැරදි ලෙස හඳුනා ගත්ත ද, වෙළෙඳපොළ මගින් ඒවා සැපයිය නො හැක්කේ කුමක් නිසාද යන්න පිළිබඳව නිවැරදි අවබෝධයක් අපේක්ෂකයින් වැඩි දෙනෙකුට නො පැවතුන බව පෙනේ. ලාභ ඉපයීම් අරමුණු කර ගන්නා වෙළෙඳපොළ ආර්ථිකයක් පොදු භාණ්ඩ නිෂ්පාදනය නො කරන්නේ ඇයිද යන්න අවධාරණය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

★ III කොටසෙහි පහසුතාව 45% කි. බදු අය කිරීමේ අරමුණු සහ බදු මූලධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයින් තුළ නො තිබුණි. එවැනි විෂය කරුණු පිළිබඳ දැනුම හා අවබෝධය සංවර්ධනය කළ යුතුය.

★ IV කොටසෙහි පහසුතාව 68% කි. යහපත් බදු ක්‍රමයක මූලධර්ම අපේක්ෂකයින් බොහෝ දෙනෙක් හඳුනා ගෙන තිබුණි. එහෙත් හිතකර ගුණාංග ලෙස ප්‍රශ්නය යොමු කර තිබූ නිසා නිශ්චිතව පිළිතුර ඉදිරිපත් කිරීමට නො හැකි වී ඇත. එම නිසා අදාළ මාතෘකාවට අයත් විෂය කරුණු විමසිය හැකි විකල්ප ක්‍රම හා ඊට අදාළ පිළිතුරු සැපයීමේ දී සැළකිළිමත් විය යුතු කරුණු පිළිබඳ දැනුම අපේක්ෂකයින් තුළ වර්ධනය කළ යුතුය.

★ V කොටසෙහි පහසුතාව 60% කි. රාජ්‍ය වියදමේ ආර්ථික වර්ගීකරණය පිළිබඳ මනා අවබෝධයක් බොහෝ අපේක්ෂකයන් තුළ නොමැති බව පෙනී යයි. රාජ්‍ය වියදම් වර්ගීකරණය පිළිබඳ නිශ්චිත දැනුමක් ලැබෙන ආකාරයට ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. තවද මහ බැංකු වාර්තාවේ ඇති අදාළ විෂය කොටස් කියවීමට අපේක්ෂකයින් නැඹුරු කළ යුතුය.

## 08 ප්‍රශ්නය

8. (i) සාපේක්ෂ වාසිය සහ නිරපේක්ෂ වාසිය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(ii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන ඉපැයීම්වල මන්දගාමී වර්ධනයට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාව වර්තමානයේ කලාපීය සහ ද්විපාර්ශ්වීය වශයෙන් ඇති කරගෙන ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගනුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි ඔබ වාර්තා කරන්නේ කෙසේ ද?

(අ) චීන ආයෝජකයකු විසින් ඩොලර් මිලියන 10ක කොටස් කොළඹ සුරැකුම්පත් හුවමාරුවෙන් මිලයට ගැනීම

(ආ) මැදපෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක් ඩොලර් 500ක මුදලක්, ලංකාවේ සිටින තම දෙමාපියන් වෙත එවීම

(ඉ) ශ්‍රී ලාංකික බැංකුවක් විදේශීය මූල්‍ය වෙළෙඳපොළවල පිළිණපත් අලෙවිකොට, ඩොලර් මිලියන 40ක් ලබා ගැනීම

(ඊ) ලෝකයේ ශීඝ්‍රයෙන් අලෙවි වන පොතක් පරිවර්තනය කොට ශ්‍රී ලංකාවේ අලෙවි කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ ප්‍රකාශන සමාගමක් ඇමෙරිකානු ප්‍රකාශන සමාගමකට ඩොලර් 5 000ක් ගෙවා එහි ප්‍රකාශන අයිතිය ලබා ගැනීම (ලකුණු 04 යි)

(v) පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය, ඇමෙරිකානු ඩොලර්වලින් තීරණය වන ආකාරය පෙන්නුම් කිරීමට උචිත ප්‍රස්තාර සටහනක් අඳින්න. මෙම විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්លුම් වක්‍රය පහළට සහ සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

08. (i) - කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමේලා ආර්ථික ඒකකයකට (රටකට, පුද්ගලයකුට, හෝ ආයතනයකට) තවත් ආර්ථික ඒකකයකට සාපේක්ෂව එම භාණ්ඩය හෝ සේවාව අඩු පිරිවැයක් සහිතව (අඩු සම්පත් ප්‍රමාණයක් කැපකොට) හෝ වැඩි ඵලදාවක් සහිතව (දෙන ලද සම්පත් ප්‍රමාණයකින් වැඩි භාණ්ඩ හා සේවා ඒකක ප්‍රමාණයක් ලබා ගැනීම) නිෂ්පාදනය කළ හැකි තත්වය නිරපේක්ෂ වාසියක් ලෙස අදහස් කෙරේ.

(ලකුණු 02යි)

- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමේ දී ආර්ථික ඒකකයක් තවත් ආර්ථික ඒකකයකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයක් (එක් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කිරීම සඳහා තවත් භාණ්ඩයකින් කැප කිරීමට සිදුවන ප්‍රමාණය අඩු වීම) සහිතව එම භාණ්ඩය හෝ සේවාව නිෂ්පාදනය කළ හැකි නම් එම තත්වය සාපේක්ෂ වාසියක් ලෙස අදහස් කෙරේ.

(ලකුණු 02යි)

(ii) - ගෝලීය ඉල්ලුම සහ ගෝලීය මිල ගණන් පහළ වැටීම නිසා පොල් නිෂ්පාදනය හා කුළු බඩු හැරුණු විට අනිකුත් ප්‍රධාන කෘෂිකර්මික නිෂ්පාදනයන්හි අපනයන ඉපැයීම් මෑත වර්ෂවල පහළ වැටෙමින් පවතී.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් ඇති රටවල පවත්නා අහිතකර භූ දේශපාලනික වෙනස්කම් (Geopolitical developments) උදා: මැද පෙරදිග යුද ගැටුම්; ඉරානය මත ඇමෙරිකානු සම්බාධක පැනවීම.

- ගෝලීය තේ හා රබර් මිල පහළ වැටීම: ප්‍රධාන අපනයනකරුවන්ගේ ආර්ථිකයන්හි පසුබැසීම්, කෘත්‍රිම රබර් මිල පහළ වැටීම

- ගෝලීය ඛණිජ තෙල් මිල සීග්‍රයෙන් පහළ වැටීම නිසා ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රධාන අපනයනකරුවන් (මැදපෙරදිග, රුසියාව) ගේ ආර්ථික බිඳ වැටීම්.

- චීන ආර්ථිකයේ මන්දගාමී වර්ධන ප්‍රවණතා නිසා ගෝලීය ආර්ථික පසුබැසීම් ශක්තිමත් වීම.

- ගෝලීය ආර්ථික පසුබැසීම් තත්වයක් තුළ ශ්‍රී ලංකාවේ අපනයන ගැනුම්කරුවන්ගේ මුදල් ඒකක ක්ෂය වීම නිසා අපනයන ඉල්ලුම අධෛර්යමත් වීම.

- යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට එරෙහිව, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය අත් හිටුවීමට කටයුතු කිරීම.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 04කට ලකුණු 04යි)**

(iii) - කලාපීය නිදහස් ගිවිසුම්:

- දකුණු ආසියානු නිදහස් ගිවිසුම (SAFTA) **(ලකුණු 01යි)**
- ආසියා - ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA) **(ලකුණු 01යි)**

- ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම්:

- ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) **(ලකුණු 01යි)**
- පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA) **(ලකුණු 01යි)**

(iv) (අ) මූල්‍ය ගිණුමේ විවිධ ආයෝජන (කළඹ ආයෝජන)ගිණුම බැර;
මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු ගිණුම හර


(ආ) ජංගම ගිණුමේ ද්විතීය ආදායම් ගිණුම බැර;
මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු ගිණුම හර

(ඉ) මූල්‍ය ගිණුමේ විවිධ ආයෝජන (කළඹ ආයෝජන)ගිණුම බැර;
මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු ගිණුම හර

(ඊ) ප්‍රාග්ධන ගිණුම හර;
මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු ගිණුම බැර

**(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 04යි)**

(v) (අ) රුපියලේ බාහිර අගය ඇමෙරිකානු ඩොලර්වලින් තීරණය වන ආකාරයට අදාළ ප්‍රස්තාරය




**(ප්‍රස්තාරයේ තිරස් අක්ෂයෙහි හුවමාරු කෙරෙන රුපියල් ද ප්‍රස්තාරයෙහි සිරස් අක්ෂයෙහි රුපියලේ ඩොලර් අගයද සඳහන් කොට ඇති නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 02යි)**


- රුපියලේ ඩොලර් අගය තීරණය වන විනිමය වෙළෙඳපොළෙහි හුවමාරුවන්නේ ඩොලර් සහ රුපියල් ය. මෙහි ඉල්ලුම් වක්‍රය පෙන්නුම් කරනුයේ රුපියල්වලට කරන ඉල්ලුම යි. එබැවින් එය නිරූපණය කරන්නේ ශ්‍රී ලංකාවේ අපනයන මිල දී ගන්නන්ගේ සහ ශ්‍රී ලංකාවට ප්‍රාග්ධනය රැගෙන එන්නන්ගේ ඉල්ලුම යි. රුපියල් ඩොලර් අගය අඩු වෙත්ම, රුපියල සාපේක්ෂව ලාභ වන නිසා රුපියලට විදේශිකයන්ගේ ඉල්ලුම වැඩි වේ. රුපියලේ ඩොලර් අගය ඉහළ යත්ම රුපියල සාපේක්ෂව මිල අධික වීම නිසා රුපියල් සඳහා ඉල්ලුම අඩු වේ. මේ නිසා ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළ බසී.

**(ලකුණු 01යි)**


- විනිමය වෙළෙඳපොළේ රුපියල් සැපයුම් වක්‍රය නිරූපණය කරනුයේ ශ්‍රී ලංකාව ආනයනය සඳහා සහ පිටතට ප්‍රාග්ධනය ගෙන යාම සඳහා කරන ඉල්ලුම යි. මෙහි දී රුපියල් විකුණා ඩොලර් ලබා ගනී. රුපියලේ ඩොලර් අගය පහළ බසින විට, ආනයන සාපේක්ෂව මිල අධික වන බැවින් ආනයන ඉල්ලුම අධෛර්යමත් වේ. එබැවින් වෙළෙඳපොළේ ඩොලර් මිල දී ගැනීමට කරනු ලබන රුපියල් සැපයුම අඩු වේ. මේ අනුව රුපියල් සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන රේඛාවකි.

**(ලකුණු 01යි)**

**08 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




08 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 36%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 62%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් v ක් ඇති අතර i කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 59%කි. පහසුතාව අඩු ම කොටස ii වී ඇත. iv කොටසෙහි "ඉ" හා "ඊ" යන කොටස්වල පහසුතාව අඩු මට්ටමක පවතී. එය පිළිවෙළින් 11% හා 11% වේ.

* I කොටසේ පහසුතාව 59% කි. මෙම කොටස මගින් විමසන්නේ විදේශ වෙළෙඳාම හා සම්බන්ධ නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය අතර වෙනසය. මෙම ගැටලුව පෙර වසරවලදී ද විමසා තිබූ නමුත් සැළකිය යුතු සිසු පිරිසක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. එයින් පැහැදිළි වන්නේ පසුගිය විභාගවලදී මෙම සංකල්ප පිළිබඳව ලබා දුන් උපදෙස් විභාග අපේක්ෂකයන්ගේ අවධානයට යොමු වී නොමැති බවයි. පසුගිය ප්‍රශ්න පත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

* II වන කොටසේ පහසුතාව 10% කි. අපේක්ෂකයින් ඉතා ඉහළ පිරිසක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. ඊට බලපා ඇත්තේ ප්‍රශ්නයෙන් විමසා ඇති ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන ඉපැයීම්වල මන්දගාමී වර්ධනයට හේතු පිළිබඳ මෑත කාලීන උපනති හා ඊට හේතු විස්තර කිරීමේ නො හැකියාවයි. මහ බැංකු වාර්තාව පරිශීලනයට යොමුවීමෙන් මේ පිළිබඳ කාලීන දැනුම වර්ධනය කර ගත හැකිය.

* III වන කොටසේ පහසුතාව 32% කි. මෙම කොටස මගින් විමසා ඇත්තේ ශ්‍රී ලංකාව වර්තමානයේ කලාපීය සහ ද්විපාර්ශ්වීය වශයෙන් ඇති කර ගෙන තිබෙන ද්විපාර්ශ්වීය හා කලාපීය නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳව ය. අපේක්ෂකයින් අතුරින් විශාල ප්‍රතිශතයක් සාර්ථක පිළිතුරු සැපයීමට අපොහොසත් වීම මගින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධ කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් බව ප්‍රමාණවත් නැති බවය. එබැවින් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුයි.

* IV වන කොටසේ (අ), (ආ), (ඉ), (ඊ) අනු කොටස්වල පහසුතාව අනු පිළිවෙළින් 13%, 21%, 11%, 11% කි. මෙම කොටස මගින් විමසා ඇත්තේ දෙන ලද විදේශ ගනුදෙනු කීපයක් ගෙවුම් ශේෂ ලේඛනයේ කවර ගිණුම්වල හර හා බැර සටහන් ලෙස වාර්තා කරන්නේ කෙසේ ද යන්න යි. මෙම කොටස අපේක්ෂකයින් අතර සැළකිය යුතු දුෂ්කරතාවයකට පත් වීම මගින් නිරූපණය කරන්නේ ගෙවුම් ශේෂ ලේඛනයක ගනුදෙනු හර සහ බැර වශයෙන් සටහන් කිරීම පිළිබඳ නිවැරදි දැනුම අපේක්ෂකයින් සතු නො වන බවයි. ගෙවුම් ශේෂ ලේඛනයක සියලු ම ගිණුම්වල වාර්තා කරන ගනුදෙනු රැසක් ද්විත්ව සටහන් මූලධර්මය මත වාර්තා කිරීමට අභ්‍යාස කරවීම මගින් අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය සංවර්ධනය කළ යුතුයි.

* V වන කොටසේ පහසුතාව 16% කි. මෙම කොටස මගින් විමසා ඇත්තේ ප්‍රමාණ කියවීමේ ක්‍රමයට නම්‍ය විදේශ විනිමය අනුපාතිකය නිර්ණය වන ආකාරයයි. එනම් රුපියලේ බාහිර අගය ඇමරිකානු ඩොලර් වලින් තීරණය වන ආකාරය සහ විදේශ විනිමය වෙළෙඳ පොළේ ඉල්ලුම් වක්‍රය පහළටත් සැපයුම් වක්‍රය ඉහළටත් බෑවුම් වන්නේ මක් නිසාද යන්නයි. විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුම් වක්‍රය සහ සැපයුම් වක්‍රය බෑවුම් වන දිශාවත් ඊට හේතු පිළිබඳවත් නිවැරදි දැනුම අපේක්ෂකයින් තුළ නොමැති වීම ගැටලුවට අපේක්ෂකයින් සැපයූ පිළිතුරුවල සාර්ථකත්වය අවම වීමට හේතු විය. ලකුණු ලබා දීමේ පටිපාටියෙහි රුපියල් ඉල්ලුම් වක්‍රය පහළටත් සැපයුම් වක්‍රය ඉහළටත් බෑවුම් වීමට හේතු විස්තරාත්මකව දක්වා ඇත. එය පරිශීලනය කිරීම මගින් මෙම සංකල්පය පිළිබඳව විභාග අපේක්ෂකයන්ගේ දැනුම සංවර්ධනය කළ යුතුය.

## 09 ප්‍රශ්නය

**9.** (i) සංවර්ධනය පිළිබඳ දර්ශකයක් වශයෙන් මානව සංවර්ධන දර්ශකය, ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායමට වඩා හොඳ දර්ශකයක් ලෙස සලකනු ලබන්නේ ඇයි? (ලකුණු 05 යි)

(ii) දිගු කාලීන ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම පිණිස ආණ්ඩුවට ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(iii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම් පහළ වැටීමට දායක වී ඇති වැදගත් කරුණු කවරේ ද? (ලකුණු 05 යි)

(iv) "රාජ්‍ය ණය මගින් මූල්‍යනය කෙරෙන, වෙළෙඳ නොවන අංශ පදනම් කරගත් වෘද්ධි උපායමාර්ගයක්, ආර්ථිකය දිගු කාලීන තිරසාර වෘද්ධියක් කරා ගෙනයනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි ය." පසුගිය පස් වසර තුළ ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇසුරෙන් මෙම ප්‍රකාශයේ වලංගුභාවය අගයන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

09. (i) ආර්ථික සංවර්ධනය මිනුම් කිරීමේ දී ප්‍රතිශීර්ෂ ආදායමට වඩා මානව සංවර්ධන දර්ශකය යෝග්‍ය වනුයේ පහත සඳහන් හේතු නිසා ය.

- මූල්‍ය සමාහාර අගයක් වන ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම, සංවර්ධන ක්‍රියාවලියේ ඉතා පටු පැතිකඩක් පමණක් නිරූපණය කරයි. එහෙත් මානව සංවර්ධන දර්ශකය අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය, ජීවන තත්වය යන සංරචක රාශියක් කැටි කර දක්වන සංයුක්ත මිනුමක් වේ.
- ප්‍රති ශීර්ෂ ආදායම් මට්ටම සැසඳීම මගින් රටවල් අතර ජීවන මට්ටම්වල පවත්නා වෙනස්කම් පිළිබඳ එළැඹෙන නිගමනය නො මග යවන සුළු වේ. ඉහළ ප්‍රතිශීර්ෂ ආදායම් ඇති රටවල ජීවන තත්වය අවශ්‍යයෙන් ම පහළ ආදායම් ඇති රටවල ජීවන තත්වයට වඩා උසස් යයි අදහස් නො වේ. ජීවන තත්වය නිරූපණය කෙරෙන ප්‍රධාන විචල්‍යයන් ප්‍රති ශීර්ෂ ආදායමෙහි අන්තර්ගත නො වේ.
- මිනිසාට තේරීම් කිරීමට ඇති නිදහස පුළුල් කිරීම මානව සංවර්ධනයේ අත්‍යවශ්‍ය ලක්ෂණයකි. ප්‍රති ශීර්ෂ ආදායම මගින් මෙම පැතිකඩ නිරූපණය නො කෙරේ.

**(එක් කරුණකට ලකුණු 02බැගින් ලකුණු 05යි.)**

(ii)
- යටිතල පහසුකම් සංවර්ධනය.
- මානව ප්‍රාග්ධනය සංවර්ධනයෙහිලා (අධ්‍යාපනය හා පුහුණුව) ආයෝජනය කිරීම.
- සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන (R & D) ක්ෂේත්‍රයේ ආයෝජනය ඉහළ නැංවීම.
- සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම.
- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) ප්‍රවර්ධනය කිරීම.
- අපනයන විවිධාංගීකරණය කිරීම.
- නම්‍යශීලී ශ්‍රම වෙළෙඳපොළක් බිහි කිරීම.
- වෘත්තීය සමිති සමග යහපත් සම්බන්ධතා ගොඩනගා ගැනීම.
- වෙළෙඳ ගිවිසුම් මගින් ගෝලීය නිෂ්පාදන ජාල සමග අන්තර්ග්‍රහණය වීම.
- යහ පාලනය ශක්තිමත් කිරීම.

**(එක් කරුණකට ලකුණු 01බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05යි)**

(iii)
- සාපේක්ෂ වශයෙන් ඉහළ ආර්ථික වෘද්ධි මට්ටමක් පවත්වාගෙන යාම: රාජ්‍ය ආයෝජන ඇතුළු දේශීය වෘද්ධි ක්‍රියාවලිය කර්මාන්ත හා සේවා අංශවල ශ්‍රම ඉල්ලුම වැඩි කළේය.
- කෘෂිකාර්මික අංශය වෙතින් ඵලදායි අංශ කරා ආර්ථිකයේ ව්‍යුහමය පරිවර්තනයක් සෙමින් නමුත් ක්‍රමානුකූලව සිදු වීම:මේ මගින් ඵලදායිතාව ඉහළ යාමක් හට ගෙන ඇත.
- නාගරීකරණයේ සීඝ්‍ර වර්ධනය - මහනුවර, කොළඹ, ගාල්ල, වැනි ප්‍රධාන නගර කේන්ද්‍ර කරගත් පුළුල් නාගරීකරණ ක්‍රියාවලිය;එසේ ම ත්‍රිකුණාමලය, මඩකලපුව - අක්කරපත්තු සහ යාපනය වැනි නාගරික මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගත් සංවර්ධන ක්‍රියාවලිය.

- ප්‍රාථමික භාණ්ඩ මිල උත්පාතය (commodity boom)ඃ තේ සහ රබර් මිල ඉහළ යාම.
- විදේශ ප්‍රේෂණ ඉහළ යාම.
- වැඩ කරන වයසේ ජනගහනය ඉහළ යාම නිසා ශ්‍රමික ඉපයීම් වැඩි වීම.
- දේශීය වශයෙන් සමාහාර ඉල්ලුම විශාල වශයෙන් ඉහළ යාම මඟින් ආර්ථික වෘද්ධියට දායක වීම.
- උතුරු නැගෙනහිර පළාත්වල යුද ගැටුම් නිමා වීමත් සමඟ ආර්ථික ක්‍රියාවලිය සක්‍රීය වීම.
- ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ප්‍රවර්ධනය නිසා කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ගේ වර්ධනය.
- පසුගිය දස වසර තුළ දරිද්‍රතාවය අඩු විමට බලපා ඇති ප්‍රධාන සාධකයක් වූයේ සේවා නියුක්තිය හෝ සංක්‍රාම වැඩි වීම නො ව ශ්‍රමික ආදායම් ඉහළ යාම ය. කෘෂිකාර්මික අංශය ඇතුළු සියලු ම ක්ෂේත්‍රයන්ගේ මූර්ත වැටුප් ඉහළ ගියේය. 2006- 2012/13 කාලය තුළ කෘෂිකාර්මික අංශයේ මූර්ත වැටුප් 5.7% වේගයකින් ද, කාර්මික අංශයේ 3.6% කින් ද, සේවා අංශයේ 3.1% කින් ද, ඉහළ ගොස් ඇත.
- ග්‍රාමීය ආර්ථික සංවර්ධන වැඩ සටහන්ඃ උදා-ඃ ගම නැගුම, දිවි නැගුම


**(එක් කරුණකට ලකුණු 01බැගින් ලකුණු 05යි)**

(iv) - ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධියේ මූලාශ්‍ර වශයෙන් මෑත කාලයේ දී වඩාත් ප්‍රචලිත ස්ථාන හිමි කර ගෙන ඇත්තේ වෙළෙඳ නො වන දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වේ. 2009 - 2014 කාලය තුළ ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 45% කින් වැඩි වූ අතර, එම වර්ධනය සඳහා ඉදිකිරීම්, ප්‍රවාහනය, වෙළෙඳාම හා මූල්‍ය යන වෙළෙඳ නො වන ක්ෂෙත්‍රවල දායකත්වය 50% ක් පමණ විය. එසේම රාජ්‍ය ආයෝජන ප්‍රමුඛස්ථානය ගනිමින් සිදු වූ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලිය මූල්‍යනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ ණය ලබා ගැනීමට සිදුව ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් විදේශ ණය 2006 වර්ෂයේ දී 42.4% ක් වූ අතර, 2014 වර්ෂය වන විට එය 57.4% ක් දක්වා සීඝ්‍රයෙන් ඉහළ ගියේ ය.

- වෙළෙඳ නො වන ක්ෂේත්‍ර මත සංකේන්ද්‍රණය වූ වෘද්ධි ක්‍රියාවලිය දිගු කාලීන වශයෙන් පවත්වාගෙන යාම අතිශයින් අසීරු වේ. විදේශ ණය මත රාජ්‍ය ආයෝජනය රඳා පවත්නා බැවින්, වර්ධනය වන ණය බර රාජ්‍ය මූල්‍ය අස්ථායීතාව වර්ධනය කරයි. එම වෘද්ධි ක්‍රියාවලිය මඟින් ණය ආපසු ගෙවීමට හැකියාව ලබා දෙන ප්‍රතිලාභ ජනනය නො කෙරෙන බැවින් වෘද්ධි ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම දුෂ්කර වේ.
- වෙළෙඳ නො වන ක්ෂේත්‍ර මත ආර්ථික ක්‍රියාවලිය සංකේන්ද්‍රණය වීම, ගෙවුම් ශේෂ අර්බුදවලට ද ඍජුව බලපා තිබේ. භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍ර, විශේෂයෙන් අපනයන නිෂ්පාදන අංශවල වර්ධනයකින් තොරව සිදුවන ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය, ගෙවුම් ශේෂ පීඩනවලට දායක වේ. විදේශ ණය සහ පොලිය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් විදේශීය විනිමය ප්‍රමාණයක් රැස් කර ගත හැකි වනුයේ භාණ්ඩ වෙළෙඳ ක්ෂේත්‍ර ශක්තිමත් කර ගැනීම මඟිනි. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය දිගින් දිගට ම පසු බෑමට ලක් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් අපනයනවල වටිනාකම 2000 වර්ෂයේ දී 33% ක් වූ අතර 2014 වන විට එය 15% ක් දක්වා අඩු විය. අපනයන ව්‍යුහයේ සැලකිය යුතු වෙනස්වීම් සිදු වී නොමැත. මීට දශක තුනකට පමණ පෙර පැවති අපනයන ව්‍යුහය මය තවමත් දක්නට ඇත්තේ
- දිගු කාලීන ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට අත්‍යවශ්‍ය ශ්‍රම හමුදාවේ නිපුණතා සංවර්ධනය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නො වී ඇත.
- පසුගිය දස වසරක පමණ කාලය තුළ ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් දේශීය වෘද්ධි ක්‍රියාවලියකට අනුගතව සිටීම නිසා 1977න් පසුව හඳුන්වා දෙනු ලැබූ නිර්බාධ වෙළෙඳ ප්‍රතිපත්ති පදනම් කර ගත් බාහිරාභිමුඛ සංවර්ධන ක්‍රියාවලිය දැඩි පසුබෑමක් හටගෙන ඇත. ආර්ථිකය වඩ වඩාත් ආරක්ෂණවාදයට යොමු වූයේ ය. එම ප්‍රතිපත්ති අපනයන සංවර්ධනයට සහ විවිධාංගීකරණයට අහිතකර ලෙස බලපා ඇත.


**(ඕනෑම කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 05යි)**

**09 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




09 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 25%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 71%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 4%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් iv ක් ඇති අතර ii හා iii කොටස් සාපේක්ෂව පහසු ප්‍රශ්න වී ඇත. එහෙත් ඒවායේ පහසුතාව ද 34% හා 20% කි. පහසුතාව අඩු ම කොටස iv කොටස වී ඇති අතර, එහි පහසුතාව 11%ක් පමණි. සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රශ්නය අයදුම්කරුවන් අඩු සාධන මට්ටමක් පෙන් වූ ප්‍රශ්නයකි.

- ★ I කොටසේ පහසුතාව 20% කි. සංසන්දනාත්මක පිළිතුරක් අපේක්‍ෂා කරන මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී බොහෝ අපේක්ෂකයින් මානව සංවර්ධන දර්ශකයේ සංරචක නම් කර තිබූ නමුත් එය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායමට වඩා හොඳ දර්ශකයක් වන්නේ කෙසේ දැයි දක්වා නො තිබුණි. සංවර්ධනය මැනීම සඳහා උපයෝගී කර ගත හැකි විවිධ දර්ශක/ මිනුම් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්ෂකයින් පුහුණු කළ යුතුය.

- ★ II කොටස මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩි ම කොටසයි. එය 34% කි. දිගු කාලීන ආර්ථික වෘද්ධි ක්‍රියා මාර්ග හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ දැනුම සිසුන් තුළ වර්ධනය කිරීමෙන් මෙවැනි ගැටලුවල දුෂ්කරතා අවම කරගත හැකිය. මෙහි පිළිතුර කාලීන තොරතුරු නො ව න්‍යායාත්මක පිළිතුරක් විය යුතුය.

- ★ III කොටස මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු කොටසකි. පහසුතාව 20% ක් පමණි. කාලීන දැනුම යාවත්කාලීන නො වීම ප්‍රධාන දුර්වලතාව බව පෙනී යයි.

- ★ IV කොටස මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම කොටසයි. විශ්ලේෂණාත්මක පිළිතුරක් අපේක්‍ෂා කරන මෙහි පහසුතාව 11% කි. 'වෙළෙඳ නො වන අංශ පදනම් කරගෙන ආර්ථික වෘද්ධිය' යන්නෙහි වෙළෙඳ නො වන ආර්ථික ක්‍රියා යනු මොනවාදැයි නිවැරදිව හඳුනාගෙන නො තිබීම පහසුතාව අඩු වීමට ප්‍රබල ලෙස බලපා ඇති බව පෙනේ. සංවර්ධන ප්‍රතිපත්තීන්හි කාලීනව සිදුවන වෙනස්කම් සංසන්දනාත්මකව අධ්‍යයනයට යොමු කරවිය යුතුය.

## 10 ප්‍රශ්නය

**10.** (i) "නානාවිධ රාජ්‍ය මූල්‍ය සානුබල තිබියදීත් මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජනයේ හැසිරීම, බලාපොරොත්තු කඩකරන්නක් වී තිබේ." සෘජු විදේශ ආයෝජන සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධාන බාධක කවරේ ද? (ලකුණු 05 යි)

(ii) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය මූල්‍ය තත්ත්වයෙහි දක්නට ඇති ප්‍රධාන ව්‍යුහාත්මක දුර්වලතා සඳහන් කරන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකාවේ මෑත වර්ෂවල වෙළෙඳ ශේෂයේ හිඟය පුළුල් වෙමින් පැවතීමට බලපාන හේතු දක්වන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ දිගු කාලීන ආර්ථික වෘද්ධිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි, ගෝලීය ආර්ථිකයේ වර්තමානයේ සිදු වන වෙනස්කම් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

10. (i)
- යුද ගැටුම් සහ සිවිල් අරගල නිසා හටගන්නා අවිනිශ්චිත පරිසරය
- අනම්‍යශීලී ශ්‍රම වෙළෙඳපොළ
- දේශීය වෙළෙඳපොළ සීමා සහිත වීම
- ප්‍රතිපත්ති සහ නියාමනයන්හි අවිනිශ්චිතතා
- නිෂ්පාදන පිරිවැය ඉහළ යාම: උදාහරණ වශයෙන් ඉහළ විදුලි පිරිවැය දැක්විය හැකි ය. (විදුලි පිරිවැය: කි. වො. පැයක්, ශ්‍රී ලංකාවේ $ 0.18 ක් වන අතර සිංගප්පූරුවේ $ 0.09 කි; තායිලන්තයේ $ 0.05 කි. ඉන්දුනීසියාවේ $ 0.06 කි.)
- විශේෂයෙන් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ දී විශාල වශයෙන් දූෂණ සිදු වීම.
- අතිශය සංකීර්ණ හා වෙහෙසකර පරිපාලන ක්‍රියාවලියක් (red tape): ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ගතවන කාලය, ණයක් ලබා ගැනීමට ගත වන කාලය, ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය ශ්‍රී ලංකාවේ සාපේක්ෂ වශයෙන් ඉතා දීර්ඝය.
- ආර්ථික ප්‍රතිපත්තිවල ගැටෙන සුළු ස්වභාවය සහ අනාගතය දිශානති පුරෝකථනය කළ නො හැකි වීම.
- පවරා ගැනීමේ නීති

**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)**

(ii)
- රාජ්‍ය අයභාරය ඉතා අඩු අගයක් ගැනීම සහ පහළ වැටෙමින් තිබීම:
  ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ඉතා අඩු රාජ්‍ය අයභාරයක් සහිත රටවල් අතර ශ්‍රී ලංකාව කැපී පෙනේ. 1978 දී මේ අනුපාතය 24.2% ක් වූ අතර 2014 දී එය 11.4% දක්වා අඩු විය.
- රාජ්‍ය වියදම්වල දක්නට ලැබෙන අනම්‍යශීලීභාවය:
  රාජ්‍ය වියදමෙන් 60% ක් පමණ ප්‍රමාණයක්, කිසිසේත් අඩු කළ නො හැකි වියදම් වන පොලී ගෙවීම්, වැටුප් ගෙවීම් සහ සංක්‍රාම ගෙවීම් වලින් සමන්විත වේ.
- මානව සංවර්ධන ක්ෂේත්‍රය තුළ රජයේ වියදම් ප්‍රමාණවත් නො වීම:
  අය වැය හිඟය පාලනය කිරීමට උත්සාහ කිරීමත්, රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ඉහළ ප්‍රමුඛතාවක් ලබා දීමත් නිසා අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ සමාජ ආරක්ෂණය වැනි ක්ෂේත්‍රයන්ට කරනු ලබන වියදම් සීමා කොට තිබේ.
- රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතා:
  ප්‍රධාන ගණයේ රාජ්‍ය ව්‍යවසායන් විශාල වශයෙන් අලාභ ලබමින් සිටී. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලන්කන් ගුවන් සේවාව, ලංකා ඛණිජ තෙල් සංස්ථාව ඒ අතර කැපී පෙනේ.

**(ඕනෑම කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 05යි)**

(iii) - අපනයන ඉපැයුම් පහළ වැටීම:

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ තේ අපනයන මෑත කාලය තුළ 20% කින් පමණ පහළ වැටී ඇත. ගෝලීය බණිජ තෙල් මිල පහළ වැටීම නිසා රුසියාව ඉරාකය, සිරියාව වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ ගැනුම්කරුවන්ගේ ආර්ථික බිඳ වැටීමකට ලක්ව ඇත.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල පවත්නා ආර්ථික පසුබෑසීම: යුරෝපා සංගමය සහ ජපානයේ සාර්ව ආර්ථික අස්ථායිතාව.
- මැද පෙරදිග රටවල පවත්නා දේශපාලන අස්ථාවරත්වය.
- රුසියාවේ මුදල් ඒකකය දැඩි ක්ෂය වීමකට පත්ව තිබීම.
- යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාව වෙත ලබා දී තිබූ GSP + තීරු බදු සහනය ඉවත් කිරීම.
- තේ සහ රබර් නිෂ්පාදනවල ගෝලීය මිල පහළ වැටීම: එක් අතකින් ආර්ථික පසුබෑම් නිසා ඉල්ලුම අඩු වීම නිසා ස්වභාවික රබර් සඳහා ඉල්ලුම අඩු වීම.
- ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය විවිධාංගීකරණය නො වී තිබීම.
- දේශීය ආදායම් ප්‍රසාරණය වීම නිසා ආනයනය කරනු ලබන පරිභෝජන භාණ්ඩ සඳහා ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ යාම.
- යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය තහනම් කිරීම.


**(ඕනෑම කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 05 යි)**

(iv) - ලෝක බණිජ තෙල් මිල ප්‍රබල ලෙස පහළ වැටීම. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ඉල්ලුම්කරුවන් ලෙස ක්‍රියා කරන රුසියාව, සවුදි අරාබිය, ඉරාකය, ඉරානය වැනි බණිජ තෙල් අපනයනය කරන රටවල් ආර්ථික පසුබෑමකට ලක්ව සිටීම.

- මැදපෙරදිග රටවල පවත්නා දේශපාලන අස්ථාවරත්වය.
- යුරෝපා සංගමය තුළ සිටින බොහෝ රටවල් තවමත් ආර්ථික පසුබෑම් තත්වයට මුහුණ පා සිටීම.
- ජපාන ආර්ථිකය නිශ්චලන තත්වයක පසුවීම.
- චීන ආර්ථිකයේ මන්දගාමී වර්ධනය.
- ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යාම.
- මහා බ්‍රිතාන්‍යය, යුරෝපා සංගමයෙන් ඉවත් වීම.


**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05 යි)**

**10 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගෙන් 10%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 87%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 0%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර iv කොටස වඩාත් ම අපහසු වී ඇත. එහි පහසුතාව 3%කි. පහසුතාව වැඩි ම කොටස i වේ. එහි පහසුතාව 11%කි. ii වන සහ iii වන කොටස් ද අඩු පහසුතාවක් ගෙන ඇති අතර ඒවායේ පහසුතා 8% හා 4% බැගිනි. සමස්තයක් ලෙස ගත්විට අඩු ම පහසුතාව සහිත ප්‍රශ්නයයි.

★ i මෙම කොටසෙහි පහසුතාව 11% කි. 10 වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ සමස්ත අපේක්ෂකයන්ගෙන් 9.88% ක් පමණි. එමගින් මෙම ප්‍රශ්නය සාපේක්ෂ වශයෙන් අපේක්ෂකයන්ට පහසුතාවයෙන් අඩු ප්‍රශ්නයක් වන බව පෙනී යයි.

සෘජු විදේශ ආයෝජන පිළිබඳ අපේක්ෂකයන් තුළ පවතින දැනුම හා අවබෝධය අල්ප බව පෙනී යයි. පිළිතුරු තුළින් අපේක්ෂා කර ඇත්තේ සෘජු විදේශ ආයෝජන කෙරෙහි පවතින බාධාවන් පමණි. සෘජු පිළිතුරු අපේක්ෂා කළ ද පිළිතුරු සංවිධානය කර ගැනීමට අපේක්ෂකයින් අසමත් වී ඇත. විදේශ ආයෝජන පිළිබඳව ඉගැන්වීමේ දී එහි වැදගත්කම මෙන්ම ඒ කෙරෙහි කාලීනව පවතින බාධාවන් ද අවබෝධ කර දිය යුතුය.


★ ii මෙම කොටසෙහි පහසුතාව 8% කි. රාජ්‍ය මූල්‍ය තත්වය යන්නෙන් රාජ්‍ය අයභාරය සහ රාජ්‍ය වියදම මෙන් ම රාජ්‍ය වියදම් ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක දුර්වලතාව ද අවධාරණය වේ. ඉගැන්වීම් ක්‍රියාවලියේදී රාජ්‍ය අයභාරය, රාජ්‍ය වියදම, රාජ්‍ය අය වැය වැනි සෑම අංශයක ම ව්‍යුහාත්මක දුර්වලතා අවධාරණය වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

★ iii මෙම කොටසෙහි පහසුතාව 4% කි. ප්‍රශ්නය තෝරා ගෙන ඇති සීමිත අපේක්ෂකයන්ට ද පහසුතාව ඉතා අඩු වී ඇත. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ ප්‍රමාණය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී වෙළෙඳ ශේෂයේ උපනතීන් හා ඒවායේ වෙනස්කම් ඇති වීමට හේතු පිළිබඳව මහ බැංකු වාර්තා ඇසුරින් අවශ්‍ය කරන තොරතුරු අපේක්ෂකයින් විසින් දැනුවත් විය යුතුය.

★ iv මෙම කොටසේ පහසුතාව 3% කි. සමස්ත ප්‍රශ්න පත්‍රයේ ම අඩු ම පහසුතාවක් දක්වා ඇති කොටසයි. ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතාවයන් ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය පිළිබඳව අපේක්ෂකයින් තුළ පවත්නා විවෘත දැනුම පරීක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකයේ වෙනස්කම් පිළිබඳව මෙන් ම ඒවා ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව ද අපේක්ෂකයින් තුළ පවතින අවබෝධය පුළුල් කළ යුතුය.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ඇගයීම් වාර්තාව සැකසීමේදී භාවිත කරන ලද තොරතුරු සංවිධානය කිරීමෙන්, II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි තෝරාගැනීමේ ප්‍රතිශත හා පහසුතාව දැක්වෙන පහත සඳහන් ප්‍රස්තාරය සහ වගුව ගොඩනැගිය හැකිය.




| ප්‍රශ්න අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තෝරා ගැනීමේ ප්‍රතිශතය | 97 | 98 | 61 | 36 | 28 | 58 | 89 | 36 | 26 | 10 |
| පහසුතාව % | 55 | 67 | 58 | 53 | 42 | 42 | 54 | 27 | 22 | 6 |

ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න “අ”කොටසට ද අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න “ආ” කොටසට ද අයත් ය. අපේක්ෂකයන් විසින් “අ” කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද “ආ” කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු විය.

“අ” කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරාගැනීමට ලක්ව ඇත්තේ අංක 2 සහ 1 ප්‍රශ්න වන අතර “ආ” කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරා ගැනීමට ලක්ව ඇත්තේ අංක 7 සහ 6 ප්‍රශ්න වේ. ඒවා තෝරාගනු ලැබීමේ ප්‍රතිශත පිළිවෙළින් 98%, 97%, 89% සහ 58% වේ. ඊළඟට වැඩි ම තෝරාගනු ලැබීමට පත්ව ඇත්තේ 3 වන ප්‍රශ්නය යි. විකල්ප ප්‍රශ්න හයක් අතුරෙන් වැඩි ම තෝරාගනු ලැබීමට ලක්ව ඇති එම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගෙන් අඩකට වැඩි (61%) සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත. විෂය නිර්දේශයෙහි, මෙම ප්‍රශ්නවලට පාදක වූ තේමා සහ විෂය කරුණු, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයට ලක් වූ හා සිසුන් අතර වඩාත් ජනප්‍රිය වූ ඒවා ය. එබැවින් එම ප්‍රශ්නවල පහසුතා සාපේක්ෂ වශයෙන් ඉහළ අගය ගත යුතුය. ප්‍රශ්න තෝරා ගනු ලැබීමේ ප්‍රතිශතවල අවරෝහණ පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 2, 1, 7, 6 සහ 3 වේ. එහෙත් පහසුතාවල එම පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් 2, 3, 1, 7 සහ 4 වේ. අංක 2, 1 සහ 7 ප්‍රශ්න වැඩියෙන් තෝරා ගනු ලැබ ඇති නමුදු, ඒවාට සපයන ලද පිළිතුරු එතරම් සතුටුදායක නො වන බවත් වැඩියෙන් ලකුණු උපයා ගැනීමට සමත් වී නොමැති බවත් මෙම තොරතුරුවලින් ගම්‍ය වේ. එබැවින් සිසුන්ගේ වැඩි අවධානයට ලක්වන මෙවැනි ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුනට මග පෙන්වීම වඩාත් සාර්ථක ප්‍රතිඵල ලැබීමට මහෝපකාරී වේ.

වැඩි ම තෝරාගැනීම ඇති අංක 2 ප්‍රශ්නයෙහි වුව ද පහසුතාව 67%කට සීමා වී තිබීම ද ආර්ථික විද්‍යාව විෂයයෙහි ප්‍රගතිය අපේක්ෂා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. ස්ව අභිප්‍රේරණයෙන් යුතුව ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නෙකුට, සාමාන්‍ය වශයෙන් ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් වැඩි ප්‍රතිශතයක් උපයා ගැනීමට හැකිවන ආකාරයට තම පිළිතුර නිවැරදි විෂය කරුණු ඇසුරෙන් සංවිධානය කර නිශ්චිතව ඉදිරිපත් කිරීමට ද මග පෙන්වනු ලැබිය යුතුය.

අඩුවෙන් ම තෝරා ගනු ලැබ ඇත්තේ අංක 10 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද 6%ක අවම අගයකට සීමා වී ඇත. ඊට පාදක වී ඇති විෂය කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැති බව පෙනේ. 13 වන ශ්‍රේණියේ අවසාන වාරයේ දී සිසුන්ගේ පැමිණීම දුර්වල වීම වැනි හේතු මෙම තත්ත්වයකට හේතු වී ඇත.

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සැලකූ විට පහසුතම ප්‍රශ්නයේ පහසුතාව වුවද 67%කට සීමාවීමත් අංක 2 හැර අනෙක් ප්‍රශ්න නවයෙහිම පහසුතාව 60%ට වඩා අඩුවීමත් මෙම විෂයය හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. එමෙන් ම II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව ද 51.10%කට සීමා වී ඇත. මෙම තොරතුරු ඇසුරෙන් අවධාරණය කෙරෙන්නේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය අනාවරණ පරීක්ෂණ කෙරෙහි යොමුවීමේත් ඉලක්ක ගත ප්‍රතිකාරක වැඩ සටහන් නොපමාව ක්‍රියාත්මක කරනු ලැබීමේත් වැදගත් අවශ්‍යතාවයි.

# III {ාටස

## 3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

## 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස්**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. එකම ප්‍රශ්නය කොටස් දෙකක් ලෙස එකට ලියැවී ඇති විට, කොටස් දෙකට ම පිළිතුරු සැපයීම කෙරේ අවධානය යොමු විය යුතුය.
- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතුය. තව ද පැහැදිලිව එම වරණයේ අංකය පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.
- ★ II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ★ ප්‍රශ්න අංක හා කොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.
- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නො කිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නො කළ යුතුය.
- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- ★ පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.
- ★ ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාලය කළමනාකරණය කරගත යුතුය.
- ★ ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදි ව දැක්විය යුතු අතර, අක්ෂ හා ප්‍රස්තාර රේඛා නම් කිරීම ද ඉතා වැදගත් ය.
- ★ සමීකරණ විසඳීමේ දී පිළිගත් ගණිත මූලධර්ම මත පියවරින් පියවර දැක්වීම වැදගත් ය.
- ★ ඊතල හා වෙනත් සංකේත මගින් අර්ථ නිරූපණය කිරීමේ දී ඒවා අර්ථ කථනය කිරීම ද වැදගත් ය.

**විශේෂ උපදෙස් :**

* ආර්ථික විද්‍යා විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය.
  උදා : ස්වායත්ත පරිභෝජනය

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සූත්‍ර හා සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් සැලකිලිමත් විය යුතුය.

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාළ අවස්ථාවලදී නිවැරදි ව ඒකක සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.

* අදාළ රූප සටහන් අඳින විට රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහවල දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

* ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අදාළ ඉතා වැදගත් සංඛ්‍යා, මෑත කාලීන (පසුගිය වසර 2 ක) දත්ත මතක තබා ගැනීමෙන් පිළිතුරු සැපයීම පහසු කරවයි. ඒ සඳහා පහත දැක්වෙන ක්ෂේත්‍ර වෙත අවධානය යොමු කරන්න.

  - ආර්ථික වෘද්ධි අනුපාතය
  - ප්‍රතිශීර්ෂ ආදායම
  - උද්ධමන අනුපාතය
  - විරැකියා අනුපාතය
  - දරිද්‍රතා දර්ශකය
  - අයවැය හිඟය
  - ගෙවුම් ශේෂ හිඟය
  - රාජ්‍ය ණය අනුපාතය
  - රාජ්‍ය ආයෝජන අනුපාතය

* ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී තාර්කිකව පිළිතුරු සංවිධානය කරගෙන, අසා ඇති ප්‍රශ්නයට ගැලපෙන සේ පිළිතුරු පෙළ ගැස්වීමේ පරිචය ශිෂ්‍යයාට ලබා දීමට පන්ති කාමර ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

* ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවන්හි විශේෂ සටහන්, (උදා : කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණ වාර්තා, ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තා, දරිද්‍රතා තොරතුරු) ආදිය පරිශීලනයට ශිෂ්‍යයා යොමු කරවන්න.

**ප්‍රස්තාර සඳහා පොදු උපදෙස් :**


* දත්තවලට අනුව ප්‍රස්තාර ඇඳීමේදී ප්‍රස්තාර කඩදාසි යොදා ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රස්තාර කඩදාසි භාවිත නො කිරීම නිසා නිවැරදි ව ගණනය කිරීම් කළ නො හැකි වීමෙන් අයදුම්කරුවන්ට ලකුණු අහිමි වන බව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

* අක්ෂ නිවැරදිව නම් නො කිරීම හා ප්‍රස්තාර නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි. උදා-: නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ අක්ෂ නම් කරන විට X හා Y ලෙස පමණක් නම් කර ඇත්නම් ලකුණු දිය නො හැක. එය X භාණ්ඩය හා Y භාණ්ඩය ලෙස සටහන් කළ යුතුය.

* නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර අඳිනු ලබන විට අක්ෂ දෙක ස්පර්ශ වන පරිදි ඇඳීම ඉතාමත් ම වැදගත් වේ. එසේ නොමැති විට එය නිෂ්පාදන හැකියා මායිමක් නො වේ.


* ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදිව නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි. උදා-: සැපයුම් වක්‍ර ඇඳීමේ දී එය ඍණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය ඒ පරිදි ප්‍රස්තාරයේ දැක්විය යුතුය.

  උදා-:





  සමාහාර වියදම් රේඛාවේ ද, ස්වාධීන වියදම් ප්‍රමාණය ප්‍රස්තාර සටහනේ නිවැරදිව දැක්විය යුතුය.

  උදා-:





* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ආදායම් හා සමාහාර වියදම් ලකුණු කරන විට අක්ෂ දෙකෙහිදීම දත්ත (ඉලක්කම්) යොදන පරිමාණය සමාන වන පරිදි ලකුණු කර, සම ආදායම් වියදම් රේඛාව ඇඳිය යුතුය. එසේම ස්වායත්ත විචල්‍යය වන ආදායම අනිවාර්යයෙන් ම තිරස් අක්ෂයේ සටහන් කළ යුතුය.

  උදා-:



* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ගිලිහීම් දැක්වෙන වක්‍රය ඍණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය නිවැරදිව දැක්විය යුතුය.

උදා-:




3.2. **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :**

* සංකල්ප පිළිබඳ ව නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිත ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුණුවල කාලීනව හටගන්නා වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ ව සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුය.

* මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත් කෙරෙන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුය. එමඟින් තම දැනුම යාවත්කාලීන කර ගත යුතුය.